# 2022 ඔක්තොබර් මස 06 වන දින පෙරවරු 9.30 ට
# මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
# මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දු නිරෝෂන මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |

42. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
43. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2022.10.06 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.

2022.09.01 දින පැවති මහා සභා වාර්තාව.

**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2022.09.01 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව පිලිගතයුතු යැයි යෝජනා කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී ජී. සුරංග එන්. අපොන්සු මහතා විසින් ස්ථිර කරන ලදී.

2022.09.01 දින මහ සභා රැස්විම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02 ගරු නගරාධිපතිතුමාගේ නිවේදන

**ගරුනගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

02(01) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මැතිතුමා හදිසි අවශ්‍යතාවයක් නිසා අද දින සභාවට ඒමට නොහැකි බව දන්වා ඒවා තිබෙනවා.

02(02) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මන්ත්‍රිතුමා අද දිනයේ සහභාගිවිමට නොහැකි බව දන්වා තියෙනවා.

02(03) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මන්ත්‍රිතුමා තම බිරිදගේ මව වියෝවිම නිසා අද දිනයේ සහභාගිවිමට නොහැකි බව දන්වා තියෙනවා.

02(04) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සභා රැස්විම විඩියෝ දර්ශණ මගින්,පටිගත කිරිම් මගින් සජිවිව ලබා දිම සම්පුර්ණයෙන්ම නතර කිරිම කරන්න.

02(05) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2022.10.07 දින එකාබද්ධ කාරක සභා රැස්විම පෙ.ව 10.30ට පැවැත්වෙන බව දන්වා සිටිනවා

## 03 සභාව අමතා එවන ලද ආයචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබිම.

### 03(1) මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි,විල්ලෝරාවත්ත මෙන්ඩිස් පාරේ පිහිටා තිබු අපේ ළමා උද්‍යානය පිහිටි ඉඩම එය කිසියම් කටයුත්තක් සදහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පවරා දිම කර තිබෙනවා.ඒ කටයුත්ත පිළිබදව අපට ගැටලුවක් නැහැ.අපි විශ්වාස කරනවා එය හොඳ ව්‍යාපෘතියක් ආරම්භ කරන්නේ වඩු කාර්මිකයන් වෙනුවෙන් සහනදායි කුලි පදනම මත ඒ උපකරණ ලබා ගැනිමේ ව්‍යාපෘතිය ඒක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා සිද්ධ වෙන බවට තමයි අපිට තොරතුරු තියෙන්නේ.මා උස්සාහ කරන්නේ මතු කරන්න ඒහි පැවති ළමා උද්‍යානය.ඒ උද්‍යානය අපි විශ්වාස කරනවා ඒ ස්ථානයට අත්‍යාවශ්‍ය එකක්.

ඒනිසා ඉතාම ඉක්මණින් එම ළමා උදයානය නැවත ඒ ප්‍රදේශයෙ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරලා ඒ කටයුත්ත ඉක්මණින් අවසන් කරන්න කියන ඉල්ලිම කරනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රදේශයේ අවුරුදු 20ක් සම්පූර්ණ වෙච්ච නාගරික මන්ත්‍රිවරයා විදියටත් මහ නගර සභාවටම බලපාන අවුරදු 16ක් නගරාධිපතිවරයා විදියටත් ඒ කටයුත්ත පිළිබඳව ලොකු අවබෝධයක් මට තියෙනවා.ඒ අදාල වෙන්නාවූ උපකරණත් සියල්ල සවිකිරිමට අවශ්‍ය කරන කටයුතු උපකරණ ගෙනල්ලත් ඉවරයි. ඒකේ පොඩි ප්‍රමාදයක් සිදුවුනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සිදු කරන ව්‍යාපෘතියේ පඩි පෙල සම්බන්ධව තිබුණු ප්‍රශ්ණයක් නිසා ඒකත් දැන් නිමා කරලා ඉවරයි.හෙට අනිද්දා වෙන කොට ඒය සම්පූර්ණයෙන්ම යථාවත් කරනවා.මොකද එක මම හිතනවා එක්තරා කාලේකදි ජනතා විමුක්ති පෙරමුණ විසින් ඒ ස්ථානයේ සෙල්ලම් බඩු සවිකරා.ඊට පස්සේ ඒකට සිදුවුන දේ පිළිබඳව කථාකරන්න යන්නේ නැහැ.හැබැයි ඊට පෙර යම් යම් පාලකයෝ ඇවිල්ලා ගෙවල් ගානේ යනකොට ගෙවල් ගිනි තියලා ඉඩම් බේර ගත්තේ සමන්ලාල්ලා. ඒනිසා ඒක මොන විදියකින් වත් එතන ඒ සිද්ධවෙන දේට හානියක් වෙන්න දෙන්නේ නැහැ.ඒ දේ අනිවාර්යෙන් සිද්ධවෙනවා.

03(2) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඒ විල්ලෝරවත්ත ළමා උද්‍යානය සකස් කිරිම පිළිබඳව සතුටු වෙනවා.ඒ වගේම ගරු නගරාධිපතිතුමනි මොරටුව නගර මාධ්‍යයේ මේ රථ ගාල හදලා තියෙනවා. ඒකේදි මම එදා ඉඳලාම ඉල්ලිමක් කරා ඒම ස්ථානයේ ළමා උද්‍යානයක් ඉදිකරලා දෙන්න කියලා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනි,සවිකරලා තියෙන්නේ.

03(3) **<u>මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මොරටුව මහ නගර සභාව මගින් අපේ රවිනාත් ගුණසේකර මහතා ඉන්න කාලේත් අපි දන්නවා මමත් ඒ කාලේ ඉන්න කොට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය පුණුරුත්ථාපනය කරලා එම ව්‍යාපෘතියේ අපි ලංකාවේම පලවෙනි ස්ථානය ගත්තා. අපේ ගාවින් මන්ත්‍රිතුමත් හිටියා. නමුත් අද වෙනකොට මොරටුවේ පාසල් වල පවා දරුවන් විශේෂයෙන්ම දැරියන් මත්ද්‍රව්‍ය වලට නොයෙකුත් දෙවල්වලට ඇබ්බැහි වෙලා. අපිට පුවත්පත් මගින් දැනගන්න ලැබෙනවා.ඒ වගේ ජන මාධ්‍යවල බොහොම සේ කථාබහට ලක්වෙන දෙයක් ඒක විශේෂයෙන්ම පහුගිය දිනෙක සිංගර් ආයතනය මෙතන කැඩුවා.කඩලා ඉවර වෙලා නගරාධිපතිතුමනි සොරුන් හෝ කවුරුන් හෝ ආවේ අපේ ඉස්සෙල්ලා කථාකරපු වීරපුරන් අප්පු චතුරස්‍රය උඩට. මම ඉතාම ඕනැකමින් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් අපේ මුරකාරයෙක් කවුරුවත් රෑට නැහැ. හැකියාවක් තිබෙනම් ගරු නගරාධිපත්තුමනි එතන මම හිතන්නේ ඉතාම සුදුසුයි ඒකේ වැටක් සවිකරන්න. හැකිනම් එහා පැත්තේ පාර අයිනට නැත්නම් දැන් නොබෝ දිනකින් විවෘත කරන්න ඉන්නවා. රාත්‍රි 11 ට 12ට එනකොට එතන තනිකරම කුඩු කාරයන්ගේ තොතැන්නක් නැත්නම් සල්ලාලයන්ගේ තොතැන්නක් ඒවගේම දවල්ට පාඩම් කරන ළමයි එන්නේ නැහැ. පාඩම් කරන ළමයින්ටත් ප්‍රශ්ණයක් වෙලා තියෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි ඉතා ඕනැකමින් ඉල්ලා සිටිනවා හේතුව තමයි අපි එතනට වැටක් ගහලා මුරකාරයෙක් දාන්න ඕන නැහැ මුරකාරයෙක් දැම්මානම් දැන් මුරකාරයෙක්වත් නැහැ ඒ මුරකුටියත් මම හිතන්නේ රෑට නොයෙකුත් දෙවල්වලට පාවිච්චි වෙනවා. විශේෂයෙන් බංකු දාලා තියෙන නිසා මහා විශාල ප්‍රශ්නයක් තියෙනවා. දරුවන් ගැන හිතලා මම ඉස්සෙල්ලා කිව්වේ ඉස්කෝලවලත් ඊයේ පත්තර වලත් තියෙනවා නොයෙකුත් සල්ලාලයින් කරපු කථා. විශේෂයෙන්ම ප්‍රධාන විදුහල්වල දරුවොත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච කාරණා අපිට අහන්න ලැබුණා. විශේෂයෙන් අපි 2002 වර්ෂයේ 2003 වර්ෂයේදි ලංකාවෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවුවන් පුණුරුත්ථාපනය කිරිම වෙනුවෙන් ලංකාවෙන්ම තේරිච්ච මහ නගරසභාව වශයෙන් අපි එයට උරදුන්නා. මොරටුවේ තියෙන කුඩු මොරටුවේ පොලිසි 5ක් තියෙනවා. ඇත්තටම වැඩක් වෙලා නැහැ කුඩු ගන්න අය මොරටුවේ ඉතාම සිඝ්‍ර වශයෙන් මත්ද්‍රව්‍ය ලෝලින් වැඩිවෙලා තියෙනවා. සිගරට්වලට,අරක්කු පාසල් දරුවන් පවා බිලිවෙලා තියෙනවා. ඒනිසා විශේෂයෙන්ම අපේ ස්ථානයක් වෙන වීරපුරන්අප්පු චතුරස්‍රය වට කරලා එතන ගේට්ටුවක් දාන්න කියලා ඉතා ඕනැකමින් ඉල්ලා සිටිනවා.

**03(4) මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ සභාව මොරටුවේ පැවතිච්ච රේස් බයි බදු නිදහස් කරලා ඒ රේස් බයි නතර කිරිම සඳහා ගත්ත උත්සාහය, සංවාදය දැන් වසර කිහිපයක් තිස්සේ රේස් බයි පවතිනවා. බද්ද නැතිවෙලා. ඒනිසා කරුණාකරලා ඔබ පෙත්සම් පැමිණිලි අයිතම වලට ක්ෂණික උත්තරත් දෙන ඒකේ දැන් මේ සභාවට කියන්න තවදුරටත් මේ රේස් බයි බදුවලින් තොරව පවත්වගෙන යන්න දෙනවාද එහෙම නැත්නම් කවද්ද මේවා වහන්නේ ඒ වැහිමට අදාල කටයුතු තියෙනවානම් දැන් මේ සභාවට කියන්න එහෙම නැත්නම් ඒ වෙනුවෙන් මොකක්ද කරන්නේ නැවත බද්ද අය කරන්න ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියලා කියන්න. මොකද අප විශාල චෝදනාවකට මුහුණ දෙනවා පුංචි කඩවලින් බදු අයකරනවා රේස් බයි බදුවලින් තොරව කරගෙන යන්න දෙනවා. අපේ අරමුණ මොකක් වුනත් ක්‍රියාත්මක වෙන්නේ ඒ අරමුණ නෙමෙයි. ඒනිසා මිනිස්සුන්ට ඒවා වැඩක් නැහැ. අරමුණ සත්භාවයක් සහිත අරමුණක් වෙන්න පුලුවන්. අපි කවුරුත් එකග වුනේ ඒකට. නමුත් අද අපි ඉතා අපහසුතාවයට පත්වෙලා තියෙනවා ඒනිසා ඔබෙන් උත්තරයක් බලාපොරෝත්තුවෙනවා.

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමනි,මම උත්තර දෙන්න බැදිලා නැහැ.

**03(5) මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි,පහුගිය සභා රැස්විමේදි මම ඉල්ලිමක් කරා සහ මම දිගින් දිගටම මේ පිළිබඳව ප්‍රශ්න කරනවා කියලා කිව්වා, ලක්ෂපතිය අර්නස්ට් පෙදෙස පාර පටන් ගැන්මේ පර්චස් 3.11 ක ඉඩමක් සම්බන්ධව මේ සභාවේ ලොකු ආන්දෝලනයකට ලක්වුනා. කතිකාවකට ලක්වුනා. චෝදනාවකට ලක්වුනා. අපහස වලට ලක්වුනා. වෛරය තත්වයට පත්වුනා. ඒ ඉඩම සම්බන්ධයෙන් මේ ඉඩම අපිට දැනගන්නට ඕනේ නිශ්චිත තත්වය මොකක්ද කියලා. මම මේ ඉඩම සම්බන්ධව ප්‍රශ්න 14ක් මේ නගර සභාවෙන් තොරතුරු දැනගැනිමේ පනත යටතේ ඉල්ලුවා. මේ වෙනකම් නගර සභාවට කියා ගන්න බැහැ මේක නගර සභාවේද කියලා. ඉඩම මම ඇහුවේ නගරසභාවේ ඉඩමක්ද කියලා. මාසයක් යනකම් කියන්න බැහැ. හැබැයි මේ නගර සභාවේ මන්ත්‍රිවරු චෝදනා කරනවා මේ ඉඩම නගර සභාවේ ඉඩමක් කෙනෙක් ඔප්පුවක් හදලා විකුණලා තියෙනවා. ප්‍රකාශණ ඔප්පුවක් එතකොට මන්ත්‍රිවරයාට කොන්ද තියෙනවාද නගර සභාවට කොන්ද තියෙනවාද නගර සභාවේ දැනුවත් භාවයක් තියෙන්න එපැයි මේ නගර සභාවේ පර්චස් 3.11 ඉඩම මොකක්ද මම ප්‍රශ්න 14ක් ඇහුවා. මාසයක් යනවා උත්තර දිගන්න බැරිව ගියා. ප්‍රශ්නෙට උත්තර දිගන්න බැහැ. මේ ඉඩම නගර සභාවෙනම් අපි කියන්නේ පවරගන්න වරදක් කරලා තියෙනවානම් වරදකාරයාට දඩුවම් දෙන්න. මේක වෙන්නේ නැහැ. මේක දිගින් දිගටම සභාවේ ප්‍රශ්නකරනවා මේ ඉඩම චෝදනා එල්ලවුනු ඉඩමක් වගකිමෙන් කිව්ව ඉඩමක්. ඉතින් මේ චෝදනාව එල්ල කරලා මන්ත්‍රිවරයෙක් කියනවා මේක නගර සභාවේ ඉඩමක් කියලා. නගර සභාව අපිට විසඳුමක් දෙන්නේ නැහැ. එහෙනම් කාවද මෙතනදි අමාරුවේ වැටිලා තියෙන්නේ. නොදැනුවත්ව කිව්වාද දැනුවත්ව කිව්වාද ක්‍රෝධයෙන් කිව්වාද වෛරයෙන් කිවුවාද හැබැයි මේ ඔක්කොම කියලා නගර සභාව සතු වෙන්න එපැයි. එහෙම දෙයක් නැහැ. මෙතන මම කරුණාකරලා ප්‍රශ්න 14ක් අහලා තියෙනවා. එකට කල් අරගෙන තියෙනවා. සති දෙකකට වඩා තව දවස් 21ක් ඒ 21 ගෙවෙනවා ලබන සුමානේට. කාරුණිකව ඉල්ලිමක් කරනවා නගරසභාව බැදිලා ඉන්නවා නගර සභාවේ ඉඩමක් නම් ඒ තොරතුරු ලබා දෙන්න ඒක ලබා දෙන්න කියන ඒ ඉල්ලිම කරනවා.

තොරතුරු දැනගැනිමේ පනත යටතේ අපි විසින් විපක්ෂයක් විසින් ඉල්ලන තොරතුරු තමුන්නාන්සේලා ලබා දෙද්දි මන්දගාමි ස්වරූපයක් නගර සභාව කටයුතු කරනවා. අපි ඒක නිසා ඉල්ලිමක් කරනවා තොරතුරු දැනගැනිමේ නිලධාරිතුමාට ඉල්ලිමක් කරනවා මේ තොරතුරු ලබා දෙන්න. නිත්‍යානුකූල ක්‍රමවේදය තුල අපි ඉල්ලන්නේ අවිදිමත් ක්‍රමවේදයට අපි ඉල්ලන්නේ නැහැ. හැබැයි දෙන කාලසිමාවක් තියෙනවා. කාලසිමාවට යටත්ව මේ තොරතුරු ලබාදෙන්න මම හිතන්නේ අපේ මන්ත්‍රිවරයෙක් ඉල්ලුවා. මේ නගර සභාවට කාලයක් තිස්සේ සේවකයෝ අනියම් පදනමේ සේවකයො බඳවා ගැනිමේදි කොච්චරක් බඳවා ගත්තාද ඒ බඳවා ගත්ත අය කොයි තැනද සේවය කරන්නේ ඒ අයගේ නාම ලේඛනය ඉල්ලුවා මේ නගර සභාවට දෙන්න බැහැ. හැබැයි පඩි ගෙවනවා. බැදිලා නැද්ද මේ නගර සභාවේ සේවකයෝ ගැන තොරතුරු දෙන්න බැදිලා නැද්ද මේක තාම දිලා නැහැ අවුරුද්දකට වැඩියි. මේක එතකොට අපි ඉල්ලුවා උසාවියෙන් අනවසර නියෝග ලබා දුන්නා කඩා ඉවත් නොකරපු ගොඩනැගිලි මොනවාද කියලා. අපි

ඉල්ලීමක් කරා මේක හරි ලේසියි ගන්න. මේක තියෙනවා උසාවියෙන් දුන්න නියෝග මේ දන්නවා මෙතන අපේ නීති නිලධාරිවරයෙක් ඉන්නවා. සමහරක් මන්ත්‍රීවරු කෑගහනවා. මේ සභාවට එන්නේ නැහැ නීති නිලධාරි කියලා හැබැයි අපි වගකියන්න ඕන එතනට අපි නීති නිලධාරිගෙන් ප්‍රයෝජන ගන්නේ නැහැ.

**(සභාඝෝෂා)**

මම ඉල්ලීම කරන්නේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ මේ තොරතුරු ලබා දෙන්න ප්‍රමාද වෙන්නේ ඇයි. මේ නීති නිලධාරියෙක් ඉන්නවා. නීති නිලධාරි දැනගෙන ඉන්න ඕනේ මේ නගර සභාව තුල උසාවියෙන් දුන්න නියෝග සම්බන්ධව. මේ නීති නිලධාරි දැනගෙන ඉන්න ඕනේ එයාගෙන් ගන්න මේ තොරතුරු එයාට දෙන්න පුලුවන්කම තියෙනවා. හැබැයි අපි ඉල්ලපු ප්‍රශ්ණයට එවලා තියෙනවා. නම් තුනයි එවලා තියෙන්නේ. නම් තුනක් එවලා තියෙනවා. මේ නම් තුන කඩා ඉවත්කරගන්න උසාවියෙන් නියෝග දුන්නා කියලා මම කියනවා නගරාධිපතිතුමනි මම එකක් පෙන්නන්නම් මොරටුව ප්‍රධාන පාරේ ස්වර්ණමහල් බිල්ඩින් එකට මෙහා පැත්තේ බිල්ඩින් එක පාරේ ගහලා තියෙන්නේ එකට උසාවි නියෝගයක් දුන්නා මම දැනුවත්ව ඒ නියෝගයට මොකද වුනේ ඒ බිල්ඩින් එක තියෙන්නේ පාරේ. එතනින් කිදාහක් යන්නේ අමාරුවෙන්ද?මේකට ගත්ත පියවර මොකක්ද කුඩා මිනිස්සුන්ගේ දෙවල්වලට පොඩි පොඩි දෙවල්වලට කඩා ඉවත්කරන්න කියනවා. තමන් ගිහිල්ලා බලෙන් කඩනවා. ඇයි උසාවියෙන් දුන්න නියෝග ක්‍රියාත්මක නොකරන්නේ. එහෙනම් අපි උසාවියටත් ඉහලින්ද ඉන්නේ නැහැ. එහෙම නෙමෙයි තමුන්නාන්සේට ඒ බලය දීලා නැහැ. එක නිසා තමයි තමුන්නාන්සේ පහුගිය කාලේක සුමාන ගනන් ඇතුලට ගිහිල්ලා හිටියේ ඒනිසා නගරාධිපතිතුමනි අපි කියනවා මේ උසාවියෙන් දුන්න නියෝග හන්ගන්නේ නැතිව අපිට ලබා දෙන්න තොරතුරු දැනගැනීමේ පනත යටතේ අර කුඩා තැන් දෙක තුනක් අපිට දීලා වැඩක් නැහැ. අපිට අවශ්‍යයි මේවා. මේ කියන්නේ වාර්තාකර ගන්න වාර්තා කරගන්න කිව්වාම අපි මේ තොරතුරු දැනගැනීමේ පනතේ ඉල්ලපුවා දෙන්නේ නැත්නම් මේ කාලසීමාවත් එක්ක අපි ඉල්ලලා තියෙනවා. අපි මීට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා. ඒ අදාල තැන්වලට ගිහිල්ලා ඒනිසා අපිට අපි ඉල්ලන දේ කරුණාකරලා ලබා දෙන්න අපි ඉල්ලන්නේ නැහැ වැරදි දෙයක් දෙන්න බැරි දෙයක් ඉල්ලන්නේ නැහැ සභාවට අදාල දෙයක් අපි ඉල්ලන්නේ ඒවගේම නගරාධිපතිතුමනි ඔබතුමා ඔය පුටුවේ ඔහොම වාඩි වෙලා හිටියට මේවෙනකොට චෝදනා තුනක් උසාවියේ තියෙන පුද්ගලයෙක් මෙතන වාඩි වෙලා හිටියට තමුන්නාන්සේට යම් යම් කොන්දේසි උසාවියෙන් පනවලා ඇති. ඒ කොන්දේසි ඔතනට ගියා කියලා තමුන්නාන්සේට අමතක වෙන්න බැහැ.තමුන්නාන්සේ යම් කිසි කෙනෙක්ට තර්ජනය කරනවානම් බලපෑමක් කරනවානම් මෝසමක් දාලා එක ඉදිරිපත් කරන්න පුලුවන් උසාවියට. තමුන්නාන්සේ මෙහෙම තර්ජනය කරනවා කියලා. යම් පුද්ගලයන්ට සාක්ෂිකාරයෝ මෙතන ඇති මේ සභාවේ පැමිණිලිකාරයෝ මෙතන ඇති මේ සභාවේ තමුන්නාන්සේලාට චෝදනා කරන්න අපහාස කරන්න ඒවගේම වෙනම වෛරී විදියට කථාකරන්න බැහැ. තමුන්නාන්සේ පහුගිය සභාවේ මම ඉල්ලුවා නගරසභාවේ ලුනාවේ කලපුවේ සුරංග අපොන්සු මන්ත්‍රීවරයා ගේට්ටුවක් දාගෙන ඉන්නවා කියලා මම පෙත්සමකින් ඉදිරිපත් කරේ මට මේක අදාල නැහැ. මම කියන්නේ නැහැ කඩන්න කියන එක.හැබැයි නීත්‍යානුකූලව මන්ත්‍රීවරයාට ඒ අවසරය තියෙනවා නම් ඒහා සමාන අයිතියක් අපිව පත්කරපු අපි ඉන්නේ ජනතා පරමාධිපත්‍යයට යටින් ඒ ජනතාවත් ඉල්ලුවොත් ඒ අයට දෙන්න ඕනේ. එක් අයෙක්ට විතරක් භුක්තිවිදින්න බැහැ. මන්ත්‍රීවරයෙක් කියලා අඩි 15ක ගේට්ටුවක් ගහගෙන ඒක මන්ත්‍රීවරයා විතරක් භුක්ති විදිනවා නම් ඒක වැරදි කියලා පිලිගන්නේ නැද්ද තමුන්නාන්සේ තමුන්නාන්සේ උත්තරයක් දීලා තියෙනවා මම කවදාවත් මේ ගේට්ටුවෙන් ඇතුලට ගිහිල්ලා නැහැ කියලා තමුන්නාන්සේ යන එකක් ගැන මම ඇහුවේ නැහැ. මේකෙන් මට අදාල නැහැ තමුන්නාන්සේ ගියාද නැද්ද කියන එක. මම කියන්නේ ගේට්ටුවක් තියෙනවා එතන ගේට්ටුවෙන් ඇතුල්වෙනවා. තමුන්නාන්සේ ගියාද නැද්ද කියන එක මම දන්නේ නැහැ. රට ගියාද කොහොම ගියාද හොරේන් ගියාද මට අදාල වෙන්නේ නැහැ. මම කියන්නේ මේ අයිතිය හැමෝටම දෙන්න ඕනේ. මේ මන්ත්‍රීවරයා පාවිච්චිකරනවානම් අඩි 15 ගේට්ටුවක් ඒ අයිතිය හැමෝටම දෙන්න ඕනේ. තමුන්නාන්සේ කියනවා මන්ත්‍රීවරයාට 15 තියෙනවා. අනෙක් අයට අඩි තුනයි තියෙන්නේ. වැරදියි සමාන අයිතියක් හැමෝටම තියෙන්න ඕනේ. වරිපනම් බදු ගෙවන හැමෝටම යම් කිසිකෙනෙක් ගිහිල්ලා මේක පෙන්නලා නඩුවක් දැම්මොත් උසාවියේ අපි මොකද කියන්නේ නගර සභාවෙන්ද වියදම් කරන්නේ. අන්න එතනදි වැරදියි අනෙක් එක නගරාධිපතිතුමා තමුන්නාන්සේට කියන්න ඕනේ මෙතන නීති නිලධාරියෙක් ඉන්න කොට තමුන්නාන්සේ ඇගේන් ගන්න තීන්දු තීරණ තියෙනවා. ඔලුව පාවිච්චි කරන්නේ නැතිව අපි වන්දි ගෙවනවා. අර ස්ටේඩියම් ඒකේ නඩුව තමුන්නාන්සේ එදා ඇගේන් ගත්ත

තින්දුවක් අද නගර සභාවෙන් අපි නිතිඥයො හොයනවා නඩු කියන්න. ඇයි තමුන්නාන්සේට තිබ්බේ නැත්තේ නගර සභාවේ නිති නිලධාරි බදවගෙන ඉන්නවා නම් අහගන්න තමුන්නාන්සේගේ ජේෂ්ඨ මන්ත්‍රිවරු ලන්කරගෙන අහන්න තිබ්බේ නැද්ද මේකට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. මන්ත්‍රිවරු පැත්තකින් තියමු. නිති නිලධාරිගෙන් අහගන්න තිබ්බා එහෙම අහන්නේ නැහැ. තමුන්නාන්සේ වැරදි තින්දු ගන්නවා. මේ නගර සභාවෙන් ගෙවන්න වෙනවා එකක් කියනවා නගරාධිපතිතුමනි තව මාස ගානයි මේ සෙල්ලම තියෙන්නේ. අපිට ඡන්දයකට යන්න වෙයි. ඔබතුමා හිතාගෙන ඉන්නවානම් ඔබතුමා ආපහු ඔය පුටුවට එනවා කියලා ප්‍රශ්නයක් නැහැ. මේක පුලුවන් හැබැයි මම හිතන්නේ මම කවදාවත් මැතිවරණයක් කරන්නේ නැහැ මම දිනනවා කියලා පස්වෙනි පාර මම ඡන්දෙ කරොත් මම පරදයි කියලා මම යන්නේ දිනන්න. උනන්දුව දවසෙන් දවස ඇතිවෙන්නට ඕනේ. මම දිනනවා කියලා ගියානම් මම නොදැනුවත්වම මම පල්ලේහා අභියෝග තිබ්බ වෙලාවෙත් අපි එහෙමයි ගියේ. ලංකාවේ අපේ පක්ෂයේ කිසිම කෙනෙක් නැහැ පස්වෙනි වතාවට සියයට හැත්තෑවක ප්‍රතිශතයක් ගත්ත පුද්ගලයෙක් ප්‍රතිශතයක් විදියට ඡන්දවලින් හැම ඡන්දෙන්ම මම සියයට හැටට වඩා ඉදලා තියෙනවා. හැම මැතිවරණයේම මම ජයග්‍රහනය කරලා තියෙනවා. හැබැයි කරුමේට අපේ පක්ෂයට ලැබෙන ඡන්ද ප්‍රමාණය අඩුයි. ලැබෙන ඒකේ ප්‍රතිශතය ගැනයි මම මේ කථා කරේ. ඒනිසා නගරාධිපතිතුමනි ගන්න තින්දු තිරණ නිතිඥ මහත්වරුන්ගෙන් අහන්න පරිපාලනය හවුල් කරගන්න. මොකද ඒ අයගෙත් අදහස් තියෙනවා. ඒ අයත් කැමතිවෙන්නේ නැහැ. යම් කිසිදවසක සර්චාර්ජ් එකකට ලක්වෙන්න. ඒනිසා මේ උසාවි තින්දුවලට සහ ඔබතුමාගෙන් අපි ඉල්ලිමක් කරනවා නිති නිලධාරිගෙන් මේ වෙලාවේ තමුන්නාන්සේ ගිය සභාවේදි අනුමත කරගත්තා. ලක්ෂ විසිගානක් තමුන්නාන්සේගේ නඩුවකට වියදම් කරා කියලා මහා ඇමති දාපු මේ නිති නිලධාරිගෙන් අහලා අපිට වාර්තාවක් දෙන්න. තමුන්නාන්සේ මේ ගන්න මුදල සාධාරණද ගන්න පුලුවන්ද කියලා මේ නිති නිලධාරිගෙන් අහලා අපිට වාර්තාවක් දෙන්න. අපිට ප්‍රශ්නයක් නැහැ. මේ නිති නිලධාරි නිර්දේශ කරනවා නම් තමුන්නාන්සේට මේදේ ලැබෙන්න ඕන කියලා මේ නගර සභාවේ නිතිඥයෙක් ඊට භාහිරව යන්න එපා. මේ නගර සභාවේ නිති නිලධාරියා වාර්තාවක් දෙනවානම් මේක දෙන්න සුදුසුයි කියලා ඔයගොල්ලෝ විතරක් නෙමෙයි අපිත් අත උස්සන්නම් නැත්නම් වෙන්නේ කවදාහරි මේ අයට ගෙවන්න වෙයි. මේ අහිංසක මිනිස්සුන්ට ගෙදර ඉදලා ලක්ෂ ගණන් ගෙවන්න වෙයි. ලක්ෂ විසිගණන් අරගෙන ඒක නිසා මේ නිති නිලධාරියෙක් ඉන්න කොට සභාවට දාන්න ඉස්සේල්ලා ඒ නිති නිලධාරිගේ වාර්තාවකුත් එක්ක දාන්න. අපි අනුමත කරන්නම් එහෙම නැතිව දාන්න බැහැ. ඒ එක්කම නගරාධිපතිතුමනි කියන්න ඕනේ. මම හිතනවා අපිට ආඩම්බරවෙන්න පුලුවන් කාරණාවක් තියෙනවා ආඩම්බරවෙන්න පුලුවන් ලොකුවට මේ ඉතිහාසය තුල මොරටුව නගරසභාවේ කිසිම නගරාධිපතිවරයෙක් අරගත්තේ නැතිවිදියට තමුන්නාන්සේ තව මාස කිහිපයකට පිස්තෝලයක් ඉල්ලලා තියෙනවා. පිස්තෝලයක් අරගෙන ගෙදර යන්න ලැජ්ජයි තමුන්නාන්සේ මහජන ඡන්දෙන් ඇවිල්ලා දැන් කිව්වා අවුරුදු 16ක් නගරාධිපතිවරයා විදියට ඉන්නවා කියලා ආඩම්බරයෙන් නගරාධිපතිතුමනි අද කොහොමද පිස්තෝලේ ගන්නේ. මොරටුව මිනිස්සුන්ට වෙඩි තියන්නනේ මොරටු මිනිස්සුන්ගේ භයට හැංගෙන්නනේ පිස්තෝලේ ගන්නේ. තමුන්නාන්සේ ලැජ්ජයි කියන්න තනතුරට ගත්තාට කමක් නැහැ. ගන්න තිබ්බේ කලින් එහෙමනම් ගානක් නැහැ. මේ මන්ත්‍රිවරු ගොඩක් අය දන්නේ නැහැ. හැබැයි තමුන්නාන්සේලා ඊලගට ලැයිස්තුවෙන් යන්නේ ඡන්දෙ ඉල්ලන්න යන්නේ මේතුමාගේ නායකත්ව ලැයිස්තුවෙන් මිනිස්සු මොනවා කියයිද ඡන්දේ දෙයිද බලමු. නගරාධිපතිතුමනි මට පළාත් සභාවට ගිය දවසේ ඉදලා පිස්තෝලයක් එන්ටයිටල් පස්පාරක් අවුරුදු 25කට ඉස්සේල්ලා මම ගත්තේ නැහැ. මොකද අපිත් ඒ දවසවල දඩබ්බර වැඩියි. ඕක ගත්තානම් මෙතනත් නෙමෙයි අපි ඉන්නේ. පෞද්ගලිකව දන්නවා ෆෝම් එක දුන්නා මම ඉරලා දැම්මා. මට ගාඩ් එක පොලිසියෙන් දෙන්නෙක් දෙනවා මම ගත්තේ නැහැ. මම එක දවසක්වත් ගියේ නැහැ පොලිසියේ අයත් එක්ක.හැබැයි අපිට පාරේ බැහැලා යන්න පුලුවන්කම තියෙන්න ඕනේ. තමුන්නාන්සේ හිතින් හිතාගන්න තර්කයක් නැහැ. තමුන්නාන්සේ උත්තරයක් දෙන්න එපා. මම ආවේ මිනිස්සුන්ගේ කර පිටින්. හැබැයි මම දැන් මිනිස්සු ඉස්සරහාට යන්නේ විශ්‍රාම ගිහිල්ලා මම යන්නේ ඒකෙන් පස්සේ පිස්තෝලයක් ඉනේ ගහගෙන. තමුන්නාන්සේ මෙතන ඉන්නකොට මේ සභාවේ තමුන්නාන්සේගේ පැමිණිලිකාරයෙක් ඉන්නවා නිරෝෂන් අපොන්සු මේ පැමිණිලිකාරයෝ තුන්දෙනෙක් ඉන්දෙද්දි තමුන්නාන්සේ නඩු තුනක් තියෙනවා. තමුන්නාන්සේ නඩු තුනක චූදිතයෙක්. සාමාන්‍ය නගරාධිපතිවරයෙක් නෙමෙයි. තමුන්නාන්සේ කොහොමද පිස්තෝලයක් ගන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සමාවෙන්න නගරාධිපතිතුමා කාගේහරි ජීවිතයකට හෝ මොකක් හරි දෙයකට අභියෝගයක් තියෙනවානම් ඒ ආරක්ෂාවට ගන්න දේ ප්‍රසිද්ධියේ කථාකරන එක හරි නැහැ. ඒකේ වගකීම තියෙන්නේ ඒ අදාල ආරක්ෂක අංශවලට.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ආරක්ෂාවක් අවශායි. මොකටද ආරක්ෂාව අවශා වෙන්නේ? පහුගිය කාලේ කරපු සිද්ධි නිසා ආරක්ෂාවක් අවශායි. සාමානා මිනිහෙක් වගේ හිටියානම් පොලවේ පය ගහලා යන මිනිහෙක් වගේ හිටියානම් මෙහෙම ආරක්ෂාවක් අවශා වෙන්නේ නැහැ. මට මතකයි තමුන්නාන්සේලා අපි එකතුවෙලා වඩු උද්ඝෝෂනයක් කරා මෙතන. ලොකු වඩු උද්ඝෝෂණයක් දහස්ගානක් සෙනග ගෙනාවා. අපේ බැදිමක් තිබ්බා අපි එකට හිටියා. අපි ඒක ජයග්‍රහනය කරා. හැබැයි අපිට ඒ දහස්ගානම ආදරය කරා. අද මොකද වෙලා තියෙන්නේ ඒ ආදරය නැහැ. මේ මන්ත්‍රීතුමා කියන එක ඇත්ත.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා ආයවන හෝ පෙත්සමක් ඉදිරිපත් කරන්න. ආයවන හා පෙත්සමක් ඉදිරිපත් කරන කොට මගේ මේ පෞද්ගලිකත්වයත් එක්ක පෙත්සමක් අදාල නැහැ. ඔබතුමා මගේ පෞද්ගලික කරුණුත් එක්ක පෙත්සම් ඉදිරිපත් කරලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,අපේ පක්ෂයේ ඉන්නවා තමුන්නාන්සේට පැමිණිල්ලක් දාපු අය අපිට හයයි. එයත් මට කිව්වා පිස්තොලයක් ඉනේ ගහගෙන ඉන්නකොට ඒ හය තියෙනවා. එයා චන්ඩියෙක් කියලා කියන්නේ නැහැ. එහෙම හයක් නෙමෙයි තියෙන්නේ. නිතියට පිටින් වුදිතයෙක් වෙලා ඒක හංගලා නඩු තුනක වුදිතයෙක් කියන එක හංගලා පිස්තෝලයක් ගන්නේ කොහොමද තමුන්නාන්සේ. අපි කියන්නේ ඒකතමයි නගරාධිපතිතුමනි තමුන්නාන්සේ කියනා පෞද්ගලිකත්වයක් ගැන තමුන්නාන්සේ එදා මම ඉදිරිපත් කරේ අර ගේට්ටුවක් සම්බන්ධව. හැබැයි තමුන්නාස්සේ බලන්න වාර්තාව අරගෙන ගේට්ටුව සම්බන්ධව ඇහුවාම එකට උත්තර දුන්නානම් ප්‍රශ්නයක් නැහැ. ඒකෙන් තමුන්නාන්සේ ගහන්නේ මට මොනාද කියලා තිබ්බේ බලන්න මේ වාර්තාව අරගෙන. එහෙනම් තමුන්නාන්සේ මගේ පෞද්ගලිකත්වය ගහන්නේ එහෙම කරන්න බැහැ . අදාල ප්‍රශ්නයට විතරක් උත්තරයක් දෙන්න. තමුන්නාන්සේ ඔය පුටුවේ වාඩිවෙලා ඉන්නකොට තමුන්නාන්සේ කියන කරන දේ වාර්තාවේ තියෙනවා. මම සූක්ෂමව බලන් ඉන්නවා. යම්කිසි කෙනෙක් මට පහරක් එල්ල කලොත් මට රැට නින්ද යන්නේ නැහැ. තව සුමානෙකට කලින් මේ දේවල අගක් මුලක් නැරම හොයනවා. හිනි අතු ඉති නෙමෙයි හින් කෙන්දක් තිබ්බත් ඒක හොයන ආකාරයට මම පත්වෙනවා. මට වුවමනාවුන තැනට මම ගන්නවා. අදවෙනකොට ගොඩක් දේවල් අරගෙන තියෙනවා. තමුන්නාන්සේ හිතනවා තමුන්නාන්සේ එදා කිව්වා පටන් ගත්තොත් කොතනින් පටන්ගන්නවෙයිද දන්නේ නැහැ කියලා. හැබැයි නගරාධිපතිතුමනි තමුන්නාන්සේ ඇතුලට ගිහිල්ලා එන ටිකට සුමාන හතරට ගොඩක් දේවල් මම නගරසභාවේ ගත්තා. ඒ දවස්වල අපි අල්ලස් චෝදනාවක් දැම්මොත් ඒකට විභාගයක් කරාම ඒකට තොරතුරු නැති නිසා දෙන්නේ නැහැ. මේ තොරතුරු දැනගැනිමේ පනතට පින් සිද්ධවෙන්න දැන් දෙවල් ලබාගන්න පුලුවන්. දැන් තියෙනවා ප්‍රශ්නයත් තියෙනවා. උත්තරයත් තියෙනවා. රාජා ආයතනයෙන් ලබා ගත්තා තින්දුව විතරයි දෙන්න තියෙන්නේ. ඒ නිසා නගරාධිපතිතුමා විදුරු ගෙවල්වල ඉදලා ගල් ගහන්නනම් ලෑස්තිවෙන්න එපා. අංක ඒක පටන්ගන්න වෙන්නේ ඔය පුටුවෙන් කියන එක මතක තියා ගන්න. මම මෙතන කියන්නේ නැහැ තමුන්නාන්සේ අභියෝග කරනවානම් මම දැන් කියන්නම්.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම අභියෝගයක් කරනවා කියන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේක ලොකු පාඩුවක් වෙන්නේ ඔබතුමාට.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම පාඩු විදලා තියෙනවා ඕන තරම්. පාඩු විදින්නත් දන්නවා. පාඩු වෙච්ච වෙලාවේ ඔබතුමන්ලාව පරද්දගෙන මෙතනට ඇවිල්ලත් තියෙනවා. කියන්න මම අභියෝගය භාරගන්නවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඊලග පාර දිනන්නේ නැහැ. නගරාධිපතිතුමා තමුන්නාන්සේ තමුන්නාන්සේගේ පුතාට තමුන්නාන්සේගේ අත්සන ඇතිව මෝරිස්කඩේ ඉඩම පර්චසි තුනයි ගත්තානේ. අරගෙන බිල්ඩින් එක සම්පූර්ණයෙන් කැඩුවා. කඩලා බිල්ඩින් එකක් ගැහුවා. ඒ බිල්ඩින් එකේ පාරට තිබ්බ සීමාව අනෙක් මිනිස්සුන්ට නැහැ. තමුන්නාන්සේට විතරයි ඒ සීමාව. තමුන්නාන්සේ අනෙක් මිනිස්සුන්ට ඒ අවස්ථාව දෙනවාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඕවා අභියෝගයක්ද මන්ත්‍රීතුමා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,එතකොට තමුන්නාන්සේ මෙතන මේ පර්චස් තුනකුත් ගානට දෙන්න පුලුවන් තට්ටු කියකටද දැන් තට්ටු පහක් තියෙනවා. තමුන්නාන්සේ නගරාධිපතිවරයා මේක ගහලා තියෙන්නේ තමුන්නාන්සේගේ පුතා. ඊට පස්සේ යම් කිසි කෙනෙක් පැමිණිල්ලක් කරනවා කින්ස්ලි කියලා මහා ඇමතිට. ඊට පස්සේ එක දානවා පලාත් පාලන කොමසාරිස්ට. එක දානවා ආණ්ඩුකාරවරයාට. මෙතන තමුන්නාන්සෙට එවනවා ලියුමක්. මේක අනවසර ඉදිකිරීමක් මේක කඩා ඉවත් කරන්න කියලා. කවුරුහරි ගිහිල්ලා මේක ගිනි තියනවා. දැන් වන්දි ලබා ගන්න ඕනේ. වන්දි වාර්තාවක් තියෙන්න ඕනේ. දැන් තමුන්නාන්සේට පුලුවන්ද වන්දි වාර්තාවක් දීලා හදා ගන්න. තමුන්නාස්සේ දැන දැනම මේක ගත්තොත් මග හිටියෝත් තෝ නසී ගෙදර ගියොත් අඹු නසී මේ එකක් විතරයි. ඒක නිසා නගරාධිපතිතුමනි මම මෙතනින් නවත්වන්නම් තව ගොඩක් දෙවල් තියෙනවා තමුන්නාන්සේ දාලා තියෙනවා මොරටුව පොලිසියේ බඩුවල අලාභය එක්කොටි තිස්පන් ලක්ෂයයි. තමුන්නාන්සේගේ වැටුප මේ දක්වා තියෙන්නේ මම ගණනය කරලා බැලුවාම කෝටියකට වඩා අඩුයි. ගෙදර බඩුවල විතරක් වටිනාකම එක් කෝටි තිස්පන් ලක්ෂයයි.

**(සභා සෝෂා)**

මෙන්න මේදෙවල් වලින් මොරටුවේ ජනතාව කුපිතවෙලා ඉන්නේ. තමුන්නාන්සේ කරපු දෙවල් වලට තමුන්නාන්සේ වගේ පුද්ගලයෙක්ට පිස්තෝලයක් නිකුත් කරනවානම් මේ සභාවේ අපේ විපක්ෂ කණ්ඩායමේ සම්පූර්ණ විරෝධය මේ අවස්ථාවේ ප්‍රකාශකරනවා. තමුන්නාන්සේට ආරක්ෂාවක් ඕනේ. ඒක දෙන්න ඕනේ. පොලිස් ආරක්ෂාවක් ගන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,පුද්ගලයා මම නම් මට මේකට අවශ්‍ය ප්‍රමාණය පමණක් මට කියන්න අයිතිය තියෙනවානේ. පුද්ගලයා මම නිසා සභාවේ කටයුත්තක් නෙමෙයිනේ. මේ පුද්ගලයාගේ කටයුත්තක් ඒකනිසා ඔය කියන කාරණා ඔක්කෝම යන්න පුලුවන් නීතියක් තියෙනවා. යන්න පුලුවන් තැනක් තියෙනවා. කරුණාකරලා එතනට යන්න. විදුරු ගෙවල්වල ගල් ගහනවානම් ගල් ගහගමු. සමහර අය ගල් ගහන්න අපිට හදනකොට ඒ ගල කාටද වදින්නේ කියලා හෙට අනිද්දා බලා ගත්ත හැකියි. මෙහෙමයි වෙලා තියෙන්නේ නමින් අර යම් යම් පුද්ගලයෝ පොඩ්ඩක මේ කටට දාගෙන මත්වුනාට පස්සේ මිනිස්සුන්ට ගහන සිස්ටම් අපිගාව නැහැ. යම් මිනිස්සු වගේ නිකම් මේ බේබද්දෝ වගේ ගිහිල්ලා ඒ සිස්ටම් අපි ගාව නැහැ. ඒනිසා සමහර අය එහෙම චණ්ඩිත් වෙලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කියන්නේ පළාත් සභාවේ මෙච්චරයි පලපුරුද්ද මේච්චරයි ඕකයි කියන්නේ බීගත්තාම බිගෙන කැගහන තැන් තැන් වලට ගිහිල්ලා චණ්ඩි වෙන්න සමහරක් දුවගෙන යන විට අනෙක් මිනිස්සුන්ට වෙඩි වදින්න තව අයට පාට් දාලා යනකොට අහිංසක මිනිස්සු වෙඩි කන්න ඒ චණ්ඩි නෙමෙයි අපි. මිනිස්සුන්ව දන්දෙන්න එකට ඉදගෙන මැහුම් ඒකොලහ,දොලහා ගහන්න ඔලුව පැලෙන්න චණ්ඩි නෙමෙයි අපි. බොන්න දීලා ඔලු පලන මිනිස්සු නෙමෙයි අපි. ඒවා අපි ගාව නැහැ. අපි මිනිස්සුන්ට ගහලා නැහැ. අපි මිනිස්සුන්ට බැනලා නැහැ. අපි මිනිස්සුන් එක්ක රණ්ඩු කරලා නැහැ. අපි දේශපානලන උන අරගෙන නැහැ. පොලිසියේ ඉන්න එක්කෙනාව කුඩුවට දාලා කුඩුවේ එකාව අරගෙන නැහැ.එහෙම

දේශපාලනයක් අපි කරලා නැහැ. අපි බොහෝම හොදට දෙයියනේ කියලා අපි දේශපාලනය කරලා තියෙනවා. ඒනිසා අපිට එහෙම ප්‍රශ්න නැහැ. අපි ගිහිල්ලා පොලිස්කාරයාව කුඩුවට දාලා කුඩුවෙ හිටපු අයව අරගෙන ඇවිල්ලා එහෙම දේශපාලනයක් අපි කරලා නැහැ. වැඩකාරයො කියන්නේ එහෙම තමයි. පට්ට වැඩකාරයෙක්. එම දේශපාලනය අපි දන්නවා. එක්තරා කාලයක ජනතා විමුක්ති පෙරමුණට ගඟහා බෙබදුකමේ දුවනකොට ඒවත් ආරක්ෂාකරන්න අපිත් ගියා. බලෙන් රාජ්‍ය දේපල බලෙන් පටවගෙන සෙවිලි තහඩු බලෙන් අරගෙන එක එක දාගෙන විකුණගෙන තමන්ගේ හිතවතුන්ට දෙනකොට ඒ දේශපාලනයත් අපි දැකලා තියෙනවා.

**(සභා ඝෝෂා)**

රාජ්‍ය දේපල අරගෙන ගිහිල්ලා පාසල්වල තියෙන එවා බලෙන් අරගෙන ගිහිල්ලා ඒ මිනිස්සු රිමාන්ඩ් වෙලා මේවා මේ කාටද කියන්නේ. ඒකනිසා විදුරු ගෙවල්වල ඉදගෙන ගල් ගහනවානම් ගල් ගහගමු. ගල් වලට බයත් නැහැ. ගල් ගහනකොට හයත් නැහැ. ගල් ගහන්න හයත් නැහැ. ඒනිසා ගහගමු. ඒක වෙනම කථාවක්. මේ වෙලා තියෙන්නේ මේ සභාවක්නේ. මේ එකට දහපාරක් එකගයි සමහර මිනිස්සු ස්ටේඩියම් එක ගැන කථා කරා. සමහර මිනිස්සු ඔප්පු දෙන්න දුන්නේ නැහැ යහපාලන ආණ්ඩුවෙන්. නගරසභාවේ අයිතිය ඔප්පු දෙන්න දුන්නේ නැහැ. කිව්වා දෙන්න එපා. ඒකට ජනතා විමුක්ති පෙරමුණ මොන වෙලාවේවත් එතන නැහැ. අපිට බැන බැන එගොල්ලෝ ආරක්ෂාකරන්නේ ජනතා දේපල. හැබැයි මොරටුව මහ නගර සභාවට සොයිසා මහත්තයා මීට පෙර 1941 දිපු ඔප්පුව අපි ගන්න යනකොට යහපාලනයේදි අපිට දෙන්න දුන්නේ නැහැ. ඒකත් එක්කම පොර බැදපු මනුස්සයෙක් මේක අපේ දේපලක් කියලා පොර බැදපු නිසා උන්ට හයිය දෙන්න සිල් කරන්න එපා කිව්වා.එහෙම කර කර දැන්මේ නිකම් මේ සුද්දවන්තයො වෙන්න යනවා. සමන්ලාල් ආරක්ෂාකරන්න ගියානම් ආරක්ෂාකරලා තියෙන්නේ මහ නගර සභාවේ දේපල. මම මගේ දේපලත් ආරක්ෂාකරලා මගේ පුද්ගලිකව ගත්ත දේපලත් ආරක්ෂාකරගන්නවා. මට ලැබෙන වන්දියයි මේ කැලණි හිගන්නෝ නෙමෙයි අපි. මම 1996 පුද්ගලිකව ලියාපදිංචිකරපු වඩු මඩුවක් කරලා රාජ්‍ය දැව සංස්ථාවට ලි බඩු සපයපු කෙනෙක්. මමකැළණි හිගන්නෙක් නෙමෙයි. අනික කඩා පාත්වෙච්ච එකෙකුත් නෙමෙයි. එක නිසා මම මේ කොතනදිත් මම පටන් අරගෙන තියෙන්නේ කොහොමද දේපල අරගෙන තියෙන්නේ කියන එක මෙ මම මේ අවුරුදු මේ 20 මෙතනට හිරවුනා කියලා මෙතනින් පස්සේ මට ජීවිතයක් නැද්ද වත්කම් බැරකම් වලට මගේ දේපල මම පුරවලා තියෙන්නේ.මගේ කසාද බැදපු දරුවන්ගේ ඒවා පුරවන්න මට අයිතියක් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,පෙත්සම් පැමිණිලි අයිතමය අයින් කරලා සභාවේ නගරාධිපති ඇතුලු මන්ත්‍රිවරුන්ගේ පැටිකිරිය කථාකරන අයිතමයක් දාන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා,විශේෂයෙන්ම පුද්ගලයෙක්ම අරමුණු කරගෙන ඔබතුමාට දැන් ඔබතුමාගේ නමින් ගරු මන්ත්‍රිවරයෙක් කථාකරාම ඕන තරම් අවස්ථාව මම දිලා තියෙනවා. ඔබතුමයි මමයි අවුරුදු 20ක් හිටියා. ඔබතුමා ඊට ඉස්සෙල්ලාත් අවුරුදු පහක් හිටියා. හැබැයි ඒ පහේදිම මේතරම් මේ වැඩ්ඩෝ කියන කට්ටිය මෙහෙම කථාකරන එකනේ ප්‍රශ්නය තියෙන්නේ. මෙතන හිටියා කියනවා අතන හිටියා කියනවා. නිති රිති දන්නවා කියනවා. ගල් ගහගන්න කැමතියි. අපි එක කරගමු. දැන් ගල වදියි දැන් ටික දවසක් යනකොට වදින්න ඕන කාටද කියන එක ප්‍රශ්නයක් නැහැ. ඒ වදින ඕන තැනට අපි මුහුණ දෙන්නත් කැමතියි. ඒකේ කිසි ගැටලුවක් නැහැ. අනික මට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් මට වෙපන් එකක් දෙන්නනම් ඒ වෙපන් එක දෙන්න මට සුදුසුකමක් තියෙනවානම් වෙපන් එක ගැනිම සදහා මට අවශ්‍යතාවය තියෙනවානම් අධිකරන ක්‍රියාවලියකදි ගන්න බැරිවෙන්නේ අපරාධ නිතියක් යටතේ විතරයි දූෂණයක් කරලා නැත්නම් අපරාධ නිතියක් නැත්නම් මේ තල්ලුකරා වගේ කියලා නඩුදාලා ඒවා මේවා තියෙන එවයි සමථ මණ්ඩලයට යන නඩු වලටයි වෙපන් එකක් ගන්න බැරිකමක් මට නැහැ. මම මේක ගන්නවා. මම අවුරුදු 16ක් ඇල්පෙනෙත්තක්වත් අතේ තියාගෙන නැති බව මේ ඔක්කොම මිනිස්සු දන්නවා සමහර අය අපි නොදන්නවා වුනාට පාන්දර දෙකට තුනට හතරට මලගෙවල්වල ගිය මට මේ ටිකේ පොඩි කණගාටුවකින් ඉන්නේ මලගෙවල්වල යන්න බැරි හයට නෙමෙයි ඉන්න තැනත් එක්ක පොඩි ප්‍රශ්නයක් තියෙන නිසා. එහෙම නැත්නම් එතනට යන්න හයකට නෙමෙයි අල්පෙනෙත්තක් නැතිව ගිය මට හෙටත් අල්පෙනෙත්තක් නැතිව යන්න පුලුවන්. අපිවත් ආරක්ෂා කරන්න මිනිස්සු

ඉන්නවා ගල් ගහන්න කියන්න මිනිස්සු ඉන්නවා වගේම ගල්ගහනකොට අල්ලගන්නත් මිනිස්සු ඉන්නවා. අපි තාමත් කණගාටුවෙන්නැත්තේ මොකවත් නිසා නෙමෙයි නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා අපි කණගාටුවෙන්නැත්තේ තාමත් ඒක නිසා නෙමෙයි. තාම පොහොට්ටුවේ මිනිහෙක් අපිට ගලක් ගැහුවේ නැහැ. ඒනිසා අපි කණගාටු වෙන්නේ නැහැ. ගල් ගැහුවේ සජබයෙන්.

**(සභා ඝෝෂා)**

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඔය චෝදනාව බැහැර කරනවා. තමුන්නාන්සේ පොඩ්ඩක් උසාවියට ඇවිල්ලා බලන්න උසාවියේ චූදිතයෝ කියලා ගෙන පුද්ගලයෝ හරි පුද්ලගලයෝද නැද්ද කියන එක දන්නේ නැහැ ගෙන පුද්ගලයෝ දිහා බලන්න එගොල්ලන්ගේ දේශපාලන තත්වය දිහා බලන්න මෙතන ඉන්නවා හැම පක්ෂයේම මිනිස්සු තමුන්නාන්සේලාගේ පක්ෂේ මින්ස්සුත් ඉන්නවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා දැනුවත් කිරිම ගැන බෝහොම හොදයි. මොකද මාවත් ගත්තේ කාටවත් ගහලා නෙමෙයි. ෆොටෝ එකක ඉදලා පොලිසිය ගන්නේ විඩියෝ පටියත් මට දුන්නේ පොලිසියෙන්. විඩියෝ කරන්න මම හිටියායැයි හදුනගන්න කියලා පොලිසියෙන් දුන්නා. මම කිව්වා ඔයගොල්ලෝ හදුනගෙන ඕන දෙයක් කරන්න මට ප්‍රශ්නයක් නැහැ කියලා. ඒක නිසා කරුණාකරලා අපි ඔබතුමා ඔය කථාව කරනකොටත් දන්නවා කථාව අද කරනවා කියලා. මම මන්ත්‍රී කණ්ඩායමට කිව්වා සේනකගේ අද කථාව මේක කියලා. මම කියලයි ආවේ. මට කිසි ප්‍රශ්නයක් නැහැ. වෙපන් එකක් ගන්න කියලා බලපත්‍රයක් මට ආවොත් මම එක ගන්නවා. ගන්නේ වෙන මුකුත් නිසා නෙමෙයි අපි හිතනවා අපි අතර ඉන්න දේශපාලඥයෝ අපි හිතන දේශපාලඥයෝ නොවන නිසා අපිට පොඩි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඒක නිසා ගන්න වෙනවා.

03(6) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ලබන මාසයේ 4,5 තියෙනවා මොරටුව වේල්ස්කුමර විදුහල සහ ශාන්ත සෙබස්තියන් අතර බිග් මැච් එක.ක්‍රිඩාංගනයේ ටෙන්ට් ඒකේ වහලේ තහඩු ගලවගෙන ගිහිල්ලා තියෙනවා. ඒකනිසා ඒ දවස්වලට ඉස්සෙල්ලා ඒක අපිට රේපෙයාර් කරලා දෙන්න පුලුවන්නම් ගොඩක් හොදයි. ඒවගේම මම සුභාෂිංශනයක් කරන්න ඕනේ මේ දවස් ටිකේ දිසාපති කුසලාන තරගමාලාව පවත්වනවා. ප්‍රාදේශිය ලේකම් 15වේ ඒකේදි මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල කාන්තා කණ්ඩායම ජයගහනය කරා කඹ ඇදිමේ තරගයෙන්. ඒ සදහා අපිට අපේ රංගන මන්ත්‍රීතුමා තමයි ඒ දායකත්වය දුන්නේ. ඒනිසා ඔහුටත් මගේ සුභපැතුම් පුදකරනවා මේ අවස්ථාවේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,පි සුදර්මන්මත්තෙස් අංක 12,07වන පටුමග මට මේ ලිපියක් මගින් දැනුවත් කිරිමක් කරලා තියෙනවා. නගරාධිපතිතුමනි පොඩි හැදින්වීමක් කරන්න ඕනේ. සාමාන්‍ය ප්‍රධාන මාර්ගයට අතුරු මාර්ගයකින් ප්‍රවේශ වන ස්ථානයේ වාහන පාර්ක් එකක් ඉදිකිරිමේදි ගරු නගරාධිපතිතුමනි කොයිම තැනකවත් මාර්ගයට ආසන්නයේම වාහන පාර්ක් එකක් කොයි ස්ථානයේවත් නැහැ. නමුත් මේ අරුම පුදුම වාහන පාර්ක් එකක් තියෙනවා. රාවතාවත්ත බ්‍රයිට් හවුස් එක සහ වයින් ස්ටෝස් එක අතර 07 වෙනි පටුමග ඕනම වෙලාවක එතන වාහනයක් නැවැත්තුවාට පස්සේ අතුරු මාර්ගයේ සිට වාහනයක් දමද්දි කෙලින්ම කාර් එකක්නම් මුහුණ පාරට ගියාට පස්සේ තමයි පෙන්නේ. පාරෙන් එන වාහන මේ ස්ථානයේ මේ තියෙන්නාවූ වාහන පාර්කින් එක නිසා අනතුරු වෙනවා. ප්‍රදේශවාසින්ට ගොඩක් හිරිහැරයි එතන බස්නැවතුම්පලකුත් තියෙන නිසා අනතුර තවත් බහුලයි. මම මේ ලිපිය සභාගත කරනවා ගරු නගරාධිපතිතුමනි. ඒ ස්ථානය වාහන පාර්කින් එකට සුදුසුද නැත්ද කියලා අවශ්‍ය කටයුතු බලලා නිසි පිළිතුරක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(7) **<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මා විසින් ලුනාව කලපුවට මුහුණලා තියෙන මාර්ගයට ගේට්ටුවක් දමා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි නගර සභාවේ නිති රිති වලට එකගව එය වැසිමට සුදානම් කියලා. මම ගිය මහා

සභාවෙත් කිව්වා ඒ අදාල යෝජක මන්ත්‍රීතුමාගේ යෝජනාවක් අනුව ක්‍රියාත්මක කිරිමට එම ලිඛිත ලියවිල්ල මාහට ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**03(8)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,අගුලාන රිවර් සයිඩ් නිවාස සංකිර්ණයේ අසල ඇති ගොඩනැගිල්ල සම්බන්ධවයි මම කථාකරන්නේ. මෙම ගොඩනැගිල්ල ඉතාම වටිනා කියන ගොඩනැගිල්ලක්. මොකද හේතුව විශාල ජන සංඛ්‍යාවක් මැද්දේ තියෙන්නේ. මේ ගොඩනැගිල්ල විශාල කාමර තුනකින් සම්පූර්ණ හෝල් එකකින් සමන්විතයි. වටේ තාප්පේ බැදලා හොද තත්වයේ ඇති ගොඩනැගිල්ලක්. මේක දැන් නිකරුනේ වහලා තියෙනවා. මේක ඇත්තටම එහි වසන ජනතාවගේ ඉල්ලිම මත මේ ප්‍රකාශය කරන්නේ රිවර් සයිඩ් එකේ තියෙන ගොඩනැගිල්ල මේක මත්ද්‍රව්‍ය ගන්න උදවිය පාවිච්චියට ගන්න ප්‍රථම මේ ගැන හොදටම බලලා අගුලාන මොරටුව සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කරනවානම් ඉතාමත්ම හොදයි. මොකද හොද ගොඩනැගිල්ලක් දිරාපත්වෙච්ච එකක් නෙමෙයි. අලුත් ගොඩනැගිල්ලක් ඒනිසා වටේ පරිසරයත් හොදයි. මේ සම්බන්ධව සැලකිල්ලට ගනිමින් මෙය සඳහා කටයුතු කරලා මෙයට යම්කිසි රාජකාරි කටයුත්තක් ඉටුකරනවානම් වඩා හොදයි කියලා තමයි ප්‍රදේශවාසින් සඳහන් කරන්නේ. මෙය ගැන අවධානය යොමු කරන්න කියලා ඉතා ඕනැකමින් ඉල්ලා සිටිනවා.

## 04. <u>ප්‍රශ්න</u> - නැත

## 05. <u>යෝජනා</u>

**05 (01) මහා නගර සභා මන්ත්‍රී, එස්. කේසර රවින්ද්‍ර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"ද සොයිසා ක්‍රීඩාංගනය ඉදිරිපිට වෙලෝනා ඉඩමෙහි මහා නගර සභාව සතු බිම් කොටසෙහි මොරටුවේ සිට දුර බැහැර හා රැකියාවට යන මගීන් සඳහා මුදල් අයකර රිසිට් පතක් නිකුත් කර ආරක්ෂිතව යතුරු පැදි හා පාපැදි ගාල් කර තබා යෑමට සුදුසු පරිදි රථ ගාලක් ඉදිකොට පවත්වා ගෙන යාමට සභාවට යෝජනා කරන්නීය."

මහ නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,කේසර රවින්ද්‍ර ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් මේ ඉඩම මොරටුව ප්‍රදේශයේ තියෙන වටිනාකමින් වැඩිම ඉඩමක්. එතකොට මේකේ කරුණු දෙකක් තියෙනවා. එකක් තමයි මේ ඉඩම කොහොමද නගර සභාවට ලබා දුන්නේ. මොන පදනමින්ද ලබාදුන්නේ. නගර සභාවට මේක නගර සභාවට ලබාදෙන්නේ සාමාන්‍යයෙන් ඉඩම් කට්ටිකරන කොට. ඒ ඉඩම්වල ඉන්න පිරිසගේ සුභසාධන කටුයුත්තකට යොදා ගැනිම සඳහා තමයි අපි දන්න විදියට මේ ඉඩම් කට්ටියක් වෙන් කරන්නේ. අපි කියමුකෝ දැන් ඒ අදහස බැහැර කරලා අපිට පුලුවන්කමක් තියෙනවා කියලා වෙන මොකක්හරි වැඩසටහනකට යොදා ගන්න. මා අහන්නේ මේවගේ ඉඩමකින් මොරටුව මහා නගර සභාවට ඉතාමත් ආර්ථික වශයෙන් ඉතාමත් වටිනා ඉඩමකින් කලයුතු වන්නේ මේ පාර්කින් එකක් දාන එකද? අනික පාර්කින් එකක් දාන්න එතන මොකක්ද? එතන බස්හෝල්ට් එකකුත් නැහැ. දුම්රිය ස්ථානයකුත් නැහැ. එතකොට මොකක්ද තියෙන්නේ. ඒනිසා කරුණාකරලා නගරාධිපතිතුමා මේ ඉඩම සම්බන්ධයෙන් මිට වඩා විධිමත් වැඩ පිළිවෙලකට යන්න ඕන. මේ ඉඩම අපිට පුලුවන්නම් වෙන කාර්යයකට යොදන්න මම දන්නේ නැහැ එහෙම යොදන්න පුලුවන්ද කියලා. ඒ සම්බන්ධයෙන් මට අවබෝධයක් නැහැ. යොදන්න පුලුවන්නම් මම හිතන්නේ ඵලදායි. මේ තියෙන යෝජනාව ඵලදායි යෝජනාවක් නෙමෙයි. ඒනිසා මේක නිකම් අපි කොහෙ හරි තියෙන ඉඩමකට නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ කේසොන් එකට ආශ්‍රිතව තියෙන මේ ඉඩම ඉතාමත්ම ඵලදායි ඉඩමක්. මොකද හේතුව වාහන පාර්කින් එකක් තියෙනවා කේසොන් එකේ මහා විශාලව. ඒනිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා මේ යෝජනාව මිට වඩා මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා එක දාන්න ඇත්තේ බොහෝම සත්චේතනාවෙන්. ඒ ගැන කිසිම තර්කයක්

අපිට නැහැ. අදහස් ප්‍රකාශකරන්නේ මේ යෝජනාව මීට වඩා ඵලදායි දෙයක් සඳහා මේ ඉඩම යොදාගන්න කියන ඉල්ලීම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මෙම යෝජනාවට මුකුත් කථාකරන්න නෙමෙයි හිටියේ නමුත් මේ ඉදිරිපත්වෙච්ච අදහස් එක්ක යමක් කියාගන්න ඕන කියලා හිතුනා. ඒ කියන්නේ අපි දීර්ඝ කාලයක් තිස්සේ මේ සභාවේ දේපල පිළිබඳව විශාල විවාදයක් අපිට තියෙනවා. අපේ දේපල සම්බන්ධව. ඒ පිළිබඳව විගණකාධිපතිතුමා ඉතාම නිරවුල්ව ඔහුගේ වාර්තාවක් ඉදිරිපත් කරනවා අපේ වත්කම් වලට වෙලා තියෙන විනාශය පිළිබඳව. ඒනිසා මේ ඉඩමත් දීර්ඝ කාලයක් තිස්සේ ඉතාම වටිනා ඉඩමක්. සැහෙන අභියෝග ගණනාවකට මුහුණ දෙමින් තමයි මේ ඉඩම ආරක්ෂාකරගත්තේ. විශාල අභියෝග ගණනාවක් මේ ඉඩමට ආවා. හැබැයි මේ ආයතනය සමත්වුනේ නැහැ මේ ඉඩමෙන් මේ දීර්ඝ වසර ගණනාවක් පුරා ජනතාවගේ ඵලදායිව මොකක්හරි සේවාවන් කටයුත්තකට යොදාගන්න. මා ස්තුතිවන්ත වෙනවා ප්‍රදේශයේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා නොවුනත් ඔහු මේ පිළිබඳව යම් අවධානය යොමුකරලා තියෙන එක හොඳයි. එකක් ඔහුට දැනෙන ඔහුගේ අවබෝධයට අනුව යෝජනාවක් මේ න්‍යාය පත්‍රයට ඉදිරිපත් කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒක හොඳද නැද්ද වෙන විවාදයක් තමන්ගේ භූමියේ සභාව සතු දේපලක් පිළිබඳව අවධානය යොමුකරලා තමන්ගේ දැනුමට අනුව යමක් ඉදිරිපත් කරන එක ඉතාම හොඳ එකක්. ඒනිසා ඒක මෙතන සංවාද කරලා කරන්නේ මොකක්ද කියන එක වෙන එකක්. නමුත් අපි ස්තුතිවන්ත වෙනවා ඔබතුමාට. ඒවගේම පලවෙනි ඉල්ලීම වෙනවා මේ ඉඩම ආරක්ෂාකරන ක්‍රියාමාර්ගයකට යන්න. අදත් මේ ඉඩම තියෙන්නේ අපිට ගියාම හඳුනගන්න පුලුවන් මට්ටමක නෙමෙයි. අපි හැමදාම කිව්වා මේක අඩුම තරමේ වැට මායිම් දාලා.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි,මායිම් ගලුත් දාලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි. මේ කාරණයේදි මම හිතන්නේ දැන් අපි වාහන පාර්කින් එක හදනවාට වඩා අපිට තියෙන ටික විවෘත කර ගැනීමත් වැදගත්වෙනවා. ඒනිසා අවුරුදු ගානක් මොරටුව නගර සභාව ඉදිරිපස තියෙන රථගාල අපිට තාම විවෘත කරගන්න බැරි වෙලා තියෙනවා. ඒනිසා මූලිකව අපිට තියෙන සම්පත් ටික අපි විවෘත කරනවානම් ජනතාවට ඒවා ආරක්ෂාකරගන්න කටයුතු කරන අතර මේ ඇනියාවට යන්න දෙන එක වලක්වලා මේක ඉක්මණට ජනතාවට පවරන්න කියලා ඉල්ලීමක් කරනවා.

මේ සභාව සතු වත්කම් පිළිබඳව මතුවෙච්ච නිසා මේ කාරණාව තුලින්ම අදවෙනකොට මේකට සමගාමීව අපිට තියෙන සමහර මම පෙරත් මතක් කරා මොරටුව මහ නගර සභාව සතු ළිං තියෙන ඉඩම් අද වෙකොට එක එක්කෙනාගේ තමන්ගේ අයිතිවාසිකම් තමන්ගේ වත්කම් තමන්ගේ දේපලට අඳාගැනීම් සිද්ධවෙනවා. ඒනිසා මම ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා මේවෙනකොට වත්කම් සම්බන්ධයෙන් වත්කම් ලේඛණයක් මම හිතන්නේ වුලරත්න මහත්තයාගේ මැදිහත්වීමෙන් වෙනදාට වඩා විදිමත් විදියට සිදු වෙනවා. ඒනිසා මේ වත්කම් පිළිබඳව අපිට තියෙන වත්කම් හරියට හඳුනගෙන ඒවා යම් කෙනෙක් අත්පත්කරගෙන තියෙනවානම් ඒ සම්බන්ධව කටයුතු කිරීම විශේෂයෙන් ළිං සම්බන්ධව නැවත නැවතත් මම මතක් කරනවා. ඒටික යාවත්කාලින කරන එකත් කරන්න. ඒනිසා අලුතින් ආරම්භ කරනවාට වඩා තියෙන ළිංටික ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,අපගේ ද සොයිසා ක්‍රිඩාංගනය ඉදිරිපිට වෙලෝනා ඉඩමෙහි නගර සභාව සතු බිම් කොටසෙහි එම ප්‍රදේශයේ ජනතාවට ආරක්ෂිත යතුරු පැදි පා පැදි රථ තබාගැනීමේ රථ ගාලක් ස්ථාපිත කරන ලෙස ඇති යෝජනාව කාලෝචිතයි. අද තියෙන ආර්ථික අපහසුතාවයක් මැද ජනතාව තමන්ගේ රැකියාවලට තමන්ගේ අවශ්‍යතාවයන් වලට මහමග ගමන් කරන කොට තමන්ට තිබෙන්නාවූ යතුරු පැදි හෝ පාපැදි ආරක්ෂිතව තබා තමන්ගේ ගමන ගමනාන්තය දක්වා යැමට පහසුවක් වෙනවා. ගරු නගරාධිපතිතුමනි මෙම ස්ථානය මොරටුවේ කටුබැද්ද මන් සංදියට ආසන්නව තිබෙන ස්ථානයක්. තවද ජාත්‍යන්තර ක්‍රිඩාංගනයක් තියෙනවා. මෙම ස්ථානයට අපගේ ක්‍රිඩා කිරීමට තරුණ තරුණියන්ට

සහභාගිවෙනවා. නමුත් එතුමන්ලා එතුමියන්ලා මෙම ස්ථානයට පැමිණෙන්නේ පාපැදියෙන් වෙන්න පුලුවන්. යතුරු පැදියෙන් වෙන්න පුලුවන්. නමුත් අපිට නිශ්චිත ආරක්ෂිත ස්ථානයක් නැහැ. ගරු නගරාධිපතිතුමනි මේ සම්බන්ධයෙන් අපිට පොදු දේපලක අපිට හිතුමතේ හිතෙන හිතෙන දේ කරන්න බැහැ. නමුත් මෙම සුදුසු ක්‍රියාදාමය කරන්න මෙම ස්ථානය මෙවැනි දෙයක් කරන්න හැකිනම් වඩාත් සුදුසු දේ තෝරාගෙන මෙම කටයුතු සාර්ථක කරගැනිමට පුලුවන්නම් මෙම කර්තෘව්‍ය කිරිමට මුලිකත්වය දෙන ලෙස මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි.ඇත්තටම දැන් මේ ඉඩම විවිධ අර්ථකතනයන් වලට ලක්වුනා. මේ ඉඩම සම්බන්ධයෙන් ඔබතුමාගේ නම පාවිච්චිවුනා නමුත් අපි කවුරුත් දන්නවා ඒ ඉඩම නගරසභාවට අයිති ඉඩමක්. එක ගැන දැන් කථාකරන්න මඩගහන්න පුලුවන් තත්වයක දැන් නැහැ. නමුත් දැන් මේ ඉඩමේ මෙතෙක් කාලයක් කිසිදු දෙයක් නොකර ඕහේ තිබුණා. එහෙම තිබෙන තත්වයක් තුල කවුරුත් යෝජනා කලේ නැහැ ඒ ඉඩමට අපි මෙහෙම කරමු මෙතනට මේ දේ කරමු කියලා. නමුත් මේ මොහොතේ රවි මන්ත්‍රීතුමා එතුමා මේ ඉඩම සම්බන්ධයෙන් මේ කරලා තියෙන යෝජනාව මම විශ්වාසකරනවා ගරු නගරාධිපතිතුමනි මේ වෙලාවේ ඉතා වැදගත්. මිට වඩා හොද දෙයක් කරන්න පුලුවන්නම් එක වෙන දෙයක්. නමුත් දැන් මේවෙලාවේ මේ ඉඩමට මේ කරපු යෝජනාව එකට අදාල කරන කාරණා අපේ සුරංග මන්ත්‍රීතුමා කිව්ව නිසා මෙවැනි රථගාලක් කියනවාට වඩා පාපැදි සහ යතුරු පැදි තමයි එකේ මූලික වෙන්න ඕනේ. මම හිතන විදියට අංගනයක් එහෙම දෙයක් කිරිම සම්බන්ධයෙන් එතුමා අදහස් දක්වපු නිසා මම වැඩිපුර අදහස් දක්වන්නේ නැහැ. මට කියන්න තියෙන්නේ මොකක්වත්ව නොකර ඉදලා ඉඩම අයාලේ ගිහිල්ලා ඊට පස්සේ අපි ඒකට මොකක්හරි කරනවාට වඩා අපේ අනන්‍යතාවය මහ නගර සභාවේ අනනයතාවය ස්ථාපිත කරන මෙවැනි යෝජනාවක් හෝ ඉදිරිපත් කිරිම ගැන මම කේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමාට මගේ ගෞරවය පුදකරනවා. අවුරුද 15ක් මේ ඉඩම නිකම් තිබුණු ඉඩමක් නමුත් කේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමා මේක දැකලා ඉදිරිපත් කරපු යෝජනාවට මගේ ප්‍රසාදය වගේම මගේ පක්ෂපාතිත්වයත් මම පලකරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සභාවට ඉදිරිපත්කරන ලද මගේ යෝජනාව සම්බන්ධව සභාවේ ප්‍රසාදයට ලක්කල සභාවේ ඉන්න ජෙෂ්ඨතම නාගරික මන්ත්‍රී නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රීතුමා සහ මගේ සහෝදර මන්ත්‍රීවරුන්ට පලමුව ස්තුතිවන්ත වෙනවා. ගරු නගරාධිපතිතුමනි අවුරුදු 15කට වැඩි කාලයක් වල් බිහිවෙලා මේකට ලස්සන ලස්සන අර්ථකතන දෙමින් හොදට මාර්කට් කරන්න තිබ්ච්ච ඉඩමක්. ඒකියන්නේ මේකට විවිධ නම් දිලා හොදට මාර්කට් කරපු ඉඩමක්. ඒක සභාව සතුයි කියන එක මුල සමස්ථ ජනතාවට මේක නගරසභාව සතු කියන දේපලක් කියන එක ඉස්මතුවිමේදි සමහර අපි දන්නවා යම් යම් තැන්වල යක්කු එලවන කොට යක්කු කුලප්පුවෙලා විවිධ දේවල් ඉස්මතු වෙනවා. මම හිතන්නේ මේක සභාව සතු දේපලක් කියන එක ජනතාව අතරට පත්විමම මම හිතන්නේ යම් කිසි ප්‍රශ්නයක් වෙන්න පුලුවන්. ගරු නගරාධිපතිතුමා ඒත් එක්කම මම කියනවා ගරු සුජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරා නගර සභාවට යම් බිම් කට්ටියක් පවරාගන්නේ සුභසාධනය යටතේ කියලා. ගරු නගරාධිපතිතුමනි මම කියන්න කැමතියි සාමාන්‍යයෙන් අපි ඒ ඉඩමේ ජිවත්වෙන වැසියන්ට සුභසාධනය කටයුත්තක් කරානම් එක එගෝල්ලන්ට විතරයි. නමුත් මෙම සුභසාධනය යෝජනා කරේ ගරු නගරාධිපතිතුමනි සමස්ථ මොරටු ජනතාවටත් ඒවගේම පිළියන්දල වෙන්නත් පුලුවන් මිට එහා වෙන්න පුලුවන්. නගරාධිපතිතුමා කටුබැද්ද මන්සංදිය කියන්නේ ප්‍රධාන මර්මස්ථානයක්. ඔතනට එක්ස්ප්‍රස් හෝල්ට් දෙකක් තියෙනවා දෙපැත්තේම. අපි දන්නවා මොරටුව ස්ටේශන් එකට ගියාම එක්ස්ප්‍රස් හෝල්ට් නැහැ. එතකොට කටුබැද්ද හංදිය කියන්නේ නුවර මඩකලපුව හැම පැත්තට යන බස් තියෙනවා. දකුණු පැත්තට යන බස් තියෙනවා පාරේ අනෙක් පැත්තේ අපේ මොරටුවේ ඉන්න අපේ මොරටුව කියන්නේ පුරෝගාමි නගරයක්. විශාල ජනගහනයක් ඉන්න නගරයක්. මේ මිනිස්සු ගරු නගරාධිපතිතුමා ගෙදරින් එළියට එන්නේ ත්‍රිවිල් එකක නැගලා. ඇවිල්ලා ලොකු ගානක් වියදම්කරලා කරන්නේ එහෙම නැත්නම් හදිසි අවශ්‍යතාවයකදි ගෙදර තියෙන වාහනයෙන් ඇවිල්ලා වෙලාව මදි නිසා වාහනයෙන්ම කොළඹ යනවා. නැත්නම් ගාල්ලේ යනවා. අනවශ්‍ය වාහන තදබදයක් ඇතිවෙන්නේ අනවශ්‍ය විදියට වාහන පාරේ ගමන් කිරිම තුලත්. නගරාධිපතිතුමා අපිට පුලුවන්නම් යතුරු පැදියක් හෝ පාපැදියක් මෙතන ගාල් කරලා ඒ මිනිස්සුන්ගේ වාහන අවශ්‍යතාවය සපුරන්න පුලුවන්නම් මම හිතන්නේ අපි සභාවක් විදියට එතුමා කිව්ව ජනතාවට

දෙන්න පුලුවන් උපරිම සුහසාධනය දෙන්න පුලුවන් බව ඔප්පුකල හැකියි කියන යෝජනාව මා නැවතත් සභාවට ඉදිරිපත් කරනවා.

__ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රීවරුනි, ඛේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් මම හිතන්නේ විධිමත් පරිදි කර්මාන්ත කමිටුවෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. විශේෂයෙන් මම හිතනවා මේ යෝජනාවේ අර අපේ ඛේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමාත් සුරේශ් ඉන්දික ගරු මන්ත්‍රීතුමාත් කථාකරපු ඒකේදි මම හිතනවා ඒක පොඩ්ඩක් හරියට මතුවෙනවා කියන එක දැනෙන්නේ ඒ පිළිබඳව අවබෝධයක් තිබුණු අයට විතරයි. තිලකසිරි මන්ත්‍රීතුමාලාට ඔසද මන්ත්‍රීතුමාට එතකොට ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට එකපාරටම දැනුනා. මොකද 2011 පලාත් පාලන මැතිවරණයේදි කැලෑ පත්තරයක සහ පෝස්ටර් වල තිබුනේ වෙලෝනා ඉඩම සමන්ලාල් ලියාගෙන ඔහොම තමයි කැලෑ පත්තර ගැහුවේ අද සජබේ යයි කියන්නාවූ යූඇන්පි පලාත්සභා මන්ත්‍රීවරයෙක්. මොරටුව දෙවනත්කරගෙන කිව්වා අන්න සමන්ලාල් පොදු කටයුතු සඳහා වෙන්නාවූ ඉඩම ලියාගෙන කියලා. මේක තමයි ඉඩම. ඒක නිසා ඒ ඉඩමේ අද මේවැනි වූ කාර්යයක් කරන්න පුලුවන්වෙන 5%,10% ඉඩම්වලින් ගන්න පුලුවන් වෙන තත්වය ගත්තේ බොහොම අමාරුවෙන්. ඒනිසා විශේෂයෙන්ම එම යෝජනාව බෝහොම හොඳ යෝජනාවක්. සභාවට තාවකාලික ඕන දෙයක් කරන්න පුලුවන් සභාවට. හැබැයි ඕකේ ස්ථිර ගොඩනැගිලි ගහලා එහෙම කරන්න බැහැ. නිකම් පොඩි ටකරන් මඩුවක් වගේ ගහලා ඔය කියන වැඩෙ කරන්න අපිට ඉඩකඩ තියෙනවා. එකට තමයි අපි කරනවානම් කරන්න ඕනේ. එක අපි කමිටුවේදි සාකච්ඡා කරමු.

**අංක 05 (01) දරණ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

__ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රීවරුනි, අංක 05(01) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(02) මහා නගර සභා මන්ත්‍රී, රවිනාත් ජේ. ගුණසේකර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

“මොරටුව, ඉඩම, මවුන්ට් විලා යන නමින් වසර ගණනාවක් භාවිතා කළ මාර්ගය අංක 9/19 මවුන්ට් පාර සඳහන් නිවසින් පටන් ගෙන, අංක 114 මවුන්ට් විලා, ඉඩම යන ස්ථානයෙන් අවසන් වන මාර්ගය “මවුන්ට් විලා ටෙරස් ” ලෙස නම් කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරන්නීය.”

මහ නගර සභා මන්ත්‍රී සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**අංක 5(02) දරණ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

__ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රීවරුනි, ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

## 06 __2022 සැප්තැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලිම.__

**06(01) 2022.09.05 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

__මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා__

ගරු නගරාධිපතිතුමනි, මේ කමිටුවේ අපි ජනතා විමුක්ති පෙරමුණ විදියට 02(3) 02(4) සහ 04 කියන කරුණුවලට විරුද්ධයි. ඒවායේ පදනම අපි මීට කලිනුත් සඳහන් කරලා තියෙනවා. අපි විරුද්ධවෙන පදනම නැවත නැවත කියන්නට අවශ්‍ය නැහැ.

__මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය__

ගරු නගරාධිපතිතුමනි, 2(3) කරුණ සම්බන්ධයෙන් මේකේ ඇමුණුම 3 කියලා වාර්තාව සඳහන් වුනාට ඇමුණුම 3ක් නැහැ මේ වාර්තාවේ. ඒ ඇමුණුම 3 ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඇමුණුම 3 නැතිව මේ සම්බන්ධයෙන් සාකච්ඡාකරන්න ඇත්තටම බැහැ. මොකක්ද කමිටුවේ තීරණය එදා මම කියනවා ඒ කමිටුවට මම සහභාගිවුනා. ඒ කමිටුවට සහභාගිවුනාම දෙවෙනි කරුණ පලවෙනි කරුණ මම ඒ අවස්ථාවේ ප්‍රකාශකරපු දෙයක් තමයි. මම විතරයි එතන විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට හිටියේ. එතකොට ඔබතුමා ඒ අවස්ථාවේ ගත්ත සමහර තීරණය සම්බන්ධයෙන් මගේ විරෝධතාවය ප්‍රකාශකරා. ඔබතුමා කිව්වා ඒ වෙලාවේ සටහන් කරගන්න විදියක් නැහැ කියලා මන්ත්‍රීවරු අනෙක් අය එකග වෙච්ච නිසා. හැබැයි මගේ මතකයේ හැටියට නගරාධිපතිතුමා දෙවෙනි කරුණ කියන එක ඒ විදියට සාකච්ඡාවුනේ නැහැ. ඒ හින්දා එතන පොඩි ගැටලුවක් තියෙනවා. ඇමුණුම 3කියන එක මේ අවස්ථාවේ මෙතන ලබා දීලා නැතිනිසා මේ ගැන වැඩිය කථාකරන්න බැහැ. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඇමුණුම 3ත් මේකට ඇතුලත් කරලා මේ යෝජනාව ඊලග වාර්තාවට ඉදිරිපත් කරන්න කියලා. නගරාධිපතිතුමනි මම කියනවා සභා සේවකයන් සම්බන්ධයෙන් ගත්ත විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අගතියට පත් සේවකයින් සිටි නම් ඔවුන් විසින් ඉදිරිපත් කල අභියාචනා සැලකිල්ලට ගෙන එම විනය ක්‍රියා මාර්ග නැවත සමාලෝචනය කිරිම සහ නිදෝස් සේවකයන්වේනම් ඔවුන් වෙත පනවා ඇති දඩුවම ඉවත් කිරිම මෙය කරණවානම් එක්කො විනය කමිටුවක් තියෙනවානේ. ඒ විනය කමිටුව හරහා කරන්න ඕන නැතිව එය පත්වෙච්ච කමිටුවට මේවගේ තීරණයක් ගැනිම සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා. එතකොට මේ විනය කමිටුව හරහා ද තින්දු තීරණ ගන්නේ අවසානයේ දි 5-09වන දින සේවකයින් ගියානම් ඒ ගියේ සභාවේ කාලය සම්බන්ධයෙන්. එතකොට නිවාඩු අනුමත කරලාද නැද්ද ඒ සම්බන්ධයෙන් යම්කිසි වාර්තාවක් තියෙනවා. වාර්තාවයි කරුණු මත පදනම් වෙලා තමයි තින්දු තීරණ ගන්න ඕනේ. අපි මෙතන සේවකයන්ට නෙමෙයි යම්කිසි දෙයක් කරනවානම් විද්‍යාත්මක පදනමක ඇතිව ඒ දේ කරන්න ඕනේ. ඔබතුමා මෙහෙම යෝජනාවක් දැම්ම මම හිතනවා වැරදි කියලා. එතකොට මේක සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වය ප්‍රකාශකර සිටිනවා. වාර්තාව නැතිව මේ සම්බන්ධයෙන් වැඩිදුර කථාකරන්න බැරි නිසා ඊලග කමිටුවට ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාට කියනවා. මේක සම්බන්ධයෙන් අපේ විරෝධතාව ප්‍රකාශකරනවා. මේ විදියට නිදෝස් සේවකයන් වේනම් ඔවුන් වෙත පනවා ඇති දඩුවම් ඉවත් කරනවානම් ඉවත් කරන්න ක්‍රමවේදය මොකක්ද කියලා සඳහන් කිරිම ඇත්තටම වැදගත්.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ඇමුණුම නැතිනිසා මේක අපි පසුවට කල් දැම්ම කරන්න පුලුවන්. හැබැයි ඔබතුමිය අර කියන එක අපි හිතමු යෝජනාවක් ඉදිරිපත්කරනවා රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා පාරක නමක් නම් කරන්න. එතුමා තියෙන ඉඩමට තව යෝජනාවක් ඉදිරිපත් කරා. මේක කමිටුව තමයි. ඒනිසා කමිටුවට ගිහිල්ලා තමයි ගන්නෙ. එක එදා කමිටුවට ගත්තාට පස්සේ මේක කරන්න ඕනේ විනය කමිටුවකින්. ඒක අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. ලියන්න ඕනේ නැහැ. ඒවා නියමිත විදියට කෙරිලා නැත්නම් එක ගැන කථාකරන්න. ඔබතුමියට ආයේ පුලුවන් ඒ ඇරෙන්න කෙරෙන්නේ මොකක්ද කියලා ඔක්කොම මේ වාර්තාවට ගන්නේ නැහැ. එහෙම කරන්න පුලුවන්කමක් නැහැ. ඒක මේ අංජනම් එළි අරින්නත් බැහැ එවා ලියන්නත් බැහැ. එහෙම කරන්න ගියෝත් සභාවල් කරන්න හම්බවෙන්නේ නැහැ. ඒ සියලු දේ නිවැරදිව කරලා නැත්නම් ඒ වාර්තාව ගෙනල්ලා සභාව අභියෝගයට ලක්කරන්න පුලුවන්. එක වෙනමයි ඒ ඇරෙන්න මේකේ කරන ක්‍රම තියෙනවා. ඔවුන්ට නිදොස් කරන්න තියෙන අය නිදොස් කරනවා. නිදොස්කරන්නේ විනය කමිටුවකින් නෙමෙයි නම් සමන්ලාල්නම් ඒක අභියෝගයට ලක් කරන්න. ඒතකොට විනය කමිටුවක් දාන්න වෙනවා තාම එක ලක්වෙලත් නැහැ. ඊයේ දිනයේදිත් ඇවිල්ලා විනය කමිටුවක් පත්කරනවා කියලා විනය කමිටුවට ගෙනවා කියලා කියනවා. විනය කමිටුවට අභියාචනා ගොඩක් දීලා තියෙනවා. තාම ඒක වුනේ නැහැ එක වෙයි එහෙම.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මේකේ තියෙන්නේ මහා සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරනවා කමිටු තීරණය අනුව ඉදිරිකටයුතු සිදුකිරිමටත් තීරණය කරයි මේක තීරණයක්.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ඉදිරිකටයුතු කියන්නේ මේ දෙකක් තියෙන්නේ දාලා. ඒ ඉදිරිකටයුතු කියන්නේ ඒවා අනුව කරන්න කියලා එහෙම නැතිව ඉදිරිකටයුතු කියන්නේ එදාගත්තතින්දුව ක්‍රියාත්මක කරන්න නෙමෙයි. ඒනිසා එක වරදවා වටහා ගන්න යන්න එපා. මේකේ කාටවත් දෝෂාරෝපණයක් නෙමෙයි තියෙන්නේ. මේකේ තියෙන්නේ ඒ පරික්ෂණය කරන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ආයතන කමිටුවේ අංක 3 පිළිබඳව අවධානය යොමුකරනවා. දැන් මේ තුන යටතේ අපි ෂැඩෝවෝච් ආරක්ෂණ සේවයේ පුද්ගලික සමාගම එක්ක අපි ගහපු ගිවිසුමකින් කටුබැද්ද පොලට අදාල ආරක්ෂක සේවා සපයන්න ඒ ගිවිසුම්ගත වෙලා දැන් ගරු නගරාධිපතිතුමනි මේ අයිතමයේ කියනවා ඒ ගිවිසුමේ කොන්දේසිය අනුව අනුමත ගාස්තු ප්‍රකාරව කටුබැද්ද ද සොයිසා ක්‍රිඩාංගනය සහ විරපුරන් අප්පු එළිමහන් රංගපියය රථවාහන අංගනය සඳහා පහත සඳහන් පරිදි ආරක්ෂක සේවා සපයාගැනිමට සහා අනුමැතිය ලබා ගැනිම. දැන් අර ගිවිසුමේ අපි එකග වේච්ච මිල ගණන් සහ ඒ කොන්දේසිවලටම යටත් කරලා සොයිසා ක්‍රිඩාංගනයට සහ රථ වාහන අංගනයට දිවා මුර රාත්‍රි මුර. දෙකයි ඒ කියන්නේ විරපුරන් අප්පු එළිමහන් රංගපියයට එකයි ඔක්කොම තුනයි. ඒ කියන්නේ අපි අලුතින් පුදුගලයෝ ගන්නවා නෙමෙයි අර අයගෙන් ඉල්ලිමක් කරනවා මේ ස්ථාන දෙකත් අර පදනම යටතේම ආරක්ෂාකරලා දෙන්න. එතකොට දැන් ගරු නගරාධිපතිතුමනි සොයිසා ක්‍රිඩාංගනයට අදාල අපි දාලා තියෙන යොදවලා තියෙන අපේ ආරක්ෂක සේවයේ අපි දාලානේ තියෙන්නේ. ඊට අමතරවද අපි මේ ගන්නේ දැන් මේ ආරක්ෂක සේවය සභාව විදියට අපේ ආරක්ෂක සේවය ආරක්ෂාව දෙනවා මේ ස්ථානයේ. එක හොඳද නරකද කියන එක වෙනම තර්කයක්. දැන් අපි මේ පෞද්ගලික එකෙන් අරගෙන දානවා මෙතනට. දැන් එතකොට මේ දෙක අතර කොහොමද හඳන්නේ අපේ ආරක්ෂක සේවාව.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා අපේ ආරක්ෂාවයි ඒ ආරක්ෂාවයි දෙකම තියන්නේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ දෙන්නෙක් ඉන්නවා එගොල්ලන්ට පැවරිච්ච රාජකාරියක් තියෙනවා.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එතකොට අපි අයින්කර ගන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එගොල්ලන්ව අයින් කර ගන්නවා.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අයින් කරලා අපිට දැන් සේවා ස්ථාන ලබා දිමට ස්ථාන ප්‍රමාණයක් ලොකුවට තියෙනවා. ඒ ස්ථාන වලට යොදවලා ඔවුන්ගෙන් ඒ සේවාව ගන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,එගෝල්ලන්ට අදාල මොනවාහරි නිශ්චිත කාරණා සටහන් කරපු දෛනික මොනවා හරි ලේඛනයක් රාජකාරිමය ලේඛනයක් දෙනවාද ඒගොල්ලෝ කලයුතු කාර්යය මොනවාද කියලා. මොකද අපි ගියාට පස්සේ අපිට දැනෙන්නේ නැහැ මොකක්වත් නිශ්චිත කාර්යයක් ඇතුලේ නෙමෙයි එගොල්ලෝ එගොල්ලන්ගේ රාජකාරිය කරන්නේ කියන එක.

<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,නිශ්චිතව රාජකාරි ඒ අදාල වෙන්නාවූ මුරකුටියේ රාජකාරි මොනවාද කියන එක සදහන් කිරිමක් කරන්නම්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,ඒ වගේම සමහර ස්ථාන වල අපේ වැටුප් ලබන මුරකරුවන් කියන අය විවිධ අය ඉන්නවා හැබැයි ඒ අදාල ස්ථානයේ ඉන්න අය දන්නේත් නැහැ. මුරකරුවාව දැකලත් නැහැ. එහෙම තැන් තිබෙනවා. ඒනිසා මේ විවේචන පැත්තෙන් ගත්තෝත් ගොඩක් තියෙනවා. නමුත් මේවා හොයන්න මහජන මුදල් ගනිමින් වෙන වෙන විවිධ රැකියා කරමින් අඩුම තරමේ එක දිනක් ආසාවට එන්නේ නැතිව වැටුප් ලබන අය ඉන්නවා. ඒනිසා මේවා හොයන්න.

<u>**ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මොකද මගේ සහෝදර මන්ත්‍රීවරුත් හැමදාම මේ කථාව කියනවා. ගරු කොමසාරිස්තුමා මොන වෙලාවකවත් දැන් අපි ඔබතුමන්ලාට මේ සේවාව කරන්නේ මෙය අද කරන්නේ නැහැ කමක් නැහැ ඔන්න ඔහොම නොකර හිටියට කමක් නැහැ කියලා කවදාවත් එහෙම අදහසක් අපි ඔබතුමන්ලාට ජීවිතේටවත් දිලා නැහැ. දෙන්න අදහස් කරන්නෙත් නැහැ. ඒක නිසා මේක ගරු ලේකම්තුමාගේ භාරව තියෙන නිසා මම හිතන්නේ විදිමත් මොකක්හරි වැඩසටහනක් හදලා මේ මුරකරු කියන එකනම් මුරද කියන එක ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මොර වගේ වෙන්න ගිහිල්ලා තියෙන්නේ ඒක නිසා ඒ සම්බන්ධයෙන් අපිට ගැටලු කිහිපයක් තියෙනවා. ඔබතුමන්ලාගේ දැඩි අවධානය යොමු කරලා ඔය ස්ථානයන්වල තියෙන්නාවූ සේවාව මොකක්ද? අපි කියමු උදාහරණයකට මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා ආණ්ඩු පක්ෂයේද විපක්ෂයේද නෙමෙයි මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා බලනවා මොකක්ද මේ සේවාව ඔවුන්ට භාරදිලා තියෙන රාජකාරිය. උදහරණයකට ඊයේ පෙරේදා ලුනාවේ මන්ත්‍රීරුවේ ත්‍රිවිල් එකක් යනවා ඇවිදින මන්ත්‍රීරුවේ ගිහිල්ලා ත්‍රිවිල් එක ඇතුලේ තියෙනවා. එතකොට මිනිස්සු කම්ප්ලේන් කරනවා කම්ප්ලේන් කරනකොට දිලා තියෙන ඩියුටි ලිස්ට් එක තිබුණානම් පාරේයන කෙනෙකුට හරි කියන්න පුලුවන් මොකක්ද අර කරන්නේ කියලා. ඒ අයිතිය දෙන්න ඕනේ ඒ මිනිස්සුන්ගේ බදු සල්ලිවලින් තමයි මේ ඔක්කොම අපි කරන්නේ. ඒකනිසා ඉස්සර ඔය කොන්ත්‍රාත්කරුවෙක්ගේ කොන්ත්‍රාත් එකක් දුන්නාම කොන්ත්‍රාත්එකට ගල් කොච්චරද තාර කොච්චරද වැලි කොච්චරද ඔක්කොම බලන්න මොකක්හරි එකක් තියෙනවා. අන්න එවගේ මම හිතනවා මේකටත් එහෙම එකක් තිබුණාට කමක් නැහැ. හිතවත් කමට මිත්‍රශිලිකමට රස්සාවල් දුන්නා හොරකම් කරන්න රස්සාවල් දෙන්න, වැඩට එන්නේ නැතිවෙන්න රස්සාවල් දිලා නැහැ කවුරුවත්. ඒනිසා මේකනම් මම හිතන්නේ ලොකු බරක්දාලා ගරු කොමසාරිස්තුමා නිලධාරින් එකතුවෙලා මේක කරන්න දේපල ආරක්ෂාකරගැනිම සදහා බදු මුදල් වියදම් කරලා දේපල ආරක්ෂා වෙන්නේ නැත්නම් ප්‍රශ්නයක්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ. ගුණසේකර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,අංක 4 සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒකේ තියෙනවා සේවකයින්ගේ කාලය දිර්ඝකිරිම සම්බන්ධව. එයට විරුද්ධත්වයක් නැහැ. නමුත් ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි මට ආරංචිවුනා වෝකින් ටැක් එක එතරම් පිරිසිදු භාවයක් නැහැ. මේන් ටේනස් එච්චර හොද නැහැ කියලා. මම ගියේ නැහැ. ආරංචි වෙච්ච දෙයක්. ඔබතුමාගේ අවධානයට යොමුකරනවා මේතන සේවකයින් 36ක් ඉන්න නිසා ඒ ගැන පොඩ්ඩක් බලන්න ඊට අමතරව රාත්‍රිකාලේ ඇවිදින කට්ටියට ඒ ට්‍රැක්එක වටේ ලයිට් වැඩ කරන්නේ නැහැ. මම පෙරේදා රෑ ඒ පැත්තේ ගියා නමුත් ලයිට් වැඩකරේ නැහැ. එකත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

<u>**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා,ලයිට් වැඩකරන්නේ නැහැ පොඩි ප්‍රශ්නයක් නිසා හොරු වයර් ගලවගෙන ගිහිල්ලා. මේවෙනකොට අදාල විවෘත කිරිම තාම නොකරපු නිසා ඉංජිනේරු සංස්ථාව තමයි මේ ව්‍යාපෘතිය කලේ. ඔවුන් වෙත අපි ගිය සතියේ ගිහිල්ලා කරුණු දැක්වූවා මමයි කොමසාරිස්තුමයි අදාල කරුණු දැක්විම කලා දැන් ඒකෙදි අධ්‍යක්ෂක ජනරාල් පවා පිලිගත්තා ඒ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒවා කරලා අපිට භාර දෙනවා කියලා ඒනිසා ඒ අදාල සියලු කටයුතු කරාට පස්සේ අපි මේවෙනකොට යම් ප්‍රමාණයකට ඒකේ

කටයුතු සිදුවෙන ප්‍රමාණය අතිශයින්ම පිළිගත යුතු මට්ටමට පත්වෙලා නැහැ. ඒනිසා ඒ කරුණු සියලු දේ හෙට අනිද්දා වෙනකොට සිදුවේවි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අවුරුදු 18ක් විතර මේ සභාව අපි නියෝජය කලා. හැබැයි ඒ කාල සීමාවේ නොවිච්ච විදියට සිදුවීම් දැන් සභාව තුල සිදු වෙනවා. දැන් මේ සභාවේ අපිට කථාකරන්නත් භයයි පිස්තෝලයක් එහෙම ඉල්ලලා තියෙන්නේ. ඒනිසා කාට කොකා ගස්සන්නද දන්නේ නැහැ. පිස්තෝලය ඉල්ලා තියෙන්නේ. ඒනිසා පොඩ්ඩක් පරිස්සමින් කථාකරන්න ඕනේ. ගරු නගරාධිපතිතුමනි අවුරුදු 17ක් නැති පිස්තෝලයක් දැන් ඉල්ලනකොට අපි ඉන්නේ භයෙන් කොයිවෙලාවේ ගස්සයිද කියලා දන්නේ නැහැ. අපේ ජීවිතවලට තර්ජන තියෙනවා. ඒකයි අපි කිව්වේ. ඒනිසා අපි භයයි අපි චණ්ඩියෝ නෙමෙයි බොහෝම අහිංසක මිනිස්සු. ඒනිසා ගරු නගරාධිපතිතුමනි මේ ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන කොට කාරණාවක් මම දකිනවා මන්ත්‍රී කෙනෙක් හැටියට ඕනැම මන්ත්‍රීකෙනෙකුට තියෙනවා අයිතියක් තමන් මේ සභාව නියෝජනය කරනවානම් සභා වාර්තාවේ හෝ මේ ආයතනයතුල යම් කිසි සිදුවීමක් තියෙනවානම් ඒ සිදුවීම සම්බන්ධයෙන් තමන්ගේ අදසහ ප්‍රකාශකරන්න මේ සභාවතුල අයිතියක් තියෙනවා. එක අභියෝගකරන්න කාටවත් බැහැ ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මේ සභා වාර්ථාවේ තියෙන කරුණ අපි උකහාගෙන කතා කරනකොට නගරාධිපතිවරයාගේ හිතේ තියෙන ඒවා කියලා අනෙක් මන්ත්‍රීවරුන්ව අපහසුතාවයට පත් කරන්න එපා. මෙහි පැහැදිලිව 02(03) දෙවැනි කරුණේ 2022.05.09 සභා සේවකයන් සම්බන්ධව ගත් විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අගතියට පත් සේවකයන් සිටීනම් ඔවුන් විසින් ඉදිරිපත් කළ අභියාචනා සැලකිල්ලට ගෙන එම විනය ක්‍රියාමාර්ග නැවත සමාලෝචනය කිරීම හා නිදොස් සේවකයන් වේනම් ඔවුන් වෙත පනවා ඇති දඩුවම් ඉවත් කිරීම. ඉතින් මෙහි ප්‍රශ්නයක් නැහැ, ප්‍රශ්නය තියෙන්නේ මෙය කරන්නේ කවුද මේ කමිටුව කවුද කියලා මේ සභාවට කියන්න.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාඅවුරුදු 16ක් මේ සභාවේ හිටියා කියලා කියනවා, මහා නගර සභාවේ විනය කමිටුවක් තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,විනය කමිටුවක් තියෙනවා නමුත් ඒක තියෙන්න ඕනෑ මන්ත්‍රීවරුන්ගේ ප්‍රධානත්වයෙන් නෙවෙයි, මේ විනය කමිටුව තියෙන්න ඕනෑ නාගරික කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන්, අපි කියන්නේ මෙහි පැහැදිලිව කියලා නැහැ කවුද මේ කමිටුව කරන්නේ කියලා, ඉස්සර වාර්තාවල තිබුණා දැන් මෙහි තියෙන්නේ මන්ත්‍රීවරුන්ගේ නම්.

**(සභාවේ සෝෂා)**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දාපු යෝජනාව ගැන මම දිගින් දිගටම කතා කළා, ගරු නගරාධිපති සමන්ලාල් මහතා ඉදිරිපත්කර ඇති සභාවේ රඳවා තබා ගත් බුදුපිළිම වහන්සේ සම්බන්ධයෙන් වූ පහත ලිපිය සලකා බැලීම. එහි නැවත වාර්තාවක් ලැබිලා තියෙනවා මම හිතන්නේ නගරාධිපතිවරයා ආපු වාර්ථාව සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්නේ නැතුව ඇති, උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ සම්බන්ධයෙන් විධිමත් හා සවිස්තරාත්මක වාර්ථාවක් කමිටුවට ඉදිරිපත් නොවූ බැවින් විධිමත් හා සවිස්තරාත්මක වාර්ථාවක් මිළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස නාගරික කොමසාරිස්වරයාට කමිටුව විසින් දන්වා සිටින ලදි, මෙහි තියෙන්නේ එවපු වාර්ථාව සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්නේ නැහැ ඒ නිසා මෙය විධිමත් ලෙස එවන්නලු, මම අහන්නේ ගරු නගරාධිපතිතුමා, මේ බුදු පිළිමය දුන්න එක සම්බන්ධයෙන් මොකද්ද මේ විධිමත් පරීක්ෂණයි, මොකද්ද මේ ප්‍රශ්නේ මෙය ප්‍රශ්නයක්ද? මේ බුදු පිළිම වහන්සේ නිදහස් කරපු එක මහා ලොකු ගැටළුවක්ද සභා වාර්ථාවකට දාලා, මෙහි යටි අරමුණ මොකද්ද?

ගරු නගරාධිපතිතුමනි, ප්‍රශංසාවක් කරන්න තියෙනවා. මේ 02(03) පළවෙනි කරුණ සම්බන්ධයෙන් මගේ පූර්ණ එකඟතාවය ප්‍රකාශ කරනවා මොකද 2022.05.09 දින සභාවට එල්ලවූ ප්‍රහාරය ඊට සම්බන්ධවූ පුද්ගලයින් හා එම ප්‍රහාරය හේතුවෙන් සභාවට සිදු වී ඇති හානිය සම්බන්ධව ක්‍රියාත්මක

පරික්ෂණ පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බැවින් ඒ සම්බන්ධව විධිමත් පරික්ෂණයක් අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලෙස පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටිනවා. මේ ආයතන කමිටුවේ සියළු දේට මම විරුද්ධයි. අන්න ඒ කරුණට පමණක් මම එකඟයි. ගරු නගරාධිපතිතුමා, මේ 02(4) කරුණට ඔබතුමා දාලා තියෙන එකේ යටි අරමුණ ඔබතුමා පැහැදිලි කරන්නකෝ මෙය පැහැදිලි නැහැ බුදු පිළිමේ දුන්නනම් දුන්නේ කාටද කියලා කිවුවා නම් මේ ප්‍රශ්නේ ඉවරයිනේ එතනින් එහාට මොනවද මේ සවිස්තරාත්මක විස්තරයි පැහැදිලි කිරීම් කරන්නයි. ගරු නගරාධිපතිතුමා, මේ නඩු සම්බන්ධයෙන්,අපේ හිතවත් පොහොට්ටුවේ එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න මගේ සහෝදර මන්ත්‍රී තුන්දෙනාට කියන්නේ ඔය මුදල් කමිටුවට කඩේ යනකොට පරිස්සමෙන් හේතුව දැන් යන විධිය හොඳම නැහැ මොකද අපි මේවා සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගන්නවා, මේ සම්බන්ධයෙන් සමන්ලාල් ප්‍රනාන්දු කියන පුද්ගලයට පෞද්ගලිකව පැවරිච්ච නඩු වලට නගර සභාව සල්ලි ගෙවනවා. ඒ ගෙවන්නේ මේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ අත් ඉස්සීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ නිසා අපි දන්න විදියට අධිභාරයන් පැනවෙනවා ඒවට ගෙවන්න ලෑස්තිවෙලා තමයි ගරු මන්ත්‍රීවරුන් මේවට අත් ඔසවන්න ඕනෑ. මේ මොරටු ජනතාවගේ සල්ලි මේවා කරන කලට පව් මිහිරිය මී සේ, විදින කලට දුක් දැඩිවෙයි ගිණි සේ කියලා තමයි මට කියන්න තියෙන්නේ. සමන්ලාල් ප්‍රනාන්දුට මේවා ගෙවන්න වෙනවාමයි ඒක පැහැදිලියි. සමන්ලාල් ප්‍රනාන්දු කියන්නේ දැන් යමක් කමක් තියෙන මනුස්සයෙක්නේ. මොකද්ද මේ ලැජ්ජ නැති වැඩේ. පුද්ගලික නඩු වලට මේ නගර සභාවට කියලා සල්ලි ගෙවා ගන්න ලැජ්ජා නැද්ද, ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඕනෙ නම් එක උදාහරණයක් කියන්නම් නගරාධිපතිවරයාට හිතෛෂී පුද්ගලයෙක් ඇවිත් කියනවා මේ අපේ පාර කට්ටියක් පාවිච්චි කරනවා කියලා, මහා නගර සභා අඥා පනතේ කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව සමන්ලාල් ප්‍රනාන්දු කියන පුද්ගලයා නගරාධිපතිධුරය උපයෝගී කරගෙන එය අයතුලෙස භාවිතා කරමින් ගිහිල්ලා ගේට්ටුව හරස් කරලා ගහනවා තාප්පයක් එකට ඒ මිනිස්සු උසාවි යනවා ඒ නඩුවට නගර සභාව පොදු මහජන මුදල් ගෙවනවා එක්ලක්ෂ ගාණක් ගුණසිරි හේවගේ නීතිඥතුමාට ගෙවීම් කරලා තියෙනවා මේ වාර්ථාවේ එක තිබුණා. මම අහන්නේ මේක නගර සභාවට අවශ්‍ය දෙයක්ද,මේ සංඝික දේපල, මහජනතාවගේ දේපල මිනිස්සු එකවේලක් කන්නේත් බොහෝම අමාරුවෙන් ළමයෙක්ට මාළු කෑල්ලක් මස් කෑල්ලක් ලැබෙන්නේ කලාතුරකින් ඒ නිසා කරුණා කරලා මේ ලැජ්ජ නැති වැඩ කරන්න එපා. මේ මිනිස්සුන්ගේ මුදල් කාබාසිනියා කරන්න එපා. මම පැහැදිලිව කියනවා මේ නඩු වලින් 80% නගරාධිපතිවරයාට පෞද්ගලිකව බලය අධික්‍රමණය කිරීම නිසා පැවරිච්ච නඩු, ඒ නිසා මේ නඩු වලට මොරටුව මහජනතාවගේ මුදල් වැය කරන්න එපා කියන ඉල්ලීම කරනවා.02(03) පළවෙනි කරුණ හැර අනික් සියළු කරුණු වලට මම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එහෙම කරන්න බැහැ ඇතුලේ තියෙන එක කරුණකට විතරක් කැමති කියලා තින්දුවක් ගන්න බැහැ, අවුරුදු 16ක්ම ගත්ත නැති එකක් දැන් ගන්න බැහැනේ. ගරු නිරෝෂන් මන්ත්‍රීතුමා, ගරු සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා කාරණයක් කිව්වනේ පාරකට තාප්පයක් බලෙන් බඳින්න ගිහිල්ලා කියලා, ඔබතුමා හෙට මට නඩු 03ක් දැම්මත් මම පාරවල් හැදීම සම්බන්ධයෙන් පෙනී සිටිනවා එක හේතුව ඔබතුමාගේ ඔය පාර හැදුවේ කට්ටියම ඔය පාර හදනවට කැමති කියපු නිසා, නැත්තම් මම පෙනී සිටින්නේ නැහැ. හෙට මට නඩු දෙකක් දැම්මත් තුනක් දැම්මත් මම පෙනී සිටිනවා. ඒ මගේ වගකීම නිසා, හැබැයි ඔබ ඔබේ ගෙදරට එහා පැත්තේ ඔබට අයිති නැති පාරකින් ප්‍රවේශය ගන්න යනවනම් එක කරන්න එපා කියලා කොන්දේසි දාලා අනුමත කරලා තිබුණා නම් මම ප්ලෑන් එකක් එ මිනිස්සුත් මේක දීලා නැත්තම් නගර සභාවට ඔබතුමාට මම ප්‍රවේශය ගන්න දෙන්නේ නෑ. ඒ මිනිස්සුන්ට මම දීලා තියෙනවා කොන්දේසියක් මේ මාර්ගයෙන් ප්‍රවේශය ගන්න බැහැයි කියලා. ඒක නිසා මම ඔබතුමා වෙනුවෙන් පෙනී සිටින්නේ ඒ මිනිස්සු මෙයට කැමති වුණ නිසා. මේ දුරදාරිත්වයෙදි වැඩ කරද්දි මට නඩු කියක් වැටුනත් මේවා නවත්තන්නේ නෑ. නවත්තන්න මිනිස්සු මට ඡන්දේ දීලත් නැහැ. මම ප්ලෑනින් කමිටුවේ සභාභපතිවරයා විදියට යම් පුද්ගලික ඉඩමක් කොටස් වලට කැඩුවම ඔවුන්ට විතරයි ඒ පාර කියලා තියෙන එකක, තව කෙනෙක් එක ගන්නකොට මම එක දුන්නොත් ඔවුන් පස්සේ මාව ගෙනියනවා මානව හිමිකම් ඒක වෙනම ප්‍රශ්නයක්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා මෙයට උත්තර දෙන්න පුළුවන් මට අවශ්‍යනම්.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා අවශ්‍ය නැහැ මට උත්තරයක්, බොරුව ඇත්ත උසාවියෙන් තීරණය කරයි මට අදාල නැහැ. ඒනිසා, ඔය බොරුව කියයිනේ අධිකරණයට, ගරු සේනක දමයන්ත මන්ත්‍රීතුමා කියවලා ගියා අනවසර ඉදිකිරීමක් කැඩුවේ නැහැ කියලා.

**(සභාවේ ඝෝෂා)**

එතුමා කියපු විදියට අනවසර ඉදිකිරීමක් තියෙනවා කියනවනම් මම එකට මට නඩුවක් වැටෙයි කියලා පෙනි සිටින්නේ නැතිනම් ඒ වෙනුවෙන් මිනිස්සු මට මොකටද ඡන්දය දීලා තියෙන්නේ. මම මෙතන ඉන්න අන්තිම දවසටත් මේ දේවල් වෙනුවෙන් පෙනී සිටලා තමයි යන්නේ

**2022.09.05 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දූ නිරෝෂන මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 27 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 28 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 29 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2022.09.05 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

**2022.09.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ අංක 2(03),02(04) සහ අංක 04 යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් කරුණු වලට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සදහන් මන්ත්‍රීවරු සභාගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ඒල්.සේනක දමයන්ත ද සිල්වා මහතා) |

**06(2) 2022.09.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් කමිටු වාර්ථාවේ 02(01) කරුණේ මොරටුව එගොඩ උයන නව ගාලු පාර, චන්ද්‍රකාන්ති 2705/14 /B පදිංචි පීරිස් යන අය 2021.12.22 දින ඉදිරිපත් කරන පහත ලිපිය, දැන් 2021.12.22 තමයි මේ ලිපිය එවලා තියෙන්නේ, සළකා බලන්නේ 2022.09.06 දැන් එ ලියුම තමයි මොදර ජයගත්පුර නිවාස සංකීර්නයේ වරිපනම් අංක 95 සිට වරිපනම් අංක 63 දරන නිවාස දක්වා ඇති මාර්ගයෙහි වරිපනම් අංක 266 දරන නිවස දක්වා එතෙක් සිට රේල් පාරට සමගාමීව ගමන් කරන ප්‍රධාන මාර්ගය දක්වා පුළුල් කොට පවරා ගැනීම. එතකොට තමයි මට දැනුනේ මේ මම ගෙනාපු යෝජනාවනේ කියලා, මම එ ප්‍රදේශයේ ජනතාවගේ යෝජනාවක් විදියට ගෙනාවා මේ මාර්ගය මේක දැන් දැක්කම කාටවත් හඳුනාගන්න පුළුවන් කමක් නෑ මේ මන් ගෙනාපු යෝජනාව කියලා මොකද මෙහි නැහැ කවුද යෝජකයා කවුද මෙය ගෙනාවේ කියලා, දැන් තියෙන්නේ මුදුනින් අල්ලලා යට නැහැ, එතකොට කාටවත් මෙය ගැන අදහසක් නැහැ, සභාවට එවනකොට අඩුම තරමින් මේ ගැන කතා කරන්නසභාවේ මන්ත්‍රීවරු සියළු වාර්ථා බලාලා ආවාත් මේ අයිටම් එක තේරුම් ගන්න බැහැ, දැන් මෙය තේරුම් ගන්නනම් නිෂ්චිත කොටසක් යෝජකයගේ තියෙන්න ඔන, දැන් මේ යෝජනාවට අදාල හිටපු උපනාගරාධිපති දම්මික චන්ද්‍රනාත් මහතාගේ ඉඩම පිළිබඳ ගැටළුව මෙහි ප්‍රශ්න ගණනාවක් මතුවුනා දැන් එතුමා අර කියපු පට්ට ගහපු යහපාලනයේ කරට මෙතුමා අත දාගෙන ඉන්න වෙලාවේ, අපිට සැකයක්

තියෙනවා දැන් දීර්ඝ කාලයක් එ මිනිස්සු පාවිච්චි කරපු මේ මාර්ගය ඔහුගේ ඉඩම උඩින් තිබුණේ ඔහු විවිධ අවස්ථා වල මම කියන්නේ මේ සභාව නොමග ඇරියා කියලා, ඔහුට ආදාළ ඉඩම් කමිටුවට එන්න කිව්වම ඊට අදාලව කතා කරන්න ඔහු ඒ අවස්ථා කිහිපයක්ම මඟ ඇරියා. ඔහු ආපු අවස්ථා තිබුණා එ අවස්ථාවල නිවැරදිව මේ සභාවේ අදාල නිලධාරින් කළ යුතු දේ කලේ නැහැ, දැන් ඊයේ පෙරේදා ගිහිල්ලා මොකක් හරි මැනීමක් කරලා ගැහුවා කණු වගයක් බලනකොට එ පාරට අදාළ ස්ථාවර මැනීම් කණු නෙවෙයි තවකාලික ගහපු කණු වගයක් කියලා තමයිT O මහත්තයෙක් කිව්වේ දැන් එක පැත්තකින් මෙහෙම ක්‍රියාත්මක වෙන ගමන් ඉඩමේ අයිති මම හිතන විදියට අපේ දම්මික චන්ද්‍රනාත් මහත්මයාගේ බිරිඳට හෝ දියණියට මේ ඉඩම අයිති. දැන් එයා කියනවා මේ පාර සඳහා පර්චස් 10ට වඩා වැඩි ප්‍රමාණයක් වන බව ඔබ සමඟ කළ සාකච්ඡාවෙන් මා හට පැහැදිලි විය. මෙම ඉඩමේ ප්‍රමාණය රජයේ තක්සේරුව මත දීමට හැකි බව මීට පෙර ඉහත නගරාධිපතිතුමාට, කොමසාරිස්තුමාට මෙන්ම ඉඩම් කමිටු සභාපතිවරයාටද ඔබට හා කර්මාන්ත අධිකාරිවරයාට දැනුවත් කර ඇත. හැබැයි යෝජක මන්ත්‍රීවරයා දන්නේ නෑ ඔහු මෙහෙම කිව්වා කියලා කිසි දිනක කමිටුවට මේ ලිවුම ආවේ නැහැ රජයේ තක්සේරුවට අදාලව මේ ඉඩම දෙන්න කැමති කියලා මේ කියන්නේ, ඊට පස්සේ ඔහු කියනවා තවම ඔබ නගර සභාව මේ පිළිබඳව උනන්දුවක් දක්වන සේයාවක් නොමැති හේයින්, ඔබ සභාව මෙම පාර පුළුල් කිරීම කරන්නේ නැතිනම් මා විසින් ඉඩම වටා ගැසීමට සැළසුම් කළ කම්බි වැට ගැසීමට මා හට කරුණාකර අනුමැතිය. දැන් අපේ පිටටම චෝදනාව දාලා සභාව උනන්දුවක් නැහැ එ නිසා මට වැට ගහන්න අනුමැතිය දෙන්න, දැන් කොහොමද මේ ගහන ගේම මේ දම්මික චන්ද්‍රනාත් මහත්තරු ඉතිහාසය පුරා මේ සභාවේ බොහොම වගකීව යුතු දූර දරමින් ඉතාම දේශපාලන අත්දැකීම් තියෙන තමන්ගේ අවශ්‍යතාවය බොහොම සූක්ෂම විදියට කරගන්න දක්ෂ අය බව අපි දන්නවා ඒවා තිබිය යුතු එවා හැබැයි එවා පවිච්චි වෙන්නේ මොකටද, මේ භූමියේ දීර්ඝ කාලයක් එ ජනයාගේ ඡන්දයෙන් සභාව නියෝජනය කරපු දේශපාලඥයින් දැන් සභාව අමාරුවේ දාලා සභාව උනන්දු නැහැ කියලා. අවුරුදු 50ක් 60ක් මිනිස්සු පාවිච්චි කරපු පාරක් කොටු කරන්න හැදුවම එ මිනිස්සු පොලිස්සි ගිහින් අපිට කියලා අපි යෝජනාවක් විදියට මේ සභාවට ගෙනල්ලා අපි සම්බන්ධයෙන් මෙය කරගන්න හැදුවේ.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම ඔබට බාධාවක් නෙවෙයි කරන්නේ 2022.01.11 දින ඉඳලා ඔබතුමා කියපු මෙය පර්චස් 10 වැඩිවෙනවා රජයේ තක්සේරුව දෙන්න කියන එක දිගටම එනවා මෙය එකපාරට ඊයේ පෙරේදා ලියපු ලියුමක් නෙවෙයි මම කමිටු වාර්ථා වලින් බැලුවා මෙය එන්නේ කොතන ඉඳන්ද කියලා 2022.01.11 දින ඉඩම් කමිටුවේ පවා මේ සම්බන්ධයෙන් එනවා. යම් පොඩි එකඟතාවයන් වලට අවිල්ලා මිණුම් කටයුත්ත කළා මිනින්දෝරු ගිහිල්ලා එයාලා ටර්නින් සර්කල් එකත් එක්ක මැනලා තියෙනවා මේ මුදල් දෙනවම් කියන එක මත නෙවෙයි ඔහුගේ ඉල්ලීම මෙයට එකඟතාවයක් දීලා නැහැ මගේ ගාව කමිටු වසරෙම කමිටු වාර්ථාවල් තියෙන නිසා ජුනි මාසේ සිට ඔහුගේ ඉල්ලීම තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔහුගේ පැත්තටත් අසාධාරණයක් කරන්න කියන එක මන් කියන්නේ නැහැ, ඔහුගේ ඉඩමේ එහා පැත්තේන් අඩි 03 ක් තියෙනවා, ඔහුගේ ඉඩමෙන් අඩි 07ක් එතකොට ඔහු එකට එකඟ වුණා, දැන් එ එකඟතාවය නැතුව ගහලා තියෙන මායිම් ගත්තම අර අපි බලාපොරොත්තු වන සීමාවේ නෙවෙයි. නගරාධිපතිතුමනි මගේ ඉතා කෙටිම ඉල්ලීම තමයි මේ වැට ගහන්න අනුමැතිය දෙන්න එපා කියලා, අද මෙය සම්මත වුනොත් වැට ගහන්න අනුමත උනා කියලා සම්මත වෙනවා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එයාගේ ලියුමෙන් එහෙම කියන්නේ අපි ඒකට එකඟතාවයක් දීලා නැහැ.

**2022.09.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දු නිරෝෂන මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 27 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 28 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 29 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 31 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 32 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 33 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 34 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

**2022.09.06දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සදහන් මන්ත්‍රීවරු සභාගැබෙහි නොසිටියහ.

01 මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා

02 මහා නගර සභා මන්ත්‍රී - යූ.ඒල්.සේනක දමයන්ත ද සිල්වා මහතා)

**06(3) 2022.09.06 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මම යෝජනාවක් ඉදිරිපත් කළා කමිටුව වෙත. එ සම්බන්ධයෙන් අපි කමිටුවේදීත් සාකච්ඡා කළා, එය කාලෝචිත යෝජනාවක් විශේෂයෙන්ම ලංකාවේ පවතින වත්මන් මන්දපෝෂණ තත්ත්වය පිළිබඳ, කාන්තාවන් හා මොරටුව ආසනයේ දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය සම්බන්ධව, ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළා ද කියන ප්‍රශ්නය, ඔබතුමා හිටියේ නැහැ කමිටුවේ සාභාපතිවරයාගේ අත්සනින් යුතුව දීපු යෝජනාව සභාවට ඇවිල්ලාවත් නැහැ. මේ යෝජනාව සම්බන්ධව සැලකීමක් තිබිය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

**(සභා ඝෝෂා)**

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අංක 02(01) ප්‍රධාන පුස්තකාලාධිපතිනිය විසින් 02/07 දිනැති ඉදිරිපත් කර ඇති ජනසෙත පුස්තකාලයේ පරිඝණක අංශයේ වහල අළුත්වැඩියා කර දෙන ලෙස හා බැහැර දෙන අංශයේ කැඩි බිඳි ඇති ජනේල් පද්ධතිය අළුත්වැඩියා කර දෙන ලෙස සිටින එක සම්බන්ධව උක්ත කරුණ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළ කමිටුව, සැහෙන්න සාකච්ඡා කරලා. 2022.08.18 ස්ථාන පරික්ෂණය සිදු කිරීමට නොහැකි වී ඇත. 2020 මේ ඉල්ලීම කරන්නේ, දිර්ඝව සාකච්ඡා කල කමිටුවට 2022.08.18 ස්ථාන පරික්ෂාව සිදු කිරීමට නොහැකි වෙලා තියෙනවා. තවද මේ වහලයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතින බැවින් 2 අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිමකරන ලෙස නාගරික ඉංජිනේරු වෙත දැනුම් දී ඇත. අපිට මෙහෙම වචන පව්ච්චි කරනවටත් අපහස නඩු දාන්න ඕ්න.කරුණාකරලා ඉංජිනේරු අංශයෙන් කියන්නකො ඇත්තටම මේ සභාවට මේ සම්බන්ධ තත්ත්වය මොකද්ද කියලා. දැන් මේ අයිතමේ මොන මට්ටමේද තියෙන්නේ කියන්නකො.ඉංජිනේරු අංශයේ කවුරුහරි දන්නවද මෙහෙම දෙයක් ගැන. කවුරු හරි වගකිව යුතු නිලධාරියෙක් කියන්නකෝ.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, 2022.08.15 මේ කමිටු වාර්තාවේ එ වාර්තාවෙත් මේ සම්බන්ධ ඉල්ලීම කරලා තියෙනවා ගරු පුස්තකාලාධිපතිනිය. මේඅයිතමය සම්බන්ධවඑතුමිය කියනවා පුස්තකාලාධිපතිනිය විසින් දිනැති ජනසෙත පුස්තකාලයේ පරිගණක අංශයේවහල අළුත්වැඩියාව බැහැර දෙන අංශයේ ජනේල් පද්ධතිය අළුත්වැඩියා කර දෙන ඉල්ලීම. එ ගැනම තමයි මෙහි තියෙන්නෙත්, ගිය කමිටුවේදී පරිඝණක අංශයේ වහල අළුත්වැඩියාව නගර සභා සේවකයන් යොදවා දැනට ජනසෙත පුස්තකාලයේ වහල අළුත්වැඩියා කිරීම දෙවන අදියරේ අළුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය ඇණවුම් කර ඇත. මෙහි පුදුම වැඩේ කියන්නේ, ඔබතුමා මේ ගැන කියපු එක බොහොම හොඳයි. මේ නිලධාරි ගිය මාසේම මේ සම්බන්ධව දෙනවා හොඳ පිළිතුරක්, දැන් මෙහි කියනවා ස්ථාන පරික්ෂණ වාර්ථාවක් දීලා උත්තරයක් දෙන්නම් කියලා මෙය දීලා ඉවරයි. මේ දෙක බලන්නේ නැති නිසා මේ ප්‍රශ්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ නිලධාරින්ට අවබෝධයක්වත් නැහැනේ මෙය කියාගන්නවත්.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මෙහි කියලා තියෙන්නේ ගරු මන්ත්‍රීවරු ගිහිල්ලා ස්ථාන පරීක්ෂාවක් කරන්න කියලා වැඩේ ගැන බලන්න. නමුත් එතුමිය කියලා තියෙන එකට පැහැදිලිවම වාර්ථාව දීලා තියෙනවා ජනේල කැඩිලා අපි එවා හදනවා ඇස්තමේන්තුත් ඇවිල්ලා තියෙන්නේ මේ ඔක්කෝම හදන්න මම එ ඇස්තමේන්තු වලට අනුමැතියත් දීලා තියෙන්නේ. හැබැයි මෙහි කවුරුත් කතා කරන්නේ නැහැ මන්ත්‍රීවරයාව අමාරුවේ දානවා සභාව කතා බහට ලක් කරන්න මාතෘකා හදනවා ගිය මාසේ දීලා තියෙනවා මේකට වාර්ථාව හැබැයි මේ මාසේදී වාර්ථාවක් නැත.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන් සභාව විධියට අපට තියෙන්නේ වහලයේ අළුත්වැඩියාවයි, බැහැර දෙන අංශයේ තියෙන කැඩී බිඳී ගිය ජනේල් පද්ධතිය අළුත්වැඩියාවයි කවදා වෙනකොට කරලා අවසන් කරනවාද.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දැන් වහලය සම්බන්ධයෙන් සභා සේවකයන් යොදවලා මේ කටයුතු කරගෙන යනවා. නමුත් එකේ වැසිකිළි පද්ධතිය සම්බන්ධයෙන් දොරවල් දැමීමේදී ප්‍රමාද වෙන්න පුළුවන්,දැන් වෙනමම කාර්යයක්යොදා තියෙනවා දොරවල් සෑදීමට, මොකද ලී දොරවල් යෝග්‍ය වෙන්නේ නැති නිසා ඊට අමතරව වැසි තත්ත්වයට ගාලු පාර පැත්තට තියෙන ජනේල ගොඩක් දිරලා, ග්‍රවුන්ඩ් එක පැත්තේ තියෙන ජනේල්ද දිරලා ඒ නිසා දිරන්නේ නැති විදියට ජනේල සකසන්න ඇස්තමේන්තු සකසලා තියෙනවා. මේ තත්ත්වය මත ඔය පරිගණක තියෙන ස්ථානය, මේ වාර්තාව හරියට ලියන්නේ නැහැ ඔබතුමා කියනවා හරි මේ අවබෝධයක් නැතිකම. මේ පරිගණක අංශය සඳහා තට්ටු දෙකේ ගොඩනැගිල්ලක් හදලා එ ගොඩනැගිල්ලේ වැඩ නිම කරමින් පවතින වෙලාවක තියෙන්නේ. මේ පරිගණක අංශයේ වහල වෙනම අයිතමයක් මෙය පශුවෛද්‍ය කාර්යාලයේ උඩ කොටසට ගෙනිහිල්ලා ජනසෙත පැත්තෙන් පඩි පෙළකුත් දලා තියෙන්නේ, මෙය හදලා ඉවරයි. හැබැයි මේ වාර්ථාවේ කොහෙවත් එක නැහැ, මන් දන්නේ නැහැ ඇයි මෙහෙම වෙන්නේ කියලා මම කමිටුවකට වාඩි නොවිම නිසා වෙන ගැටළු මේ. මම මට මේ දැනුම තියෙන නිසා අනෙක් කමිටු වලට ගිහින් මේ බලන්නේ, සම්පූර්ණයෙන්ම පරිගණක අංශය හදලා ඉවරයි ළමුන්ට පරිගණක පාඨමාලාවවිදිමත් පරිදි හදාරන්න පුළුවන් විදියට. එ විතරක් නෙමෙයි මට ලැබුන ප්‍රතිපාදන වලින් ලක්ෂ 12කට වැඩි ප්‍රමාණයකට පරිගණකත් මේ වෙනකොට පරිගණක මධ්‍යස්ථානයට ලබා දීම සඳහා ගෙනල්ලත් ඉවරයි. මේ නගරික මන්ත්‍රීවරුන්ට මම යවලා තියෙන්නේ, පුහුණුවක් ලබා දෙන්න හදන්නේ මේ. එතරමට මේ වැඩ සටහන දියත් වෙලා තියෙන්නේ කරුමෙට මෙහි ලියවිලා නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පට්ට වැඩසටහනක්නේ ගොඩනැගිල්ලකුත් හදලා එක ඉතාම හොඳයි. විධිමත් පාඨමාලවක් සඳහා ගොඩනැගිල්ලකුත් හදලා, හැබැයි තියෙන එක බේරගන්න එපැයි ඔක්කෝටම ඉස්සරවෙලා නව එක හදලා එකේ මේ වැඩ පටන් ගන්න යන කාලයක් අපිට කියන්න බැහැ මොකද එකේ තව අඩුපාඩු තියෙනවානේ එකට අපිට යම් කාලයක් යනවානේ එ යනකන් අපේ තියෙන එක බේරගන්න ඕනනේ, අපි මේ සංවාද කරන්නේ එක තියෙන එක බේරගැනීම ගැනනේ. 2020 ඉඳලානේ මේ වාර්ථාවේ මෙය තියෙන්නේ, ඔබතුමාත් පොඩ්ඩක් උදව් කරලා මේ නිලධාරින්ට මොකද්ද තිබෙන ගැටළුව මේ ආරක්ෂා කිරීම සඳහා තිබෙන ජනේල් පද්ධතිය ඇස්තමේන්තුත් හදලනම් එ වැඩේ අපේ සෘජු සේවක දායකත්වයෙන් කරනවද කොන්ත්‍රාත් දෙනවද තියලා කියන්නකො, මෙය කවදා කරලා ඉවර කරනවද කියන්නකො.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනී, අපි සභා සේවකයන්ගෙන් තමයි මේ වහලයේ කටයුත්ත කරන්නේ, දැන් කරගෙන කරගෙන ඇවිල්ලා පරිගණක අංශයේ වහල තමයි අපිට කරන්න තියෙන්නේ. එ පරිගණක අංශයේ

වහලේ ලී දඬු ඔක්කොම ගෙනල්ලා තියෙන්නේ. වසර 4කට පෙර අපි සම්පූර්ණ වහළ අළුත්වැඩියාකරා එතනට වෙනකන් ලී දඬු වහළට අවශ්‍ය ලී ඔක්කොම ගෙනල්ලා තියෙන්නේ. මේ වාර්තාවේ පැහැදිලිවම තියෙනවා ඒක පරිගණක අංශයේ වහළ මීට පෙර සේවකයින් යොදවාසිදු කර ඇති දැනට ජනසෙත පුස්තකාලයේ වහලයේ අළුත්වැඩියා දෙවන අදියරේ පවතින එම වහළය ප්‍රතිසංස්කරණය සඳහා ද්‍රව්‍ය ඇණවුම් කර ඇත. වහළට සඳහා අවශ්‍ය දැව දැනටමත් ලැබී ඇත. පලවෙනි අදියරේ වැඩවලින් 80% මේ වන විටත් වැඩ අවසන්ය. ජනේල් දොරවල් සඳහා මේ වන විට දැව කොටස් යොදා සැකසීමට අවශ්‍ය මැනීම් කටයුතු කරන ලේඛන ලබාගෙන ඇත එම දොර ජනේල් දැවයෙන් කරනවාද නැතහොත් ඇළුමිනියම් උපාංග යොදාගෙන කරනවාද යන අවශ්‍යතාවය කියලා හොඳ පැහැදිලි නිර්දේශයක් දීලා තියෙනවා පසුගිය කමිටුවේදි, එ කමිටුවේ වාර්ථාව මෙයට ඇවිල්ලා නැහැ. ඒකම ගෙනාවනම් හරිනේ අළුත් එකක් දෙන්නේ නැතුව. මෙය ඉස්සරහට යන්න අළුත් ඒකක් කියන්නේ නැතුව පරණ එකනේ කරන්න වෙන්නේ. මෙය මේ වාර්ථාවට ආවනම් නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා මෙය පොලිෂ් කරනවා ඇරෙන්න මෙය ගැන වරද නෙවෙයි කියන්නේ, මට තේරෙන්නේ නැහැ නිලධාරි ඇයි මෙය කරන්නේ නැත්තේ කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපි ගොඩක් සංවාද කරගන්නවා වාර්ථාවල තියෙන මේ වැරදි වගේම ප්‍රයෝගිකව එතනට ගියාම එතන තියෙන ගැටළු ප්‍රමාණයත් අපිට හොඳට පේනවා. එකක් මහජන මුදල් එලදායිතාවයක් සහිතව මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවෙලා තියෙන්නේ ඉතාම කණගාටුදායක තත්ත්වයක්, කතා කරලා කරලා මේවා එපා වෙලා තියෙන්නේ. දැන් ඔය වහල හදන්න ගත්තේ කවද්ද, මොන අවුරුද්දේද, මම කියන්නේ අපිට සමස්ථ එක ඇස්තමේන්තුවක් ඇතුලේ මෙය කරන්න බැරිව අපි කැලි කැලි වලට වෙන් කරලා එකක් පටන් ගන්නවා, එක අවුරුදු තුන හතරක් දුවනවා අනිත් එක කරන්නපටන්ගන්නකොට අරක විනාස වෙලා එක ඉවරත් නැහැ. මම කියන්නේ එක ව්‍යාපෘතියක් අවසන් කරන්නේ නැහැ, දැන් මෙතනට ගියත් අපිට බලාගන්න පුළුවන් ලක්ෂ ගාණක් වියදම් කරලා. එ නිසා මම කියන්නේ නගරාධිපතිතුමනි මේ වියදම් කරන මහජන මුදල් වලට සාදාරණය ඉෂ්ඨ කරන්නඕනෑ. මේ සභාව මේ ප්‍රශ්න කරන්නේ ඒ නිසා ගිහිල්ලා බලලා මෙය අවසන් කරන්නේ කවදද කියලා කියන්න කියන ඉල්ලීම කරනවා.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මම මේ සභාව ඉවර වුණාම කණ්ඩායමක් එක්ක එතනට යනවා බලන්න.

<u>**නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම මේ සම්බන්ධයෙන් අධීක්ෂණයක් කළා.මම ඒ ස්ථානයට ගියා. එතකොටත් ප්‍රධාන වහලේ වැඩ නිමකරලා තිබුණා, ඇත්තටම නිශාන්ත මන්ත්‍රීතුමා කිවුවා වගේ මේ මහජන මුදල්, මේ වහලය ගහන්න අරන් තියෙන ලී සම්බන්ධයෙන් ගත්තම ඒවා ගැන සෑහීමකට පත් වෙන්න බැහැ. මොන දැව වර්ගයකින් මෙය කරන්න තීරණය කරාද කියලා මම දන්නේ නැහැ එතන විවිධ දැව වර්ග තිබුණා ඒ ගැන සෑහීමට පත් වෙන්න බැහැ, මේවා වැඩිකල් පවතින ඒවා නෙවෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්න ඕනෑ නැත්තම් වැඩිකල් යන්න කලින් මේ මුදල් අපතේ යනවා. අපේ ඍජු ශ්‍රමයෙන් අපි කරනවා සේවකයෝ ටික හරියට එය කරනවා. නමුත් අපි ගෙනත් තියෙන දැව සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී -ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉතා කෙටියෙන් සඳහන් කරන්න ඕනෑ මම ඇත්තටම දන්නවා මේ ජනසෙත පුස්තකාල හා මේ ශ්‍රවණාගාර පරිශ්‍රය සංවර්ධනය කරන්න ඔබතුමා සැහෙන්න මැදිහත් වීමක් කළා,

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔය පරිගණක තියෙන තැන තමයි අපි වඩු කෞතුකාගාරය හදන්නේ, ඒකයි අපි මෙය ඉක්මණින් අවසන් කරන්න හදන්නේ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මට මතුකරන්නේ ඒ කරුණාව නෙවෙයි. මෙහි වැඩ කෙරිලා තියෙනවා නමුත් මෙහි වැදගත්කම තියෙන්නේ මෙය කොළයකට සීමා කරලා අපි කොළ ගාණ අඩු කරනවා කියන එක නෙවෙයි. ආදාල වැඩ ටික එන්න ඕනෑ එයින් තමයි මේ සභාවේ හැම මන්ත්‍රී කෙනෙක්ම මොකද්ද අවුට්පුට් එක කියලා. ඉතින් මෙතන ප්‍රශ්නේ තියෙන්නේ. මන්ත්‍රීවරුන්ට අවබෝධයක් නැති වෙන්නේ මෙහි වැඩේ කරලා තියෙනවා, නමුත් වාර්ථාවේ මෙය නැහැ.ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි. අපේ කමිටු සභාපතිවරුන්ට උපදෙස් දෙන්න තමන් කමිටුව අත්සන් කරන්න කලින් පොඩ්ඩක් මේ වාර්ථාව කියවලා ඒ සම්බන්ධයෙන් අවබෝධයෙන් අත්සන් කරන්න කියලා.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මම හිතනවා කමිටු සභාපතිවරු සැහෙන්න උනන්දුවකින් කටයුතු කරනවා, සමහරක් අවස්ථා වල මම අනවසර කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරනකොට මම දෙන වාර්ථාව මම දෙපාර්ශවයට ඇහෙන්න කතා කරලා කියලා ආපසු දෙපාරක් කියවලා ඒ ලිපි දෙකම යවනවා. ඒ නිසා ගරු සභාපතිවරු මම හිතනවා උනන්දුවකින් වැඩ කරනවා. මේවා මේ තත්ත්වයෙන් හරි පවත්වාගෙන යන්නේ ඒ නිසා.මම හිතනවා අවසානයට ගන්න තීරණ සම්බන්ධයෙන් ලේකම්තුමා එක්ක එකතු වෙලා විමසිලිමත්ව මේ කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**2022.09.06 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උපීත් කිෂාන්ත කල්දේරා මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දූ නිරෝෂන මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |

27 මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
28 මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
29 මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය
30 මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
31 මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
32 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
33 මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
34 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

**2022.09.06 දින පැවති මහජන උපයෝගිතාව,කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

01 මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
02 මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
03 මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
04 මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
05 මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
06 මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
07 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

**2022.09.06 දින පැවති මහජන උපයෝගිතාව,කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සදහන් මන්ත්‍රීවරු සභාගැබෙහි නොසිටියහ.
01 මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
02 මහා නගර සභා මන්ත්‍රී - යූ.ඒල්.සේනක දමයන්ත ද සිල්වා මහතා)

**06(4) 2022.09.07 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පරිසර හා සෞඛ්‍ය සනීපාරක්ෂක කමිටුවේ. අංක 02 (15) කරුණ හරිත දැයක් කියන වැඩ සටහන සම්බන්ධයෙන් නගරාධිපතිතුමනි මට ප්‍රශංසාත්මකව මේ සම්බන්ධයෙන් අදහසක් දක්වන්න ඕනෑ. විශේෂයෙන්ම අද මේ මොහොතේ ඉතාමත් කලෝචිත ක්‍රියාමාර්ගයට තමයි නිරත වන්නේ. ආහාර අර්බුධයක් තියෙනවා කියන වටපිටාව ඇතුලේ,පෝෂණ ඌණතාවයන් තියෙනවා කියනවටපිටාව ඇතුලේ, දරුවන්ට කන්න නැහැ කියලා කියන වේලාවේ, අපි සභාවක් විදිහට අපිට කරන්න පුළුවන්,විවේජනය කරන එක වගේම අපි මොකද්ද කරන්නේ කියන එක සභාවක් විදිහට මේ කරන්න පුළුවන් හොඳ ක්‍රියාමාර්ගයක් විදිහට මේ වැඩේ මම දකින්නේ, මම මීට කලින් මේ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කළා. මොරටුවේ ගෙවතු වැඩ සටහන ඉතාම පුළුල්ව ක්‍රියාත්මක වෙන්න කියලා. ඒ වගේම ගරු ඔබතුමාගේ මහ පෙන්වීම යටතේ ගරු පරිසර හා සෞඛ්‍ය සනීපාරක්ෂක කමිටුවේ සභාපතිවරයා ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා, එතුමා ඉතාම නිර්මාණශීලිව වැඩසටහනක් ඉදිරිපත් කළා එහි පළවෙනි පියවර විදිහට සංකේතාත්මක විදිහට එළවළු වර්ග පහක පැළ දහයක්, කාබනික පොහොර කිලෝ 10ක්, එළවළු පැළ සඳහා ඇසුරුම් මේ වගේ ලොකු වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඉතින් ගරු නගරාධිපතිතුමනි, වැරද්දක් උනාම ඒ ගැන කතා කරනවා වගේම මේ වගේ දේකදි හොඳ කියන්නත්, විශේෂයෙන්ම මම ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට ස්තුතියි කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. එතුමා මේ වැඩසටහන මාස දෙකක් ඇතුළත ඉතාමත් සැළසුම් සහගතව මේ මොරටුව අවට පවුල් 5000ක් මේ ගෙවතු වාගාව වැඩසටහනට සම්බන්ධ කරගත්තා. ඒ වගේම මම ඉල්ලීමක් කරනවා

ගරු නගරාධිපතිතුමනි, පහුවෙච්ච ලෝක ළමා දිනය වෙනුවෙන් මේ වැඩ කරන්න කියලා මොකද, ලෝක ළමා දින වැඩසටහන ඇතුලේ දරුවන්ව මේ දේවල් වලට හුරු කිරීම වෙනුවෙන්, එදා පාසල් දරුවන් ගණනාවක් පැමිණ සිටියා සොයිසාපුර ක්‍රීඩාංගණයට එදා අපිට එය දෙමාපියන්ට දෙන්න තිබුණනම් මාධ්‍ය ආවරණයක් ඇතුව අපේ සභාවට ලොකු කීර්තියක් විදිහට මම දකිනවා. නමුත් මම ඉල්ලා සිටින්නේ සංකේතයක් විදිහට අපේ සභාව සතු ඉඩම් වල ඒ පරිශ්‍රයන් තුළ සභාව මැදැහත් වීමෙන් පරිසර හා සෞඛ්‍ය සනීපාරක්ෂක කමිටුව මුල් කරගෙන මේ පැළ බෙදා දෙනවා වගේම පැළ සිටවීමත් ආරම්භ කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ල සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වාර්ථාවේ 02(10) කරුණ සම්බන්ධයෙන් සීවිව් රෙසිඩන්ට්ස් හි කසළ ගැටළුව මෙහි නිර්දේශයට අනුව උක්ත කරුණ සලකා බැලූ කමිටුව මෙම ස්ථානයේ ගැටළුව කඩිනමින් නිරාකරණය කිරීම සම්බන්ධවත් මෙම ස්ථානයේ කසළ කළමනාකරණය හා පරිසර හානිය සිදු වන්නේද යන්න පිළිබඳ නිරීක්ෂනය කිරීමටත් කොට්ඨාශ භාර සෞඛ්‍ය පරීක්ෂකතුමාටත් යොමු කරලා තියෙනවා. අපි කැමති එතන සම්බන්ධව ඔබතුමාලා ගත්ත තීරණය මොකද්ද නැත්නම් පරණ තීරණයේමද ඉන්නේ, කලින් තිබුනේ කසළ ඉවත් කරන්නේ නැහැ වන්දි මුදලක් ලැබීමට නියමිතයි එ මුදල ලැබෙනකන් මෙම ස්ථානයේ කසළඑකතු කිරීමට ඉවත් කිරීමට සභාවට බැහැ කියන එක තමයි කොමසාරිස්තුමාගේ ලිපිය මඟින් කියා තිබුනේ. ඒ ස්ථාවරයේමද තවම ඉන්නේ.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඊයේ දිනයේ ඔවුන් මා සමඟ සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවෙදි ඔවුන්ට මම පොඩි පැහැදිලි කිරීමක් කළා. ඒ පැහැදිලි කිරීම කලේ ඔවුන් අවබෝධයක් ඇතිව නෙවෙයි මේ ඉඩම් අරන් තියෙන්නේ. එතකොට මේ රටේ උත්තරීතරයැයි කියෙන පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩලය විසින් සන්දේශ දෙකකින් මොරටුව මහා නගර සභාවට ලබා දෙන්න ඕනැ කියලා සන්දේශ දෙකක් ලබා දීලා තියෙන වේලාවක තමයි අප සතු වෙන්නාවූ ඉඩමක් ඔප්පු ලබා දෙන්න බැරි විදියට මුදල් අයකරගෙන ලබා දීලා තියෙන්නේ. ඒ ගැටළුවත් එක්ක මේ වෙනකොට ඔවුන් විසින් යම් යම් මුදල් ගෙවාගෙන යම් යම් ආයතන වලට කසළ ඇදීමේ කටයුත්ත කරලා දැන් ඔවුනුත් හිර වෙලා තියෙන්නේ. නමුත් හෙට දිනයේදී මේ ආදාල වෙන්නා වූ විෂය භාර අමාත්‍යවරයා සමඟ සාකච්ඡාවක් ඉල්ලා ගත්තා. දැනට නාගරික ජනාවාස එකේ සභාපති ප්‍රියන්ත රත්නායක මහතාසමඟ මම වෙනම දුරකථනයෙන් කතා කළා, එතකොට ප්‍රශ්නයට අවතීර්ණ වෙලා තියෙන්නේ වෙන මුකුත් නිසා නෙවෙයිදැන් ඔවුන් පදිංචිකරුවන් මොරටුවේ.නමුත් තොරතුරු දැනගැනීමේ පනතෙන් පවා විකෘති වෙන ආකාරයට අපෙන් තොරතුරු දැන ගන්න ඉල්ලපු එක වැරදි අභියෝගයට ලක් කරමින් නැවත මේ තත්ත්වය තවත් දුරට දිග් ගැස්සෙමින් පවතින වේලාවක තමයිගිය සතියේ සිකුරාදා 29 වෙනිදා අපි ගියා එතුමට හදිස්සියේ පාර්ලිමේන්තුවේ අණ්ඩුපක්ෂ සංවිධායක වරුන්ට පිළිතුරු වගයක් දෙන්න ඕනැ නිසා රැස්වීම අවලංගු වුණා දැන් හෙට දිනයෙදි බොහො දුරට ඒ රැස්වීම පැවැත්වෙනවා. ඒ රැස්වීමෙන් පස්සේ අපි ස්ථිරවම විසඳුම ඒ අයට ලබා දෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි නැවත නැවත ඉල්ලන්නේ ජනතාවගේ පැත්තෙන් හිතලා මෙයට ඉක්මනින් විසඳුමක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි සභාව පැත්තෙනුත් හිතන්න එපැයි. ඒ එන අය මොරටුවේ අය නොවෙයි ඔක්කෝම පිට අය. සභාවේ තියෙන අයිතිය සභාවේ බදු මුදලින් ආරක්ෂා කරපු ආයතන අපිට පුළුවන් විදියට අපේ තේරීම් විදියට ගනු දෙනු කරන්න බැහැ සභාවක් විදිහට අපි ගණු දෙනු කරන්න ඕනැ.ඒ නිසා මේ වෙලාවේ මිනිස්සු කවුද කියනවට වඩා මෙය ආරක්ෂා කරන්න ඕනැ තත්ත්වය සභාව පැත්තෙන් ආරක්ෂා කරන්න ඕනැ. අපිඅර සම්බන්ධයෙන් පොඩ්ඩක්වත් විරෝධතාවයක් නැහැ. එතනින් එන කාරණයත් එක්ක තමයි පිළිතුරු සපයන්න වෙන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, වාද කරන්න අවශ්‍ය නැහැ අපි කලින් මේ ගැන කතා කරලා තියෙනවා, ඒ නිසා අපිට මෙයට ඉක්මණින් උත්තරසපයයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. නගරාධිපතිතුමනි, තව පොඩි අදහසක් තියෙනවා. මෙහි 02(11) සුසාන භූමි සම්බන්ධයෙන් දැන් අපේ මේ සභා කාලය අවසන් වෙලාතව අපි මේ අමතර අවුරුද්දක්නේ මේ ගෙවන්නේ එතකොට දැන් අවුරුදු 4ක් තිස්සේ මට මතකයි අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කාලන්තරයක් තිස්සේ මේ ගැටළුව ගැන කතා කරනවා. මේ සුසාන භූමි වල තත්ත්වය භූමිදානය කරන්න ගියාම මේ ආදාල දේහයන් ජනතාව මොනතරම් අපහසුතාවයට පත් වෙනවද මිනී මොනතරම් ගොඩ දාන්න ඕනද එකක් වළලන්න, ඔය ප්‍රශ්නය දිගින් දිගටම කතා කරනවා තමත් මේක කමිටුවේ තියෙනවා. මෙයට ආදාල විසඳුම ලැබිලා නැහැ ගිය සුමානෙත් අපි රාවතාවත්තේ කනත්තට ගියාම එක ස්ථානයක් තිබුණා සැහෙන්න කැළේ වැවිලා එවා සුද්ද පවිත්‍ර කරලා ඊට ආදාල කිසිදු ක්‍රියාමර්ගයක් ගන්නේ නැහැ. මම කියන්නේ මේ දේවල් කමිටු වලට පමණක් සීමා කරලා වැඩක් නැහැ. එක දේහයක් මිහිදන් කරන්න දේහයන් දෙකක් ගොඩ දාන්න වෙනවනම් මෙය බරපතල තත්ත්වයක්, මාස හයක්වත් මිනියක් තියාගන්න බැරි තරමට අසරණ වෙනවා එම නිසා මෙවා ඉක්මණින් විසඳන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, 02(4) අපේ රසායනාගාරයේ, ඇත්තටම මම මේ වේලාවෙ ස්තුතියි වන්ත වෙනවා ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමාට එතුමා සැලකිය යුතු මැදිහත් වීමක් කරනවා. මෙය මේ මට්ටමින් හෝ පවත්වාගෙන යාමටය. මම ගිය සතියේදීත් එතුමාව හමුවෙලා කතා කරා, මීට පෙර තිබුනේ ඒ ආදාල රාසායන ද්‍රව්‍ය නොමැති වීම සම්බන්ධ ගැටළුවක්, දැන් ඒ ගැටළුව විසඳිලා තියෙනවා. අපිත් දිගින් දිගටම කියනවා මෙහි ප්‍රමිතිය පිළිබඳ සෞඛ්‍ය ආමාත්‍යාංශය සමඟ කටයුතු කරලා එ ආදාල ප්‍රමිති සහතිකය ලබා ගැනීමට ඉක්මණින් කටයුතු කරන්න කියලා, එතුමා කියනවා එයින් යම්තාක් දුරට කරා කියලා, අපි ඉල්ලන්නේ මෙය ඉක්මණින් අවසන්කරලා දෙන්න කියලා. රාසායනාගාරය කියන්නේ ඉතාම වැදගත් එකක් ඒ නිසා ඉක්මණින් එ ප්‍රමිති සහතිකය ලබා ගන්න කියන ඉල්ලීම කරනවා. අපි මෙහිදි මේ 02(10) කාරණයට විරුද්ද වෙනවා අනිත් එවට පක්ෂයි.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ කියන්නේ සභාව වැඩ කටයුතු කරන්න අවශ්‍ය සභාවේ ආරක්ෂාව සහිතව නෙවෙයි, ඔබතුමාලා කියන්නේ කොහොම හරි කුණු අදින්න ඕනෑ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි සභාව ගැන හිතලා වැඩ කළානම් මේ අර්බුදයට මුහුණ දෙන්නේ නැහැ, සභාව ගැන තමයි අපි හිතන්නේ. විගණනාධිපතිගේ වාර්තාවේ ඒක තියෙනවා සභාව ගැන නොහිතා කරපු එකේ ප්‍රතිඵල ඒ නිසා කිසි විටක සභාව ගැන හිතලා මෙවැනි ඒවා නොකරපු බවට මේ ක්‍රියාවලියෙන් තහවුරු වෙනවා. ඊලඟට එතන ඇති වෙන සෞඛ්‍ය ගැටළුව අපිට පදනම් කරන්න බැහැ අපි මේ හිතලා නොකරපු වැඩේ හේතු කරගෙන ජනයාව කුණු ගොඩේ තියන්න බැහැ, එහෙම අයිතියක් අපිට දීලා නැහැ. අපි වඩාත්ම හොඳම විදිහට මේ ඉතිහාසය හොඳින් කියවා ගත්තම ජේනවා. මේ ආයතනය පැත්තේන් තමයි අපි කුමන හෝ විදිහකට තහවුරු කර ගත්තු, අපේ යැයි කියා ගත්තු දේපලක් දැන් මේ නිවාස ව්‍යාපෘතියක් ඉදිකරද්දිත් අපිත් එක්ක එකඟ වෙච්ච එකඟතාවය අනුව අපිට ඒ ගෙවීම ගන්න බැරි උනා. ඒගොල්ලෝ දුන්නේ නැහැ කියන කතන්දරය අපිට වැඩක් නැහැ අපි අසමත් වෙලා ගන්න, පාලන ගණනාවක් තුළ එහෙනම් අපිට ඔබේ ඔය නගරාධිපති බලය පාවිච්චි කරලා තිබුනේ ඒ නිවාස වල පදිංචි වීමට ආදාලව අනුමැතිය දෙන එක වලක්වන්න.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි අනුමැතියක් දීලා නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුනි, එහෙනම් බලහත්කාරයෙන් පදිංචි වෙලා ඉන්නේ, මෙයට නීතිමය ක්‍රියාමාර්ග ගන්න. අපි සභාව ගැන තමයි හිතන්නේ. හැබැයි ජනතාවගේ පැත්තෙන් ඔවුන්ගේ සෞඛ්‍ය ගැටළුඅපිට අර ගැටළුවෙන් යට කරලා ලෙඩ රෝග වලට ගොදුරු වෙනකන් බලන් ඉන්න බැහැ.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන එකට මම එකඟ වෙන්නේ නැහැ. හැබැයි ඔබතුමාට පුළුවන්කමකුත් නැහැ මහා නගර සභාවේ දේපලකට බලෙන් ඇවිල්ලා කුණු දානකොට කුණු ටික අදින්න අපිට පුළුවන්කමකුත් නැහැ, මෙතන තියෙන්නේ කුණු අදින්නේ නැති එක සම්බන්ධ ප්‍රශ්නයක් නෙවෙයි.මහා නගර සභා දේපලක් සම්බන්ධ ප්‍රශ්නයක්.

<u>**මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපිට තියෙන්නේ එක ප්‍රශ්නයක්, ජනයාට තියෙන්නේ වෙන ප්‍රශ්නයක්. ජනයාට තියෙන්නේ කුණු අදින්නේ නැති වීම සම්බන්ධ ගැටළුවක්, අපිට තියෙන්නේ අපේ සභාව සතු දේපලක් අයථාලෙස අරගෙන අපේ එකඟතාවය බිඳ දැමීම සම්බන්ධ ගැටළුවක්. දැන් අපි උත්සහ කරන්නේ අපේ එකඟතාවයට අනුව දෙනවා කියපු එක ලබා ගැනීම කියන තැන තමයි අපි ඉන්නේ. හැබැයි දීර්ඝ කාලයක් ඔවුන් ගෙවලුත් හදලා මිනිස්සුන්ව පදිංචිත් කරනකන් අපි අසමත් වුණා. අපි ප්‍රශ්න කරනකොට, කරනකොට ඔබ කිවුවේ ඊළඟ සාකච්ඡාවෙන් හරියයි හරියයි කියලා. අපේ හිටපු නිවාස ඇමති විමල් වීරවංශ ඇමතිවරයා දෙනවා කිවුවා සජිත් ප්‍රේමදාස ඇමතිවරයා දෙනවා කිවුවා. දැන් අවසානයේ අපි අසමත් වෙලා තියෙනවා.

**(සභා ඝෝෂා)**

සංවාදයක් ඉවර කර ගන්න ඕනෑ අපි එකිනෙකා සතුටු වෙන එකෙන් හෝ අසතුටු වෙන එකෙන් නෙමෙයිජනතාවට මොකක් හරි කරන්න පුළුවන් ඒකෙන්. ඒනිසා මේ සංවාදයේදී අපි විරුද්ද වෙන්නේඒ පදනමින්, අපි මේ අරගලය කරන්නේත් එ ලැබිය යුතු මුදල අපිට ලබා ගැනීමට. මොකද මේ විගණකාධිපතිගේ වාර්ථාවෙදීත් අපිව ගොඩක් හිර කරලා තියෙන්නේ. ඊළඟට ඔබට මේ වාර්තාවේදීත් නිලධාරින්ගෙ පැත්තෙන් හා ඔබලාගේ වගකීම් වල අත්හැරීම් ගැනයි අර කතා කරපු 02(11) සුසාන සුසාන භූමි කටයුත් විදිමත් කිරීම මේ පෙන්න ගන්න ඕන මේ වගකීම් වලට වගනොකියන එක හා මේ කමිටු සභාපතිවරු මේවා හරියට අල්ලගෙන වගකීම ඔවුන්ගෙන් නොගන්න එක ගැන, දැන් මෙහි කියනවා මොරටුවට ආදාල සුසාන භූමි වල මෘත ශරීර භූමිදානය කිරීමේ සැලැස්මක් අනුව සිදු නොවීම, මේ කියන්නේ අපේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක, ජනතාවට සිදුවන අපහසුතාවයන් වැලැක්වීම සඳහා සැළැස්මකට අනුව භූමිදාන කටයුතු කිරීම සඳහා සකස් කරන ලද සැලැස්ම කමිටුවට ඉදිරිපත් කරමි. කෝ මේ කමිටුවේ සැලැස්ම ඉදිරිපත් කරා කියනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ගිය කමිටුවට මේ සැලැස්ම ඉදිරිපත් කරා කරලා සාකච්ඡාත් කළා.

<u>**මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, උක්ත කරුණ සලකා බැලූ කමිටුව භූමිදාන කටයුතු සිදු කිරීම සඳහා සකස් කරන ලද සැලැස්මේ ඉදිරිකටයුතුම්ළඟ සතිය තුළ ආරම්භ කිරීමට හා එහි ප්‍රගතිය පිළිබඳ වාර්ථාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වමි. දැන් කෝ වාර්ථාවක් මේකනේ ඊළඟ කමිටුව.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කාරණය තිබුනේ අපේ කාර්මාන්ත අංශය එක්ක ගිහින් ඒ තැන් පරීක්ෂා කරලා ඒ කටයුත්ත කරන්න. ඒ කාරණය කෙරුණ නැති නිසා තමයි ඊළඟ කමිටුවට දාලා තියෙන්නේ.

**(සභාවේ ඝෝෂා)**

<u>**මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මට කියන්න සභාපතිතුමා ඊළඟ කමිටුවට මේ සැලැස්ම එන්නේ නගරාධිපතිතුමා අපි ළඟ මේ තියෙන සුසාන භූමිවල ඉඩ, සිහිවටන කුළුණු හැරුනම ඉඩ ප්‍රමාණයක් තියෙනවානේ, ඔය භූමි ප්‍රමාණය යම් මොකක් හරි නිශ්චිත අංක ක්‍රමයකට යන එක නේද මෙහි

තියෙන්නේ අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා මම වැරදිනම් කියන්න දැන් අපි හදන්න ඕන ප්ලෑන් එක තියෙන භූමි ප්‍රමාණයේ යම් නිශ්චිත අංක දාලා හදන ප්ලෑන් එකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම බාධා කරනවා නෙවෙයි මම පැහැදිලි කරන්නම්. මෙය බොහොම පැහැදිලිව ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට අපි උපදෙස් දුන්නේ මෙය තියෙන භූමි ප්‍රමාණය සම්පූර්ණයෙන්ම මැනලා එක මිහිදන් කළ යුතු ප්‍රමාණය සහ ඊට කටයුතු කරන්න අවශ්‍ය ඉඩ ප්‍රමාණය තියලා එහි සැලැස්ම එතුමා හදලා තිබුණා. එ අනුව එක අංක කරලා එ අංක මිශ්‍ර ආදායම් අංශයේත් තියලා මෙහේ යම් අයෙක් වළකට මුදල් බඳිනවනම් එ ආදාල අංකය දෙනවා එ ආදාල අංකය තමයි එතනට අරන් යන්නේ. එතන විතරයි වල කපන්න පුළුවන්. එක තමයි අපේ සැලැස්ම.

<u>මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එක තමයි වෙන්න ඕන, කවදා ඉදලා මෙය ක්‍රියාත්මක වෙනවද කියන්නකෝ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මෙය බොහෝ කාලයක් ඉදන් අපි කතා කළා. නමුත් කමිටුවට ගේන්න හම්බවුනේ ගිය කමිටුවේ. දැන් ඒ ගෙනල්ලා ගොඩක් කටයුතු ඉවර වෙලා තියෙන්නේ. දැන්භූමියේ කටයුතු ටික තමයි ඉවර කරන්න තියෙන්නේඑය අපි ඉතාම ඉක්මණින් අවසන් කරනවා.නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ඔබ මට වඩා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් මේ සභාවේ, එ නිසා ඔබ දන්නවා මේ නිලධාරින් සමඟ වැඩ කරද්දි හරියටම දිනයක් කියන්න බැහැ මට. අපි සමහර වේලාවට කාර්මාන්ත අංශයේ නිලධාරින් මෙයට සම්බන්ධ කර ගන්නවා සෞඛ්‍ය අංශයේ නිලධාරින් මෙයට සම්බන්ධ කර ගන්නවා, ඊට වඩා හදිස්සි වැඩකට කියලා කර්මාන්ත අංශයේ සේවකයින්ට සහ නිලධාරින්ට වෙන වැඩකට යොදවලා තියෙනවා. එහෙම දේවල් තියෙනවා, ඉතින් එහෙම මට නිශ්චිත දිනයක් කියන්න බැහැ. නමුත් අපි උත්සහ කරනවා මෙතනටම මේ වැඩේ ගෙනවා වගේ තවදුරටත් මේ වැඩේ ඉදිරියට අරන් ගිහින් ඉවර කරන්න.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාට දේයක් කියන්න අමතක උනා. මේ වෙනකොට අපේ සහ නාගරික සංවර්ධන අධිකාරිය දෙකේම ඒ තියෙන්නා වු ගිණුම් වලින් ලක්ෂ 62ක මුදලක් අඟුලාන, කොරළවැල්ල, එගොඩඋයන කියන සුසාන භූමි වල ප්‍රතිසංස්කරණ කටයුතු වලට යොදවලා ඇස්තමේන්තුත් සකස් කරලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී- කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, හොඳයි ඉදිකිරීම් වලට ඇස්තමේන්තු සකස් කර කරම ඉන්න, ඔබතුමා ඔය කියපු කාරණයට මම එකඟ නැ සියට සියක්ම නමුත් මට ඕන ඔබතුමාව උනන්දු කරවලා මේ ප්ලෑන් වලට ආදාලව මෙය ක්‍රියාත්මක වෙන්න මොකද බලන් ඉන්න බැහැ කෙනෙක්ගේ දේහයක්, ඔවුන්ට දොස් කියන්නත් බැහැ වළක් හාරනකොට අමු එකක් උඩට එනවා. මොකද්ද කරන්නේ. කරන්න දෙයක් නැහැ. ඒ නිසා එය වෙනස් කිරීමයි අපේ මේ සංවාදයේ තියෙන්න ඕනෑ.ඒ වෙනස් කිරීමට ආදාළ මම කියන්නේ අපි මොනවා නතර කරලා හරි කමක් නැහැ නිලධාරින්ට මොන බලපෑමක් කරලා හරි කමක් නැහැ මෙය ඉක්මනින් හදලා ලබන මාසේ මෙය ක්‍රියාත්මක කරන්න. මොකද අපේ කාලේ ඉවරයි අපේ කාලය අවසන් වෙන වේලාවක අපි ඉන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි ප්‍රශ්නයක් තියෙනවා පළවෙනි එක තමයි මෙහි තියෙනවා 02(5) ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සෞඛ්‍ය හා සනිපාරක්ෂක පිළිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කරන ලද කසල වෙන්කිරීමේ කාර්යයේ නියුතු සේවකයින්ගේදිරිදීමනා ගෙවීම පිළිබඳ කාරණාව මෙහිදි රථවාහන අංශයේ සේවකයින්ට ගෙවලා තියෙනවා ජුලි මාසේ තුන්ලක්ෂ අසූපන්දහස් තුන්සියය පනහක් එතකොට ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශය සඳහා ගෙවලා තියෙන්නේ එකොලොස්දහස් දෙසීයය පනහයි ගරු

නගරාධිපතිතුමා අපේ බේල් අංගනයෙන් ලැබුණු ආදායම සම්බන්ධයෙන් පසුගිය මාසයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා දාලා තියෙනවා වාර්තාවක් 2022.08.01 දින සිට 2022.08.31 දින දක්වා විකුණුම් පිළිබඳ විස්තරය මම එක නැවත වරක් කියනවා. මම එය ගිය සභාවෙත් කිව්වා, මම නැවත වරක් කියනවා මෙම අයිතම ටික විතරද බොක්ස් බොඞ්, පත්තර බේල්, බෝතල් සුදු පාට, පාට බෝතල්, කඩදාසි, පොලිතින්,යෝගට් කෝප්ප මීට අමතරව එන ඒවා සම්බන්ධයෙන් ඔබතුමා එදා ප්‍රකාශයක් කළා ඒ මුදල් බඩු විකුණලා එ සේවකයින්ට ගෙවනවා කියලා. එතකොට මේතන මේ අයිතමයකුත් තියෙනවා සේවකයින්ට සභා අරමුදලින් ගෙවනවා කියලා ඉස්සල්ලා මම කියපු අයිතමයේ, මම අහන්නේ මොකද්ද මෙහි තේරුම, මෙහි ඇත්ත මොකද්ද කොහෙන්ද ගෙවන්නේ දැන් එතකොට මේ යකඩ විකුණන්නේ නැද්ද? පොල්කටු විකුණන්නේ නැද්ද? අලුමිනියම් විකුණන්නේ නැද්ද? මෙවා විකුණනවා එ විකුනන ආදායම කොහෙටද යන්නේ මකර කටටද? හමස් පෙට්ටියකට යනවද? එ ආදායමට මොකද වෙන්නේ එක අපිට දැන ගන්න ඕනෑ?

__නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රීතුමා, ආදායම යන්නේ ඔවුන්ට, ගෙනවාම එවෙලෙම කිරලා අරන් ඔවුන්ට දෙනවා.

__මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා__

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ සේවකයින්ට දෙනවා, ඒ ගෙන ගාණටමයි විකුණන්නේ

__නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රීතුමා, සුබසාධනය සඳහා දැනට ලක්ෂ තුනහාමාරක් විතර බැංකු ගතවෙලා තියෙනවා. කොවිඞ් කාලේ බෙහෙත් හෙත් කලෙත්, කෑම බීම දුන්නෙත්ඒ මුදල් වලින්.

__මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා__

ගරු නගරාධිපතිතුමා, මම නැවත වරක් කියන්නේ සමන්ලාල් ප්‍රනාන්දු බෝතල් පත්තර කඩයක් දාගත්තු කාලේක ඕක කර ගන්න මේ තනතුරෙන් ගිහිල්ලා ඕවා කර ගන්න එතකොට අපිට ප්‍රශ්නයක් නැහැ. බොහොම හොඳයි ව්‍යවසායකයෙක් විදිහට තමන්ගේ සේවකයෝ ගැන හිතන එක බොහොම හොඳයි හැබැයි මේ මොරටුව මහා නගර සභාව මෙය පාලනය කරන්න ඕනෑ. මහා නගර සභා ආඥා පනතඅතුරු ව්‍යවස්ථාව රජයේ ඒ තියෙන නීති රේගුලාසි ප්‍රතිපත්ති වලට තමයි මහා නගර සභාව පාලනය කරන්න ඕන නගරාධිපතිවරයාට හෝ මහජන සෞඛ්‍ය පරික්ෂකවරයාට බැහැ තීරණය කරන්න මම මෙවා විකුණලා සේවකයින්ට සල්ලි බෙදනවා කියලා. අනෙක් පැත්තෙන් අපි හොයලා බලපු විදිහට සේවකයන්ට ඔය කියන විදිහට දෙන්නේ නැහැ. මේවා අමු දවල් කරන මන්කොල්ලයන් මේ බෙල් එක මන්කෝල්ල කන ස්ථානයක් බවට පත් වෙලා තියෙන්නේ, මෙය නගරාධිපතිවරයා සහ ඉහළ නිලධාරින් කිහිප දෙනෙක් මන්කොල්ලා කන ස්ථානයක් බවට පත්වෙලා තියෙනවා.තවත් එකක් තියෙනවා අපේ ගරු සභාහපතිතුමාගෙන් අහන්න, සුරේෂ් මන්ත්‍රීතුමා කියනවා එතුමා ව්‍යාපෘතියක් පටන් අරන් තියෙනවා කියලා නාගරික කොමසාරිස් මඟින් ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් කමිටුවට ඉදිරිපත් කළ හරිත දැයක්, වගා සංග්‍රාමය 2022 වාර්ථාව පිළිබඳ සළකා බැලීම, උක්ත කරුණ සලකා බැලු කමිටුව හරිත දැයක් ව්‍යාපෘතියේ ආරම්භක වැඩ සටහන 2022 සැප්තැම්බර් 17 දින පැවැත්වීමට නියමිත බව කමිටුවට ප්‍රකාශ කරන ලදී. එ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදි. දැන් මෙහි අන්තර්ගතය මොකද්ද, මෙය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා මෙහි ඇමුණුමක් නැහැ, මෙය සැප්තැම්බර් 17 ආරම්භත් කරලා. මෙය ආරම්භ කලානම් කොහෙන්ද කලේ, මොකද්ද මේ යටතේ කෙරෙන්නේ, සුරේෂ් මන්ත්‍රීතුමා කියනවා මේ මේ දේවල් කරලා තියෙනවා මේ දේවල් හොඳයි කියලා එත් අපි දන්නේ නැහැ මෙහි කිසිම දේයක්, මෙවා තමන්ගේ ආසනයට විතරක් වෙන වැඩ සටහනක්ද කියලා අපි දැන ගන්න ඕ්න. මෙවා අම්මාගේ අප්පාගේ හුදලේ නෙමෙයි. මොකක් හරි වැඩ සටහනක්නම් සභාව දැන ගන්න ඕ්න එ සම්බන්ධව.

**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා අටවෙනි මාසේ කමිටුවෙදී මෙහි තියෙනවා මොකද්ද මේ කරන්නේ කියලා.

**මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, අටවෙනි මාසේ කමිටුවේ තියෙන එක හරි එත් මෙහි තියෙනවා සැප්තැම්බර් මාසේ 17වන දින පැවැත්වීමට ආරම්භ කලා කියලා, ආරම්භ කරලා මොනවද කළේ,

**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

මහා නගර සභා මන්ත්‍රීවරුනි, ආරම්භ කරලා කළේ මොකද්ද කියලා අටවෙනි මාසේ කමිටුවේ තියෙනවා මොකද්ද කරන්නේ කියලා.

**මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, කරන්නේ මොකද්ද කියලා නෙමෙයි අහන්නේ 17 වෙනිදා කරේ මොකද්ද කියලා අහන්නේ, මේ සභා වාර්ථාවක් යනකොට සභා වාර්ථාව ගිය අවුරුද්දට ගිහින් බලලා එන්න බැහැ, මෙහි හැම එකකම තියෙනවා ඇමුණුම්.

(සභාවේ ඝෝෂා)

තව පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න තියෙනවා, TLC පුස්තකාල ගොඩනැගිල්ල සම්බන්ධව, ඇමුණුම් අංක 6, හි සමන්ලාල් ප්‍රනාන්දු, ප්‍රදීප් ශ්‍රියන්ත, සී අයි යමසිංහ නාගරික ඉංජිනේරු, බී කේ ඒල් මෙන්ඩිස්තාක්ෂණ නිලධාරි. 2022.09.01 දින උක්ත කරුණ පිළිබඳව ගරු නගරාධිපතිතුමා සමඟ සාකච්ඡා කළ අතර එහිදි ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ලබා දී ඇති වාර්ථාව පිළිබඳව ගරු නගරාධිපතිතුමාව දැනුවත් කරන ලදි. එම වාර්ථාවේ ලබා දී ඇති නිර්දේශද මේ සමඟ අමුණා ඇති අතර එහිදි ගරු නගරාධිපතිතුමා විසින් පහත පරිදි කටයුතු කිරීම උදෙසා උපදෙස් දෙන ලදි.TLC පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ස්ලැබ් හා බිම ඇතුළ කඩා ඉවත් කර තනිමහල් ගොඩනැඟිල්ලක් ලෙස සංවර්ධනය කර ගොඩනැඟිල්ල තුළ මාතෘ සායනය හා පුස්තකාලය ස්ථාපිත කිරීම. මෙම කරුණ පිළිබඳ සෞඛ්‍ය කමිටුව දැනුවත් කිරීම හා ඉදිරි කටයුතු කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කරමි. දැන් මොකද්ද මේ කමිටුව මේ සෞඛ්‍ය කමිටුව එතකොට මේ කමිටුවේ TLC පුස්තකාල ගොඩනැගිල්ල සම්බන්ධව කොහොමද තියෙන්නේ.

**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, මෙහි සායනයත් තියෙනවා මේ දෙකම තියෙන්නේ එකම ගොඩනැගිල්ලේ.

**මහා නගර සභා මන්ත්‍රී-ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, මේ දෙකම තියෙන්නේ එකම ගොඩනැගිල්ලේ තමයි. මේ නගර සභාවේ ආයතන අංශය තියෙනවා, වරිපනම් අංශය තියෙනවා, ඔක්කොම එකම ගොඩනැගිල්ලේ තියෙන්නේ එක හරි මන් අහන්නේ මේ ගොඩනැගිල්ලක් හදන එකක් කොහොමද මේ සෞඛ්‍ය කමිටුවට එන්නේ, මෙය එන්න ඕනේ කර්මාන්ත කමිටුවට, ගොඩනැගිල්ල හැදුවට පස්සේ ගිහින් සායනය දාන එක සෞඛ්‍ය කමිටුවට දැම්මට කමක් නැහැ, මෙය කතා කරන්න ඕ්න කර්මාන්ත කමිටුවේ. මේ සාකච්ඡාවේ ප්‍රධානියා නගරාධිපතිතුමා උනාට කමක් නැහැ, එත් මෙහි ප්‍රධානියා වෙන්න ඕ්න කාර්මාන්ත කමිටුවේ සභාපති, කමිටුව තමන්ගේ පැත්තේ තිබ්බා කියලා තමන්ට වුන් වෙන්න මෙවා දාන්න එපා, සායනය සම්බන්ධ ගැටළුවක්නම් සෞඛ්‍ය කමිටුවට දැම්මට ප්‍රශ්නයක් නැහැ හැබැයි මෙය එහෙම ප්‍රශ්නයක් නෙවෙයි මෙය

ගොඩනැගිල්ල හදන එක සම්බන්ධ ගැටළුවක්, නිකන් අනවශ්‍ය වැඩ නොකර මෙවා යන්න ඕ්න තැනට යවන්න. මෙහි ඇමුණුම් අංක 6 කියලා තියෙනවා එත් මෙහි අයිතමයක් නැහැ.

**ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

සෞඛ්‍ය කමිටුවේ තමයි කථාකරන්නේ ක්ලිනික් එක ගැන. එතකොට TLC පුස්ථකාලය තමයි ඉස්සෙල්ලාම හැදුවේ. TLC කියන්නේ ගෞරවනිය සභාපතිවරයා මේ නගර සභාවේ එතුමා පුස්ථකාලයක් ස්ථාපිත කරනවා. මේක වැඩිදියුණු කරලා පුස්ථකාලයක් සහ ක්ලිනික් එකක්. එතකොට මේකේ ක්ලිනික් එකේ සම්පූර්ණයෙන්ම යථාවත්කිරිමේ කටයුත්ත කරලා ටයිල් අල්ලලා පාඨලි චම්පික ඇමතිතුමාගේ මුදල් වලින් සජිත් දුමින්ද පිරිස් ගරු මන්ත්‍රිතුමා ඉටු කලා. එතනට අපි ගියේ දෙකම තියාගන්නේ කොහොමද කියලා බලන්න. මොකද අපි ඕනම වේලාවක ගිහිල්ලා කමිටුවට පරික්ෂාකරලා බලන්න කියනවානේ. අපි ගියා. ගියාට පස්සේ එතන ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් කියලා තියෙනවා එතන අපි යන වෙලාවෙත් දැක්කා කම්බි මතුවෙලා කම්බි කැඩිලා එක නිසා මේක තියන්න බැහැ අනිවාර්යෙන්ම අයින් කරන්න කියලා. එහෙම අයින් කරා අපේ පෙර පාසල සාගරිකා පෙර පාසලත් ඔය විදියටම අයින් කරන්න කියලා අයින් කරලා තනි මහලකට ගෙනාවා. අදාල වෙන්නාවූ කාරණය තියෙන්නේ සෞඛ්‍ය කමිටුවේ. සෞඛ්‍ය කමිටුවෙන් ටෙන්ඩර් කැදවන්නේ නැහැ. මේකට ජොබ් එක අයිති කර්මාන්ත කමිටුවෙන් තමයි වැඩේ යන්නෙ. අදාල වෙන්නාවූ කමිටුවෙන් තමයි වැඩේ කරන්නේ. අපිට පුලුවන්කමක් නැහැ කර්මාන්ත කමිටුවට අරගෙන මේ සබ්ජෙක්ට් එක කථාකරන්න. එහෙම කොහොමද කරන්නේ. එහෙනම් සෞඛ්‍ය කමිටුවක් ඕන නැහැනේ. මේ සම්පූර්ණ වැරදි කථාවක් මේ කියන්නේ. මේ කථාකරන්නේ සෞඛ්‍ය සබ්ජෙක්ට්එක කථාකරන්න ඕන කමිටුවෙන් කථා කරනවා. මේ ජෝබ් එක කරනකොට සිපිඑච්අයිට පවරන්නේ නැහැ බිල්ඩින්එක හදන්න. එක පවරන්නේ ඉංජිනේරුට එතකොට එක කර්මාන්ත කමිටුවට යනවා. එක අපි දන්නවා.

**මහා නගර සභා මන්ත්‍රි - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි,දැන් ඔබතුමා කියපු එක සබ්ජෙක්ට් එක තියෙන එකෙන් කථාකරන්න ඕන කියන එක අපි පිළිගන්නවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. අපි අහන්නේ ගොඩනැගිල්ලක් හදනකොට ගොඩ නැගිල්ලක් අලුත්වැඩියා කරන කොට ගොඩනැගිල්ලක් ස්ථාපනය කරන කොට ඒක කර්මාන්ත කම්ටුවෙන් එන්න ඕනයි කියන එකයි අපි කියන්නේ. මට පොඩ්ඩක් කරුණාකරලා කියන්න මේ ඇමුණුම් අංක 6 කියලා තියෙනවානේ මෙතන එක ආපු කරුණ කොහෙද කියලා තියෙන්නේ.

**ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමා,අංක 2(7) කියවන්න. කියවලා පස්වෙනි පිටුවට යන්න උඩ තියෙනවා ඇමුණුම කියද කියලා. ඒම්ඔඑච් එවලා ඔක්කොම තියෙනවා. මේවා හරියට කියවන්න ඕනේ. මේවා කාලේ කන්න කථාකරන එක වැරදියි. අපි දන්නවා සජිත් දුමින්ද පිරිස් ගරු මන්ත්‍රිතුමා සෞඛ්‍ය කමිටුවේ කථාකරලා හදන්න ආවාට පස්සේ කර්මාන්ත කමිටුවෙන් තමයි ඉංජිනේරු අංශයෙන් ඇස්තමේන්තු කරේ. හරි නේද මැතිතුමා? මම කියන එක එහෙම තමයි කලේ. එහෙම තමයි කරන්නේ. එහෙම නැතිව මම දෙන්න යැයි සිපිඑච් මහත්තයාටයි ඩොක්ටර්ටයි මේක කරන්න කියලා.

**මහා නගර සභා මන්ත්‍රි - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි,මතක් කරන්න ඕනේ සෞඛ්‍ය කමිටුව මෙච්චර කාලයක් ගරු නගරාධිපතිතුමනි පවුල් සෞඛ්‍ය සේවිකාවන් නියෝජනය කරේ නැහැ. අපි මැදිහත්වෙලා විශේෂයෙන් උපදෙස්දීලා දැන් සැම සෞඛ්‍ය කමිටුවකටම ඒ සියලුම සායන වල වැඩකරන පවුල් සෞඛ්‍ය නිලධාරින් සහභාගිවෙනවා. ඒ විතරක් නෙමෙයි මේ පැත්ත බලලා ඉන්න පැත්ත වුන්වෙන්න වැඩකරන මිනිස්සු නෙමෙයි අපි. ඒක නිසා පහුගිය සෞඛ්‍ය කමිටුව දැක්කානම් බලන්න ඇති හැම ප්‍රදේශයකම සැම සායනයකම අඩුපාඩු අපි ඔවුන් හරහා අරගෙන ඒක පිළිබඳව නිරන්තර සාකච්ඡාකරලා ඉංජිනේරුතුමාව හෝ ඉංජිනේරුතුමියව කමිටුවට ගෙන්න ගෙන එවා කොයිකාලේද ඉවර වෙන්නේ කියලා නිරන්තර සාකච්ඡාකරලා මේ මොහොත වෙනකොට සායන ගණනාවක කටයුතු අපි අවසන් කරා. ඒ අවසන් කරලා ගරු නගරාධිපතිතුමනි ඉතා විශාල කටයුත්තක් විදියට තියෙන්නේ ටිඑල්සි පුස්ථකාලය තියෙන ගොඩනැගිල්ලේ තියෙන සායනය. එතකොට ඒ ගොඩනැගිල්ලෙ තියෙන සායනය පහල මාලයේ ඉතා අලංකාරවත් සජිත් දුමින්ද මන්ත්‍රිතුමා

කටයුතු කරලා තිබුණා. චම්පික රණවක මැතිතුමාගේ ප්‍රතිපාදන අරගෙන ගරු නගරාධිපතිතුමා ස්ථාන පරික්ෂාවට ගිය වෙලාවේ එතුමා කිව්වේ මේක කඩන්නැතිව මේක කොහොම හරි කරන්න කියලා තමයි මේතුමා තිරණය දුන්නේ. නමුත් අපිට කර්මාන්ත අංශයෙන් සෞඛ්‍ය කමිටුවට වාර්තාවුනාම මේක ගොඩනැගිලි පර්යේෂණ ආයතනය දන්වලා තියෙනවා මේක මේවිදියට කරන්න එපා එක නැවත නගරාධිපතිතුමා දැනුවත් කරාම අපි කරන්න ඕන එක කමිටුවට වෙලා ඉන්නේ නැතිව නිලධාරි එකතු කරගෙන ගිහිල්ලා නගරාධිපතිතුමා මුන ගැහිලා නැවත ඒ ගත්ත තිරණය වෙනස්කරන්න අවශ්‍යතාවයට මැදිහත් වෙලා තමයි මේ තිරණ අරගෙන මේ කටයුත්ත කලේ. ඒනිසා මේක කර්මාන්ත ද සෞඛ්‍යද කියලා බලලා නෙමෙයි. අපේ මහජනතාව වෙනුවෙන් පවත්වන සේවාවන් පවත්වාගෙන යන්න ඒ අවශ්‍ය කටයුතු කරලා අපි කොයිම වෙලාවකවත් කර්මාන්ත අංශයේ කටයුත්ත කර්මාන්ත අංශයෙන් තමයි කරන්නේ. හැබැයි සායන පවත්වාගෙන යැමේ වගකිම්වලට ගරු නගරාධිපතිතුමනි අපි මැදැහත්වෙන්න අවශ්‍ය හින්දා තමයි සෞඛ්‍ය කමිටුව විදියට මැදැහත් වෙලා මේක කරේ. ඒනිසා කාටහරි නම් එක්ක ප්‍රශ්න තිබුනත් පුද්ගලයෝ එක්ක ප්‍රශ්න තිබුනා කියලා මේ ආයතනයේ දෙවල් එක්ක ඒ විදියට කටයුතු කිරිම වැරදි කියන එක තමයි අපේ නිගමනය.

ගරු නගරාධිපතිතුමනි මම ඒ කාරණය පිලිබඳව තවදුරටත් කථාකරන්නේ නැහැ. සංතෝශවෙනවා නිශාන්ත ප්‍රදිනාන්දු මැතිතුමාටත් සුදේශ් මන්ත්‍රිතුමාටත් සුසාන භූමි සම්බන්ධකාරනය මතු කිරිම සම්බන්ධයෙන් සමහර දෙවල් තියෙනවා ගරු මන්ත්‍රිතුමනි අපි කමිටුවලදි නිලධාරින්ගෙන් කෙරෙන්නේ නැති කටයුතු සම්බන්ධයෙන් නිලධාරින් එක්ක කථා කරගත්තට මේ සභාවට ඇවිල්ලා ඒ නිලධාරින් සම්බන්ධයෙන් කථාකරන්නේ නැහැ. ඒක අපි වගකිමෙන් කටයුතු කරනවා. අපිටත් එකේ වගකිමක් තියෙන නිසා. හැබැයි සමහර වෙලාවට මේක මතුවෙච්ච නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමාගේ දැනගැනිම සඳහා කියන්නට ඕනේ මේ සුසාන භූමිවල ඒ සැලැස්ම අරගෙන ඒ සැලැස්මට අනුව ස්ථාන ලකුණු කරන්න ගියාම අපි බෝහොම ප්‍රායෝගික ප්‍රශ්නවලට මුහුණ දුන්නා. එක දවසකට ගණකාධිකාරිතුමිය ලණු ටිකට මුදල් දිලා නැහැ කියලා ප්‍රශ්නයක් ආවා. එහෙම ප්‍රශ්න තියෙනවා. ඊට පස්සේ එක නැවත කථාකරලා විදිමත්විදියට ගිහිල්ලා නැහැ කියලා ප්‍රශ්න. ඒවගේ කාරණා තියෙනවා ගරු නගරාධිපතිතුමනි. ඒක නිසා මම ඒ ගැන වැඩිය කථාකරන්නේ නැහැ. ඔබතුමා බලාපොරෝත්තු විදියට ඉතාම ඉක්මණින් කටයුත්ත අවසන් කරලා ඉදිරිපත් කරන්න බලාපොරෝත්තුවෙනවා. ඒ කටයුත්ත විදිමත් කරන්නත් බලාපොරෝත්තුවෙනවා. ඒවගේම තමයි අපේ රසායනාගාර සේවය ගැන කථාකරා. ඒ රසායනාගාර සේවය පිළිබඳවත් මම හිතන්නේ සෞඛ්‍ය කිමිටුවේ අපි නිරන්තර අධීක්ෂණයක් කරනවා. ඒ රසායනාගාරයට අවශ්‍ය කරන දේවල් තියෙනවාද කියලා ඒ කටයුත්ත කරනවා.

<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,රසායනාගාර සේවය ලංකාවේම තියෙන්නේ පලාත් පාලන ආයතන දෙකක විතරයි. කොළඹයි මෙහෙයි විතරයි.

<u>මහා නගර සභා මන්ත්‍රි - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,එක ජනතාවිමුක්ති පෙරමුණේ යොජනාවක් පරිදි කරා කියලා කවදාවත් අපි පස්සට අදින්නේ නැතිව එක ඉතාම ඉක්මණින් විවෘත කරා. ඒ විතරක් නෙමෙයි අපි තිරණයක් ගත්තා ගරු නගරාධිපතිතුමනි මේක ඇතුල් වෙලා නැහැ දැන් ඩෙංගු පරික්ෂාව රෝගය ව්‍යාප්තවෙලා තියෙන නිසා අපි බැලුවා මහ නගර සභාවේ මේ පරික්ෂණය කරගන්න ප්‍රතිලාභින් එනවා බොහෝම අඩුයි. ඒකට හේතුව තමයි තාම මේ බලප්‍රදේශයේ අය මේ සේවය අපි කරනවා කියලා දන්නේ නැති නිසා අපි සෞඛ්‍ය කමිටුව තිරණයක් ගත්තා හැකි ඉක්මණින් නැවත ඒ පිළිබඳවත් ජනතාව දැනුවත් කිරිමේ වැඩසටහනක් කරන්න. දැනට අපි අපේ ඩෙංගු පරික්ෂණ කණ්ඩායම හරහා ගෙවල්වලට වාචික ප්‍රකාශයක් කරමින් යනවා. ඊට අමතරව එක අත්පත්‍රිකාවක් මගිනුත් ඒ කාර්යය දැනුම් දෙන්න. අපි සෞඛ්‍ය කමිටුවේදි සාකච්ඡාකරා ගරු නගරාධිපතිතුමනි එක මේ සභාවේ දැනගැනිම සඳහා කියන්න ඕනේ.

ගරු නගරාධිපතිතුමනි මම විශේෂයෙන් සුරේශ් ඉන්දික මන්ත්‍රිතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ කාරණය සම්බන්ධවෙච්ච නිසා එහි හරිත දැයක් වැඩසටහනට සමගාමීව මේ මෙහෙවර වැඩසටහන පිළිබඳව එතුමා ඒ වැඩසටහන දැකපු නිසා එතුමා කථාකලා. මම ස්තුතිවන්ත වෙනවා ගරු නගරාධිපතිතුමනි එතුමා විශේෂයෙන්ම සුරේශ් ඉන්දික මන්ත්‍රිතුමා මේ කාරණයට අදාල මූලික වැඩසටහනේ දි එක මතක් කරා.

එතුමත් ජේෂ්ඨ සමගාමී යෝජනාවක් ඉදිරිපත් කරා. ගරු නගරාධිපතිතුමනි ඒ කාරණය පිලිබඳව සෞඛ්‍ය කමිටුවේ දිර්ඝව සාකච්ඡාකරලා මේක කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව දැනුවත් කරලා මේ ආයතනයේ නිලධාරින් සමග කරන වැඩ සටහනක. ස්තුතිවන්තවෙනවා විශේෂයෙන්ම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා විශාල වෙහෙසක් මහන්සියක් තම රාජකාරි වෙලාවෙන් බැහැරවත් කටයුතු කරලා ඒ වගේම ප්‍රජා සංවර්ධන අංශයත් මේ වෙනුවෙන් මැදිහත් වෙනවා.ඒවගේම තමයි මේ සභාවේ දැනගැනිම සඳහා කියනවා මේක බොහොම විනිවිධයි. මේක ප්‍රතිලාභින් කවුද කියන එක පිළිබඳව ප්‍රජාසංවර්ධන අංශයේ බොහෝම පැහැදිලිව තියෙනවා අදාල ප්‍රතිලාභින්ට පමණයි අත්සන් ලේඛනය අනුව ඒ අයට විතරයි මේක දෙන්නේ. නැතිව මගේ ඡන්දයට පෝස්ටර් ගහපු අයට පිටිපස්සෙන් ගිය අයට නෙමෙයි වගා කරන අයට දෙන වැඩ සටහනක් මේක මොරටුව ඇතුලේ හැමෝටම ක්‍රියාත්මකයි. සභාවේ මන්ත්‍රිවරු විදියට ඔබටත් පුලුවන් ප්‍රජාසංවර්ධන අංශයත් එක්ක සම්බන්ධවෙලා ඔබේ බලප්‍රදේශයේ මේ කටයුත්ත කරන්න අවශ්‍යනම් ඒ අදාල නාම ලේඛනය කලින් දිලා අපිට යෝජනා එනවා හරි අරගෙන එන්නකෝ ගමට අරගෙන ආවාම අපි බෙදලා නාම ලේඛනය දෙමු. අපි ඒකට වඩා ක්‍රමවත් විදියට යන්නේ කලින් නාම ලේඛනය අරගෙන ඒ අදාල නිලධාරින් අරගෙන ගමට ගිහිල්ලා ඒ ප්‍රතිලාභ ටික අරගෙන ගමට ගිහිල්ලා ඒ ලේඛනයේ තියෙන අයට ඒ ප්‍රතිලාභ ටික දිලා ඒ විදිමත් විදියට මේ ආයතනයේ නිලධාරින් හරහා කරන වැඩසටහනක් කරන්න ඒක නිසා මොවාහරි සැකයක් කුකුසක් විචිකිච්චාවක් සංකාවක් තියෙනවානම් ඒ පිළිබඳව හොයලා බලන්න. හොයලා බලලා අවධානයෙන් කටයුතු කරලා පුදනකොටම කාපි යකා වගේ හැම එකක් දිහාම සැකෙන් බලලා එහෙම කරන්න එපා. එහෙම කරන්නේ නැතිව මේක දිහා බලන් ඉදලා අවධානයෙන් ඉදලා හොයලා බලන්න. හැබැයි ගරු නගරාධිපතිතුමනි මේක පිළිබඳවත් දැන් වැඩ ආරම්භ වෙච්චවෙලේ කියන්න ඕනේ නගරාධිපතිතුමනි අපි දැන් මූලික වැඩසටහන මොරටුව මහා නගර සභා පරිශ්‍රයේ කරා. ඊට පස්සේ වැඩ සටහන් දෙකක් ග්‍රාමසේවා වසම් මට්ටමෙන් කරන වැඩ සටහන් ආරම්භකරලා තියෙනවා. මෝදර එගොඩඋයන දකුණු ප්‍රදේශයෙත් එගොඩඋයන මධ්‍යම ප්‍රදේශයෙත් අපි වැඩසටහන් දෙකක් දැන් ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක වෙනවා මුලු මොරටුවම ආවරණය වන පරිදි. අපි මේ කටයුත්ත සිදුකරමින් යනවා මූලික වශයෙන් ප්‍රතිලාභින් පනස් දෙනෙකුට තමයි කමිටුවේ තිරණය වුනේ එක ගමක ප්‍රතිලාභින් පනස් දෙනෙකුට මූලික වශයෙන් දෙන්න. ඊට වඩා ඉල්ලිම් තියෙනවානම් අපි ඒ ගැනත් සලකලා බලනවා. ගරු නගරාධිපතිතුමනි මේ ආයතනය විදියට මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලිමක් කරනවා මේ වැඩසටහන අපි මාස දෙකක් ඇතුලත මොකද දිර්ඝකාලිනව මේක කර කර ඉන්න පුලුවන්කමක් නැහැ. ඉතාම ඉක්මණින් ජනතාව අතරට බෙදලා ජනතාවට මේක ප්‍රතිලාභ ලබාදිය යුතු වැඩසටහනක් නිසා මේක මාස දෙකක් ඇතුලත මුලු මොරටුවම ආවරණය වන පරිදි කරන්න තමයි අපේ උත්සාහය. අපේ අරමුණ. ඒක නිසා හැබැයි මේක ක්‍රියාත්මක කරන කොට මේ ආයතනික වශයෙන් පහසුකම්වල යම් බාධාවන් තියෙනවා. ඔබතුමාගෙන් ඉතා වුවමනාවෙන් ඉල්ලා සිටිනවා ඍජුව මැදිහත්වෙන්න. මැදිහත්වෙලා මේක නිවැරදිව කරන්න අවශ්‍ය ඕනම නිලධාරි කෙනෙක් මේ වෙනුවෙන් පත්කරලා එක අධික්ෂණය කරන්න නාගරික කොමසාරිස්තුමා ඇතුලු ඕනම නිලධාරියෙක් ඒක්ක මේ වැඩසටහන කරන්න අවශ්‍ය කරන ඍජු අධික්ෂණයක් යටතේ කරලා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම විතරක් අපිට අවශ්‍ය වෙන්නේ. වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ තලයේදි අපි ඒ සඳහා මැදිහත් වෙනවා ඒකනිසා ගරු නගරාධිපතිතුමනි ඒ සඳහා කටයුතු කරන්න කියන ආදරණිය ඉල්ලිම කරමින් මේ වැඩසටහන් පිළිබඳව ඔබේ උනන්දුව පිළිබඳව සියලුම මන්ත්‍රිවරුන්ට නැවත වතාවක් මගේ ගෞරවය ප්‍රකාශකරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රි - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ සිවිච් රේසිඩන්සිස් ගැන ගොඩක් අය කථා කරා. මටත් කෙටියෙන් පොඩි අදහසක් ඉදිරිපත් කරන්න තියෙනවා මේ සිවිච් රේසිඩන්සිස් එකේ මිනිස්සු මේ ගෙවල් ගන්න කොට මේ මිනිස්සු මේ ප්‍රශ්නය දැනගෙන හිටියේ නැහැ. මෙතන ප්‍රශ්නයක් තියෙනවා කියලා අපි දන්නවා. නමුත් ඔබතුමා මේ කරන වැඩෙන් ඒ මිනිස්සු සැහෙන අසරණතාවයට පත්වෙනවා. ඒ මිනිස්සු ඒ මිනිස්සුන්ගේ කුණු ටික ඇදගන්න බැරිව ලතවෙනවා. මොකද ඔබතුමාට තියෙනවානම් රජයක් එක්ක ප්‍රශ්නයක් ඔබතුමා ඒ රජයත් එක්ක ඒ ප්‍රශ්නය විසඳගන්න ඕනේ. එහෙම නැතිව මේ මිනිස්සුන්ගෙන් පලි අරගෙන මේ මිනිස්සුන්ගේ කුණු ටික අදින්නේ නැතිව බැහැ. ඒ නිවාස වලට විතරක් නෙමෙයි අද අහල පහල නිවාස වලටත් දුර්ගන්දය යනවා අහල පහල නිවාසත් ඉතාම අසිරුතාවයට පත්වෙලා තියෙනවා.ඒනිසා කරුණාකරලා රජයත් එක්ක තියෙන ප්‍රශ්න විසඳගන්න ඒ මිනිස්සුන්ගේ කුණුටික අයින් කරලා දෙන්න. කරුණාකරලා ලබන සතියවෙනකොට ඔබතුමා විසඳගන්නවා කියපු විදියට රජයත් එක්ක විසඳගන්න. මේ මිනිස්සුන්ට තියෙන ප්‍රශ්නය විසඳලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේදිනවල ආදාහනාගාරවල සේවය කරන සෞඛ්‍ය සේවකයන් තුල විශාල භීතියක් පවතිනවා ගරු නගරාධිපතිතුමනි. ඔවුන්ගේ ඉල්ලීම වෙන්නේ ශාන්තිකර්මයක් කරන්න වත් බලි තොයිල් කරන්නවත් නෙමෙයි. මේක අමුනුශ්‍ය දෝෂයක් නෙමෙයි. මනුෂ්‍ය දෝෂයක් තියෙන්නේ. අපි මීට මාස කිහිපයකට පෙර යකඩ වගයක් නැතිවුනා. ඊට පස්සේ ගෑස් නැතිවුනා. පසුගිය දිනයක අකුණු සංඥාවේ තඹ පටිය කැපුවා. ඉතින් මේකට ගත්ත පියවර මොකක්ද කියලා මම දන්නේ නැහැ. ලියුමකින් මම ඉල්ලීම කරා ඒ සම්බන්ධව කිසිම දෙයක් දැනගන්න විදියක් නැහැ. මොකක්ද කරපු පර්ක්ෂනය කියලා මේ අහිංසක සේවකයෝ ගරු නගරාධිපතිතුමනි අර බොහෝම දුක්ඛිත රස්සාවක් කරන සේවකයෝ කාගේ හරි ක්‍රියාකාරකමක් හින්දා අනෙක් සේවකයො බෝහොම භීතියට පත්වෙලා තමන්ගේ රැකියාවට මොනවා වෙයිද කියන එක. ඒ කියන්නේ ඔවුන් ගොඩක් අසරණයි. නගරාධිපතිතුමනි මේගොල්ලෝ මම යන යන වේලාවට ඔවුන්ගේ බොහොම කන්කෙදිරියක් වෙලා තියෙනවා. ඉක්මනට කරන්න කියලා යම්කිසි සේවකයෙක් මේගැන පාපොච්චාරණයක් කරලා තියෙනවා. කරලා පුලුවන් දෙයක් කරන්නත් කියලා තියෙනවා.එක හින්දා මේ සේවකයෝ අසරණවෙලා තියෙනවා මොකක්ද නගරාධිපතිතුමනි අලුත්ම තත්වය කියලා ඔබතුමාගෙන් විමසීමක් කරනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා මම හිතන්නේ කියපු ගමන් මම කොමසාරිස්තුමාට කථාකරා. දැන් මේවෙනකොට පරික්ෂණය වෙනවා කියලා කියනවා. ඕවා කථාකරන කොට යටගියාවල් එකපාරටම මතක් වෙනවා. දැන් මේ බඩු හොරකම්කරලා තියෙන්නේ මහ නගර සභාවේ. නමුත් යම් දිනයක් සම්බන්ධයෙන් කටයුතු කරලා තියෙනවා සේවකයො 417 කට දඩ බඩ දඩබඩ ගාලා දවස් දෙකෙන්. හොරා හොරකම් කරන ඒවා ඔක්කොම දැන දැන තාම මේ පරික්ෂණ ඉවර නැහැ. මට තේරෙන්නේ නැහැ. ඇයි කියලා මේ දඩ බඩාන් ගාලා දවස් දෙකකදි 417කට ගැහුවා. රැකියාවට හදිසියේ දුව දුව ළමයින්ව ගේන්න ගිය තාත්තලත් ඉන්නවා. රූ හයදාසිගණන් කපලා සේවය අත්හිටවලා දින තුන හතරවල් පඩි කපලා. හැබැයි මේක තාම නැහැ මම දන්නේ නැහැ ඇයි කියලා මේ සමහර වෙලාවට විපක්ෂය හිනා වෙන්නත් පුලුවන් විපක්ෂය හිතනවා ඇති අපි දිනුවා කියලා හිතන්නත් පුලුවන්. අපි ගැහුවා ගේම අපි දිනුම් කියලා අපිතාම මේගොල්ලෝ එක්ක ගේම් ගගහා ඉන්නේ. අපිත් මේක දූවාගන්න හර්තාල් කරමින් ඉන්නේ. නමුත් ඉතින් ගෑස් සිලින්ඩර් මේකේ මාර හොරකම් වෙන්නේ. ලොකු එක ගෙනල්ල හිස් එක තියලා පුරවපු එක ගෙනියනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමා ඔය ප්‍රශ්නය කථාකරන්න ඕනේ එක අපිට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා ප්‍රධානියා හැටියට කොමසාරිස්තුමාට උපදෙස් දෙන්න. හැබැයි මේ විපක්ෂය ගැන කථා කරලා විපක්ෂය චුන්වෙනවා. ඒවා කියන්න එපා. විපක්ෂය කිව්වාම අපිටත් වදිනවා. අපිත් මන්ත්‍රිවරුනේ ඔබතුමා දැන් කියපු එක ඉල්ලා අස්කරගන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම කිව්වේ ඔබතුමාට වරදක් නෙමෙයි සිද්ධවෙච්ච සිදුවීමක් සම්බන්ධව කථා කරේ.

**2022.09.07 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | |
|---|---|---|
| 01 නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05 මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06 මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07 මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |

| | | | |
|---|---|---|---|
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දු නිරෝෂන මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 27 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 28 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 29 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 31 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2022.09.07 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තීරණයකට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

**2022.09.07 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02 (10)ට විරුද්ධවත්, අනෙකුත් තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.07 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

**06(5) 2022.09.07 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**2022.09.07 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උපිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දු නිරෝෂන මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රි ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.07 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තීරණයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

**2022.09.07 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

**06(6) 2022.09.08 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,දැන් මේ වේලාවේ පොදුවේ අපේ රටත් ඒවගේම මූලික රාජ්‍ය පාලනයකරන ආණ්ඩුවත් ඒ රාජ්‍ය ආයතනත් අතිශය දුෂ්කර අර්බුදයකට මුහුණ දීලා මූල්‍ය ක්ෂේත්‍රයේ විවිධ තීන්දු තීරණ නිතිරීති චක්‍රලේඛන අනපනත් පනවමින් ඉන්නවා. ඒවා අදාල පලාත් පාලන ආයතන වලටත් අදාලයි. හැබැයි දැන් මේ අපේ අතේ තියෙන කර්මාන්ත කමිටුව ඇස්තමේන්තු විතරක් මට හිතෙන විදියට මිලියන පනහකට වැඩියි. මිලියන පනහකට වැඩිය මේ ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා අපේ ප්‍රශ්නය මේකයි දැන් පලාත් පාලන වලට අදාලවත් අපේ චක්‍රලේකන හරහා ඉදිකිරිම් සම්බන්ධයෙන් බොහෝ නිති පනවලා තියෙන වෙලාවක්. අපි අහනවා මේ ඇස්තමේන්තු දැන් මේ සභාව පුරුද්දක් විදියට කරගෙන ගියා. මේ සභාව මේ පාලක කණ්ඩායම දිගටම මේ පුරුද්ද පවත්වගෙන ගියා. දැන් මේ සභා අරමුදල් දැන් සභා අරමුදල් වැය කරන කොට අපි හදාගත්තු ඒ අදාල අතුරු ව්‍යවස්ථා අණපනත්වල කියන්නේ දැන් මේ මාර්ගය අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරයා යෝජනාවක් ලෙස ගෙනල්ලා ඒ පාරේ තිබෙන වැදගත්කම ඒ පාර හදන්න ඒ ජනතාවගේ ඉල්ලිම දැන් එහෙම සංවාදයක් සාකච්ඡාවක් කිසිවක් නැතිව මේ එක තැනක ඔලුවට එන අදහසක් අනුව දැන් මේ ඉදිරිපත් වෙච්ච ඇස්තමේන්තු තොගය කොහෙහරි තැනකින් ගත්තා. සභාවේ තියෙන මාර්ග ලේඛනය අරගෙන ඉවරවෙලා එවට අදාල කර්මාන්ත අංශයට දාලා ඇස්තමේන්තු හැදෙව්වා. දැන් මේ සභාවේ අනුමැතිය ගන්න දැන් මේ වේලාවේ කලයුත්තේ සමහර මාර්ග තියෙයි ප්‍රමුඛතාවය දීලා එය මොන නීති රීති තිබුනත් ජනතාවට ඒ සේවය ලබා දෙන්න ඕනා. සකස්කරන්න ඕනා මාර්ග තිබෙයි. කාණු තිබෙයි. හැබැයි මේ මොකක්ද මේ මොකක්ද මේ කාගෙද මේ ඕනකම මිලියන පනහකට එහා පැත්තේ කෝ යෝජනා කවුද ඒ වෙනුවෙන් කොට්ඨාශ මන්ත්‍රීවරයා මේ සභාවට කියනවාද මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ ප්‍රදේශයේ අදාල මාර්ගයේ ජනතාවගේ ඉල්ලිමක් මත. ඒ මිනිස්සු මාරවිදියට දුක්විදිනවා මේ පාර කැඩිලා බිදිලා වලවල් හැදිලා යන්න බැහැ කියනවා. අපි කැමතියි මේ මුදල් වියදම් කරනවානම් වියදම් කරන්න ඕනා. ඇත්තටම එහෙම සංවාදයක් සාකච්ඡාවක් මහජනයාගේ ඉල්ලිමක් සහිතවනේ ඒනිසා මේ වගේ ඇත්ත කථන්දරය තියෙන්නේ ඔබ දිර්ඝකාලයක් මේ වැඩේ කරා. ඔබත් එක්ක විවිධ සංවාද විවිධ මතවාද හරහා ගැටුම් බොහොමයක් තිබෙන ප්‍රධානම එකක් තමයි මේ. ඒනිසා මේ කර්මාන්ත කමිටුවට අපි විරුද්ධවෙන්නේ මේතරම් අමාරු වෙලාවේ ඔබ දන්නවා මේ සභාව හෙට දවසේ දැන් මේ අයවැයක් ගෙනල්ලා හෙට මම හිතන්නේ ඒ සාකච්ඡාව හතරගාතේන් ගිය අවුරුද්දට වඩා කඩා වැටිලා තියෙන්නේ. ගිය අවුරුද්දේ ඇති කරපු ණය බුබුල බිදිලා තියෙන්නේ. දැන් වැටිලා තියේනනේ වැටෙන්න ඕන තැනට. එතනින් පහලටත් වැටෙනවා ඒනිසා අපේ ආදායම සැහෙන්න පල්ලේහාට ඉදිරියේදි යාමට නියමිතයි. අපෙ මොකක්වත් තිබෙන විශේෂිත වරදක් නිසා නෙමෙයි. සමහර වැරදි තිබෙනවා ආදායම් එකතු කර ගැනිමේ දුර්වලතා තිබෙනවා. හැබැයි පොදුවේ රට මුහුණ දෙමින් තිබෙන අර්බුදය ඇතුලේ අපි ඉන්නේ ඒ අර්බුදය අපිටත් එනවා එවැනි තත්වයක් සලකලා බලලාද

සැලකිල්ලට ලක්කරලාද මේ මිලියන පනහකට වැඩිය ඇස්තමේන්තු ඉදිරිපත් කලේ. ඒනිසා මම කියන්නේ ගරු නගරාධිපතිතුමනි මේක තමයි අපේ රටට හෙන ගැහුවේ මිනිස්සුන්ගේ අවශ්‍යතා වෙනුවට ඒ අවශ්‍යතා පාවිච්චිකරගෙන තමන්ගේ කමිෂන් එකයි තමන්ට ඕන කරන විදියේ තමන්ගේ වත්කම් වැඩිකර ගැනීමයි ඉලක්කකරගත්තු ව්‍යාපෘති මේ ව්‍යාපෘතියේ පදනම එකයි. මම දන්න විදියට නැත්නම් දැන් වෙන වෙනම අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගෙන් ඇහුවෝත් මේ යෝජනාව පිළිබඳව මම දන්නවා ඔහු දන්නේ නැහැ. මිනිස්සුන්ගෙ ඉල්ලීම මත දැම්මා. ඒනිසා කමක් නැහැ දැම්මා නම් ඒ ඔබේ අයිතිය විපක්ෂය විදියට මගේ අයිතිය මම පාවිච්චි කරන්නේ මම විරුද්ධයි මිනිස්සුන්ගේ පාර හදනවාට නෙමෙයි මේ පාරවල් හදන එක එයගොල්ලෝ ගල් අල්ලපු මාර්ග තොගගනන් ඔයගෝල්ලන්ගේ හෙට දවසේ අරගෙන ගිහිල්ලා පෙන්නනවා ඒ හදපු මාර්ගලවට වෙලා තියෙන වින්හැයිය අපි යමු එකින් එක. ඒ ගිහිල්ලා බලමු එගෝල්ලො අල්ලපු අඩි දෙකේ තුනේ හතරේ මාර්ගවල ඇතිවෙලා තිබෙන තත්වය. ඒනිසා කිසිදු මහජනයාට ඵලදායිතාවයකින තොරව මේ ව්‍යාපෘති කලා වගේම කරන්න බලාපොරොත්තුත් වෙනවා. ඒ පදනමින් මේ වේලාවේ කර්මාන්ත කමිටුවට අපි විරුද්ධ වෙනවා. කර්මාන්ත කමිටුවට විරුද්ධ වෙන්නේ කලයුතු දෙයක් නෙමෙයි මේ වේලාවේ ඇස්තමේන්තු තොගයක් අපි මේ අවුරුද්දේ අන්තිම අපේ කාලය ඉවරයි.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,අද ඒවා නෙමෙයි මේ. මේ රේට්ස් වැඩිවුන නිසා මේ හතරවෙනි පාරට මිලගණන් කැදව්වේ. හතරවෙනි පාරට මිල හැදුවා. එන රේට්ස් වැඩි වෙලා රජයෙන් එවලා රේට්ස්වලට හැදුවා. පස්වෙනි පාරට වෙනස් කරන්න වුනත් කරනවා. සල්ලි ගෙවන්නේ එවට තමයි

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පස්වෙනි පාරට වෙනස් කරන්න බැරිවෙයි ජනතාව ඔබව වෙනස් කරනවා එසේ කරයි කියලා විශ්වාසයෙන් කර්මාන්ත කමිටුවට විරුද්ධ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා සදහන් කරා මේ ඇස්තමේන්තු වගයක් එතුමා පොදුවේ සදහන් කරා ජනතාවගේ ඉල්ලීම්වලට පටහැනිව කෙරේනවා වගේ අදහසක්. එතුමාගෙන් කියවුනා ඒනිසා මම අනෙක් කාරණා සම්බන්ධයෙන් මම කථාකරන්න යන්නෙ නැහැ එතුමාගේ එ කියපු ඒවා අදාලද නැද්ද කියලා මම ඉදිරිපත් කරපු යෝජනාව මම ඉදිරිපත් කරපු ඒ පාර බොරුපන රාජසිංහ මාවත ඉදිරිපිට කෝන්ක්‍රිට් ගල් අතුරා සංවර්ධනය කිරිම බොරුපන කොට්ඨාශයේ මේවෙනකොට තියෙන අබලන්ම පාර. මම හිතන්නේ ජනතාවිමුක්ති පෙරමුනේ ප්‍රභාෂිණී මන්ත්‍රීතුමිය සාක්ෂි දරනවා ඇති එතුමියත් මේ පාරේ දිගට යනවා කාලාන්තරයක් තිස්සේ. දැන් වසර දෙකක් විතර තිස්සේ මේක හදාගන්න බැරිව හිටියා විවිධ ප්‍රශ්න නිසා. ඒනිසා මම ඉදිරිපත් කරලා තියෙන්නේ නගරාධිපතිතුමා මගේ පැත්ත මම මේ කියන්නේ එතුමා පොදුවේ ඉදිරිපත් කරපු නිසා මම ඉදිරිපත් කරලා තියෙන්නේ බොරුපන කොට්ඨාශයේ මේ මොහොතේ අත්‍යාවශ්‍යම අබලන්ම පාර. මේ විදියට කුට්ටිගල් අල්ලලා යම් කොටසක් හෝ හදලා දෙන්න කියන ඒ යෝජනාව අනුව තමයි මේ ඇස්තමේන්තුව හදලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණාවට එකගයි. මම කිව්වේ දැන් මේ වියදම දරද්දි මේ යෝජනාව න්‍යාය පත්‍රයට ආවා නම් න්‍යාය පත්‍රයේදි අන්න මන්ත්‍රීවරයාට ඔය කථාව කියන්න අවස්ථාව එනවා. අන්න අපි දන්නවා අපිට ජනතාවගේ මේ ඇත්ත ඒ පාර දිර්ඝ කාලයක් මිනිස්සු සැහෙන්න දුක්විදින මාර්ගයක්. හැදිය යුතුයි එකට විරුද්ධ නැහැ. අපි කියන්නේ මේ පමණ මේ මිලියන පනහකට වැඩිය මාර්ග මේ සභාව ඔබට වැඩි කාලයක් මේ සභාවේ හිටියා මේ සභාව වියදමක් දරණවානම් යෝජනාවක් න්‍යාය පත්‍රයට මේ යෝජනාව න්‍යාය පත්‍රයට නාපු එකේ වරද මේ කියන්නේ න්‍යාය පත්‍රයට ආවානම් හැදෙනවා සංවාදයක් ඒ සංවාදය ඇත්ලේ නිරවුල් වෙනවා දැන් නයාය පත්‍රයකට එන්නේ නැතිව මිලියන පනහක් ඇස්තමේන්තු කරනවා කර්මාන්ත කමිටුවකට දාලා අනුමත කරනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,පාරක් පවරගෙන සංවර්ධනය කිරිමේ යෝජනාවක් ආවෝත් මිසක් න්‍යාය පත්‍රයට සංවර්ධන යෝජනාවක් න්‍යාය පත්‍රයට කවදාවත් ඇවිල්ලා නැහැ. පවරාගෙන සංවර්ධනය කිරිමේ යෝජනා එන්න පුලුවන්.

**2022.09.08 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දූ නිරෝෂන මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2022.09.08** දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |

| | | | |
|---|---|---|---|
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.08 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සහා සම්මත විය.**

**06(7) 2022.09.08 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**2022.09.08 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.**

**06(8) 2022.09.08 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**
**2022.09.08 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,සාමාන්‍යයෙන් මේ ස්ථාවර කමිටු ටික ස්ථිර වශයෙන් තියෙන්න ඕන ස්ථාවර කමිටුද?

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔව්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ස්ථාවර කමිටු අපේ තිබ්බේ 6 ද 7 ද නේ. දැන්නේ වැඩි වෙලා තියෙන්නේ මම අහන්නේ මේක වැඩි වුනේ මන්ත්‍රී සංඛ්‍යාව වැඩි විම නිසාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔව්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම බැලුවේ සමහර ස්ථාවර කමිටු තියෙනවා කොලයකට සීමා වෙලා තියෙන්නේ එක කරුණයි සාකච්ඡා වෙන්නේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,අනිවාර්යෙන්ම එක මන්ත්‍රීවරයෙක් එක කමිටුවක් නියෝජනය කරන්නේ නැතිව දෙවන කමිටුවට යන්න බැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම කියන්නේ  මොකක්හරි ක්‍රමවේදයක් හදන්න වියදම් අඩුකරන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,බැහැ පනත සංශෝදනය කරන්න ඕනනේ. මම හිතන්නේ ලබන පාර වෙනකොට සංඛ්‍යාව අඩු කරලා මැතිවරණයට එයි. අපිත් මේ මැතිවරණය එනකම් ඉන්නේ. ලැයිස්තු සංඛ්‍යාවත් අඩුවෙනවා එතකොට.

**06(9) 2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී  -  සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ අංක 11 මට දැනගන්න ඕනේ මෙතනදි තියෙනවා සොයිසා ක්‍රිඩාංගනය සහ ගෘහස්ථ ක්‍රිඩාගාරය වෙන්කිරිමේදි අයකරනු ලබන ගාස්තු සම්බන්ධව සභා තිරණය මිශ ආදායම් අංශය සතුව නොමැත එඅනුව සභා තිරණය නොමැති දැනට අය කරන ලබන ගාස්තු නැවත මුදල් කමිටුවට නිර්දේශ සහ සභා අනුමැතිය ලබා ගැනිම සදහා මුදල් කමිටුව වෙත යොමු කිරිමට ඉදිරිපත් කරමි. එතන මම ගැටලුවක් දකිනවා. මෙතන ක්‍රිඩා කමිටුවේද තිරණයක් ගන්නවා සංශෝධන කරන්න හරි මොනවාහරි අලුත් මිල ගණන්. නමුත් මිශ්‍ර ආදායම් අංශයේ එක දැනුවත් නැහැ. එතනදි මම දකිනවා කමියුනිකේෂන් ගැප් එකක්. එකෙන් අපිට අවාසියක් සිද්ධවෙලා ඇති කියලා මම හිතනවා. ඒනිසා මේවගේ දේවල් නැවත මේ වාර්තාවට එන්න බැහැ. අපේ කමියුනිකේෂන් ගැප් එක නිසා මොකද මේවගේ දෙවල්වලට සභාවක් හැටියට සභිකයින් හැටියට ඡන්දයක් දිලා වගකියනවා. ඒනිසා මේතන වෙන අඩුපාඩු මේක මෙතනට එන්න බැහැ. නිලධාරින් මට්ටමෙන් විසදගන්න ඕනේ. මොකද මිශ්‍ර ආදායම් අංශයේ ඒ වාර්තාව නැහැ කියලා ඊට පස්සේ තව මාසයක් ගන්නවා මුදල් කමිටුවට මේක ඉදිරිපත් කරන්න. එතනදි අපිට තව මාසේක කාලයක් පාඩුවක් සිද්ධවෙනවා. ඒනිසා මම යෝජනා කරනවා මේවගේ දේවල් අපේ අඩුපාඩුටික මේතනදි හදාගන්න ඕනේ කියලා. ඒවගේම මම යනවා විගණන වාර්තාවට එකට මොනවාහරි පිළිතුරක් ලැබෙයිද පිටු අංක 11

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, පහුගිය කාලයන්වලදි ක්‍රිඩාංගනවල සමහර එනවා දින තුනේ ක්‍රිඩාතරග පැවැත්විමේදි ලොකු ප්‍රමාණයක් ඇවිල්ලා පාවිච්චිකරන ඒසි ප්‍රමාණය වැඩි නිසා අපිට කරන්ට් බිල ලොකු ප්‍රමාණයක් යනවා. ඒ යන එකත් එක්ක තමයි අපි මේ බිල වැඩි කලා විදුලි බිලත් එක්ක සාපෙක්ෂව. එතකොට ඒ වැඩිවිම මම හිතන්නේ සභා තිරණය එන්න වෙන්නේ අපි මේ අතින්නේ මේ ගන්න වෙන්නේ කොමසාරිස්තුමා මම කියන එක හරිනේද?

**<u>මහා නගර සභා මන්ත්‍රී  -  සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, වැඩිකල මිල ප්‍රමාණය සම්බන්ධයෙන් නෙමෙයි මම අදහස් කරන්නේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය අහලා තියෙන්නේ වැඩිකරපු එක සභා තින්දුව ඇවිල්ලා නැහැ මිශ්‍ර ආදායම් එකට. ඒක තමයි මෙතන ලියලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී  -  සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,මෙතන ලේකනයක් නැහැ කියන මතයේ තමයි එගෝල්ලෝ ඉන්නේ

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය,මින් ඉදිරියට එවැනි කටයුත්තක් නොවන්න කටයුතු කරන්නම් මේ සම්බන්ධයෙන් අපහසුවට පත්වෙලා ඇති.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,විගණන වාර්තාව සම්බන්ධයෙන් මම හිතන්නේ කරුණු ටිකක් දැන ගන්න කැමතියි. මොකද සම්පූර්ණයෙන් කථාකරන්න කාලවේලාව මදි ඒ විගණන වාර්තාව කියවන්න.

<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,ගරු මන්ත්‍රීවරු දාසයක් අත්සන් කරලා විගණන වාර්තාව සම්බන්ධයෙන් විශේෂ මහා සභාවක් කැඳවන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. මේකේ කිසි ගැටලුවක් නැහැ. අපිට දෙන්න පුලුවන්. එතනදි කථා කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මුදල් කමිටුවේ අංක 09(4) අපි එකගතාවය පලකරනවා. එවගේම අංක 25 අපි එකගතාවය පලකරනවා. විශේෂයෙන්ම අපි ඉල්ලීම කරපු පරිදි 26, 27 විගණන වාර්තාව වෙනුවෙන් වැදගත් සාකච්ඡාවක් විදියට මහා සභා රැස්වීමක් ඉල්ලා තියෙනවා. එක අපිට ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටු වාර්තාවේ 26 වෙනි පිටුවේ 28වෙනි කාරණය සංගිත ප්‍රසංග පැවැත්වීම සඳහා වීරපුරන්අප්පු දෙමහල් රංගපීඨය ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වී ඇත. ගරු නගරාධිපතිතුමනි ඒගැන මම සතුට ප්‍රකාශ කරනවා. එළිමහන් රංග පීඨයේ නැවත ප්‍රසංග සඳහා ලබා දෙන එක ගැන. ඒවගේම මට පොඩි ගැටලුවකුත් තියෙනවා මෙම එළිමහන් රංග පීඨය ප්‍රේක්ෂකයන් සඳහා බාධාවකින් තොරව පාවිච්චිකල හැකි මට්ටමක් තියෙනවාද? මට තියෙනවා ගැටලුවක් මම හිතන්නේ සුරේශ් ඉන්දික මන්ත්‍රීතුමා පහුගිය කාලේ ඉන්වෙන්ට්‍රි එකකට සම්බන්ධවුනා එළිමහන් රංගපීඨයේදි. එතන තියෙනවා ප්‍රේක්ෂකයෝ ඉන්න ස්ථානවල ගස් හිටවලා සමහර වෙලාවට මේ හරිත සංකල්පයක් කියාගෙන වෙන්න ඇති එක වෙන්නේ. නමුත් ප්‍රේක්ෂකයන්ට විශාල බාධාවක් වෙනවා එක ඉවත් කරන්න. ඉවත් කරලා ප්‍රේක්ෂකයන්ට මෙය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා නරඹන්නන්ට නරඹන්න හැකිවෙන පරිදි සිටුවීමක් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවට සම්පූර්ණයෙන්ම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මුදල්කමිටුවේ 13 අවධානය යොමු කරනවා. වීර පුරන් අප්පු උද්‍යානයේ රථගාලේ වෙසක් උස්සවය වෙනුවෙන් වෙසක් සැරසිලි විකිනිම සඳහා වෙන්කර දිම. අපි දැන් විවිධ අවස්ථාවල මේ ස්ථානය විවිධ වෙලදාම් කටයුතු සඳහා සහ විවිධ රැස්වීමකුත් පවත්වනවා. දැන් අපි ටිකක් යම් ගැටලුවකට මුහුණ දිලා ඉන්නවා කියලා මට හිතෙනවා මේ රථ ගාල කියන ලියා පදිංචිනාමය රථගාලකියන කතන්දරයෙන් දැන් යම් බාධාවක් තියෙනවා මොකද රථ ගාල ලෙස මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවෙනුවට සම්මත වෙච්ච යෝජනාවක් තිබෙනවා අපේ අතන සුපර්මාකට් එකේ ඒ ගොඩනැගිල්ල නවීකරන කටයුතු සිදුවීමේදි ඒ වෙළඳුන්ට මේ ස්ථානය ලබාදිම සඳහා සම්මත කරපු මේ සභාවේ යෝජනාවක් තිබෙනවා. නමුත් එයද මම දන්නේ නැහැ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙයි කියලා හිතන්න අමාරුයි. ඒනිසා මට හිතෙනවා ගරු නගරාධිපතිතුමනි මේ ස්ථානය අතිශය වැදගත් ස්ථානයක් සේ සලකලා දැන් මොරටුවේ ඇත්තටම පොදු රැස්වීමක් නැත්නම් සම්මන්ත්‍රණයක් මොකක්හරි එවැනි කටයුත්තක් කරගන්න පොදු ස්ථානයක් නැහැ. බෞද්ධ මන්දිරය ඇරුණු කොට ස්ථානයක් නැහැ. ඒනිසා

මම හිතන්නේ අපි මේ තියෙන ගැටලුවලින් නිදහස් වෙනවා මේ සභාවේ සම්මත කරලා ඔබතුමාගේ යෝජනාවක් ලෙස හරි මේකේ මේ රථගාල කියන එක අයින් කරලා වෙන පොදු කටයුත්තකට මොනවාහරි ඒ අදාල නමක් දාලා එහෙම පාවිච්චි කරමු මගේ අදහස.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි එක කලේ රථගාල දැන් මේ මාසේ අවසානයට පෙර විවෘත කිරීම කරනවා. ඉන්පසුව මුකුත් කරන්න බැහැ. තියෙන්නේ රථ ගාල විතරයි. ඒක එකට කරන්න ඕනේ.මොකද එක මේ මොරටුවේ තියෙන්නාවූ නගරාසන්නයේ අතිශයින්ම වැදගත්වෙන්නාවූ වැඩ කොටසක් එකේ තියෙන්නේ රථගාලට අනිවාර්යෙන්ම ඉඩ තියෙන්න ඕනේ. එක අනිවාර්යෙන්ම කරන්න ඕනේ. මේ මාසේ අවසානයට පෙර එකේ විවෘත කිරීමේ කටයුත්තත් කරලා එක එතනින් පස්සේ ඔය කියන මොකක්වත් වෙන්නේ නැහැ .රථ ගාලක් තමයි තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,එතකොට දැන් මේ කොමසාරිස්තුමා සමහර විගණනයට උත්තර බදිනකොට කියනවා අපි මෙහෙම යෝජනාවක් සම්මත කරලා තියෙනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,අපි විගණනයට උත්තර බදිනවා මධ්‍යම වෙලදපොල තාවකාලිකව ගෙන වැඩ සටහන කියලානේ ඔය ඔබතුමා කිව්වේ. ඩොන්ගාලා කඩාගෙන වැටිලා කියලා ඒ ව්‍යාපෘතිවලට ගිය මුදලත් එක්කම එවා අයින් කරාම කඩාගෙන වැටෙනවා තමයි. ඉතින් ඉලක්කමෙන් කඩාගෙන වැටෙනවා. සභාවේ ආදායමෙන් කඩාගෙන වැටිලා නැහැ. ව්‍යාපෘතිවලින් කඩාගෙන වැටිමක් වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේ ස්ථානයේ දැනට කියන්නකෝ විදුලිය කොහොමද මේකේ පාවිච්චිවෙන්නේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,විදුලිය සෝලා පවර් එකෙන් දැනට අපි බැලන්ස් වේචි යනවා. දැනට තියෙන්නේ ඉතුරුව කියන එක පොඩ්ඩක් අඩුවෙලා තියෙනවා. හේතුව එකක ගණන වැඩිවෙලා තියෙන නිසා. අපිට ගෙවන එකක ගණන සමස්ථයක් විදියට මිල වැඩිවිමක් නොවුනු නිසා ඉතුරුව දැන් අඩුවෙලා තියෙනවා. සාමාන්‍ය මට්ටමෙන් දෙක බැලන්ස් වෙලා යනවා. පෙර නම් ඉතිරිය තිබුණා දෙදහා තුන්දාහා ඉතිරිය තිබුණා. සාමාන්‍ය ඒ මිලයි අපේ එකකවලට ගෙවන මිලයි අතර තිබුණා වූ සාමාන්‍යයක් නිසා දැන් එක පොඩ්ඩක් පසු බැහැලා තියෙන නිසා මේවෙනකොට අපිට ලැබිමක් නෙමෙයි තියෙන්නේ යම් පොඩි වැඩිවිමක් මිසක් අඩුවිමක් නැහැ. අපිට අඩුවිමක් වෙලා නැහැ සෝලා එකත්......

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,25වෙනි අයිතමයට අනුව ආදාහනාගාර ගාස්තු වැඩි කිරිම සහ අඩු කිරිම දැන් මට පොඩ්ඩක් දැනගන්න පුලුවන්ද දැන් මේ ගාස්තු වැඩි කිරිම පිළිබඳව මුදල් ස්ථාවර කමිටුවකට වැඩිකරන ලද ගාස්තු ඇවිල්ලා සභාවේ සම්මත වුනාම මට මතක විදියට ඒ සාකච්ඡාවක් වුනා නිශ්චිත ගණන් ඉදිරිපත් නොකොට වැඩි කිරිම සුදුසුයි කියලා. හැබැයි දැන් මේ තියෙන්නේ ඒ ගාන නිශ්චිතයි වැඩිකරලා තියෙනවා ගාන නිශ්චිතයි 7000යි. එක නැවත අඩු කරන්න කියනවා පරණ ගානට. එක නිශ්චිතයි හැබැයි මගේ ප්‍රශ්නය තියෙන්නේ මගේ අවබෝධය පිළිබඳ ප්‍රශ්නයක්ද කියලා මාව දැනුවත් කරන්න. මම හිටපු ආයතන කමිටුවක කථාවුනේ ගාන වැඩිකලයුතුයි මේ ගැස්වල වැඩිවිමත් එක්ක. ඒ සාකච්ඡාව සංවාදය ගියා වැඩි කිරිම සුදුසුයි. ඒ වැඩිකිරිම සුසුසුයි කියන සාකච්ඡාවේ කමිටුව තින්දුකලේ නැහැ වැඩිකරන ගාන ඒනිසා මොන මුදල් කමිටුවද ඒ වැඩිකරපු ගණන් ඉදිරිපත් කරපු මුදල් කමිටුව.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමත් ඉදගෙන තියෙනවා ඒ මුදල් කමිටුවේ වැඩිකරපු ගණන් එක්කම දිපු ඒකත්

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මට ඕනේ වැඩි කිරිමේ මිල තින්දු කරන්නේ මේ නිළධාරින්ගෙන්. නිළධාරින් තමයි ලේඛනයක් හදලා මේ මේ ගණන් වැඩි කරන්න ඕනේ මේ හේතුනිසා කියලා කියන්න. ඒක තමයි මන්ත්‍රිවරු විදියට කමිටුවේ සාමාජිකයෝ විදියට නිර්දේශ කරනවාද නැද්ද කියලා තින්දුකරන්නේ. දැන් මගේ අවබෝධය තියෙන්නේ ඒක ඒ ආකාරයට ඉදිරිපත් වුනේ නැහැ. ඉදිරිපත් වුනා කියනවානම් මමත් අදාල කමිටුව හොයලා බලලා ඊළග සභාවේදි ඒ පිළිබඳව කථාකරමු.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මුදල් කමිටුවට ආවා 7වෙනි මාසේ 6වෙනි මාසේ කමිටුවේ සාකච්ඡාවෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,06/09 2021/07/21 දින මහා සභා තිරණය අනුව මහා සභා තිරණය එනවා 07/21 6වෙනි මාසේ තමයි කමිටු

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම කියන්නම් තියෙන විදිය ආදාහනාගාර ගාස්තු පවතින මිල මොරටුව තුල 3000යි ආදාහනාගාර ගෑස් මිල ප්‍රතිශතයක් ලෙස වැඩි විම නිසා යෝජිත මිල දාහදාහයි. ගෑස්මිල ප්‍රතිශතයක් ලෙස කියලා සියයට 54ක් මොරටුවෙන් පිටත 6000යි. ඒක 15000 දක්වා මේ කියන එක තමයි 10000 කියන එක තමයි 7500ට ආවේ 15000 කියන එක තමයි ආයි නැවතට ගියේ 10000 කියන එක. වයස අනුව නොමිලේ කරන එකටත්10000කියන එක තමයි සාකච්ඡාකරලා එය අඩු ගණන් වලට ගෙනාවේ. ඉලක්කමක් තියෙනවා ඒ ඉලක්කම නැවත ගෙනල්ලා තියෙනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම හිතන්නෙ ඕක සභා සම්මත වුනේ නැහැ. ඔබතුමා ඉන්න සභාවෙදි තමයි සම්මතවුනේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔව් මගේ සභාවෙදි තමයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඒ අවබෝධය පොඩ්ඩක් නිවැරදිකරගන්න ඕනේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මම ඒක නිවැරදි කරා. නිවැරදි කරලා 8වෙනි මාසෙන් එක අයින් කරා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඊළගට මෙන්න මේ 30ට අදාලව ගරු නගරාධිපතිතුමනි මේක සම්බන්ධකරගෙන කිවයුතු කාරණාවක් තිබෙනවා. මේ අපි සැහෙන අපේ දේපල බදු දිලා තියෙනවා. බදු ගිවිසුම් නැතිව දිගින් දිගටම කොච්චර ඉල්ලිම් කලත් බදු ගිවිසුම් නැතිව අපේ දේපල යනවා විගණකාධිපතිමත් කියන කතන්දරයකුත් තියෙනවා. එක නෙවෙයි මම මේ කියන්නේ. මම දැනුවත්ව සමහර අපේ දේපලවලට ඒ ලබා දිමේදි දරපු උස්සාහයේදිත් දිගින් දිගටම කිව්වා. හැබැයි අද මේවෙනකුනුත් ඒ බදු ගිවිසුම් අත්සන්කරලා ඔවුන් එක්ක ඒ බදු ගිවිසුම්වලට යන්නේ නැහැ. ගෙන්නගන්නවා මම දන්න එකක් තියෙනවා ගෙන්න ගෙන අත්සනුත් කරනවා. ඒනිසා මම කියන්නේ මේකට වැඩි සැලකිල්ලක් ලක් කරන්න. මොකද අපි දිගටම අපේ දේපල බදු දිම කියන කාරණාවේදි සැහෙන ගැටලු ප්‍රමාණයකට මුහුණදිලා තියෙනවා මේ බදු ගිවිසුම්වලින්. ඊළගට 31 එකේ මතු කරන්න ඕනේ 2023 වර්ෂයේ සදහා බදු හා බලපත්‍රගාස්තු පැනවිම. දැන් ඒකේ මට මතු කරන්න ඕනා ගරු නගරාධිපතිතුමනි මෙහෙම

කාරණාවක්. ඒ කියන්නේ දැන් බදු බලපත්‍ර ගාස්තු ගෙවන්න ජනතාව මේ ආයතනයට එනවා. දැන් මේ ආයතනයට එනවා ඊට අමතරව අපේ ආර් අයි මහත්තරු ගිහිල්ලා ඒ ගෙවීම් අයකර ගන්නවා. දැන් මෙතනදි මේවෙන ගැටලුව තමයි එකම ආකාරයේ දේපලවලට මේ ගිනි නිවීමේදි අයකරන මුදල වෙනස්කම් සහිතව අය වෙනවා. මේක ටිකක් එගොල්ලෝ ප්‍රශ්න කරපුවාම උත්තරයක් දිගන්න බැරි විදියේ එකක් දැන් ගිය සැරේ 700 අය කරපු බදු ගාස්තු මේ සැරේ 1200 අය කරන කොට එක ඔවුන් ප්‍රශ්න කරන කොට මෙතනට ඇවිල්ලා ඒ අදාල නිලධාරින් එක්ක සාකච්ඡාකරපුවාම එක නිරවුල් කරගන්න පුලුවන් ඒ අවබෝධය අපිට ලැබුණාම අපි ඔයගොල්ලන්ට කියනවා වැඩිවීම මෙන්න මේ නිසා ඔවුන් එක පිළිගන්නවා. හැබැයි එකම කඩ දෙකක තුන් සියයක් අයකරලා එකකින් ගිනිනිවීමේ එකකයට අනෙක් එකට සියයක් අය කරපුවාම ප්‍රශ්න කරපුවාම කොහොමද අපි උත්තර දෙන්නේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,එකට උත්තරයක් මට ඔබතුමාට දෙන්න පුලුවන්. ඒකේ වෙලා තියෙන්නේ එහි තියෙන්නාවූ ව්‍යාපාර ස්භාවයත් එක්ක.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ස්භාවය ඇඳුම් මහන එකනම් දෙකම ඇඳුම් මහන එකනම් මොකක්ද ස්භාවය.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,එතකොට ප්‍රශ්නයක් නැත්නම් ස්භාවය අනුව වෙනස් වෙන්න පුලුවන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,දිගටම මේ ප්‍රශ්නය තියෙනවා. මම කියන්නේ මේකට විසඳුමක් ඒ කියන්නේ මේක ගිනිනිවීමේ එකකය විසින් අයකරනු ලබන මුදල ඇයි අපිට අර ෆෝම් එකටම ඇතුලත් කරන්න බැරි ඒ කියන්නේ වෙන තැනකින් මේ බිල් එක කඩනවා වෙනුවට

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,එක වෙලා තියෙන්නේ වාර්ෂික තක්සේරුව මත ටේලර් ෂොප් එකක් තියෙන්න පුලුවන් වර්ග අඩි 50ක තියෙන්නත් පුලුවන් වර්ග අඩි 250ක 300ක තියෙන්නත් පුලුවන්. එතකොට වාර්ෂික තක්සේරුව ටේලර් ෂොප් එක ටේලර් ෂෝප් එකම තමයි ඔහොම ගත්තොත් වර්ග අඩි 25ක රත්තරන් බඩු කඩයක් තිබ්බාම ගාන ගොඩක් වැඩියි තියෙන්නේ රත්තරන් බඩු නිසා අන්න ඒවගේ ප්‍රශ්න තියෙන එවා තියෙනවා. ඒනිසා මම හරියටම දන්නෙ නැහැ එතුමා මොකක්ද කියන්නේ කියලා. එකම ප්‍රමාණයනම් එකම වර්ගඵලය නම් ඕය කියන එක නිවැරදි කරගන්න ඕනේ. එකක් අපි එක නිවැරදිකරන්න කොමසාරිස්තුමා බැදිලා ඉන්නවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම මේ කියන්නේ වියුක්තව ආපු එකක් දෙකක් ගැන නෙමෙයි පොදුවේ මේක යන ආකාරයේ තිබෙන වරද මේ කියන්නේ මේක අයකිරීම් කරලා තියෙන්නේ අදාල දේපලවල ස්භාවයන් ගත්තත් සමහර දේපලවල ස්භාවයන්ගේ වෙනස්කම් අනුව ඔවුන්ට අඩුවෙනවා. සමහර ඒවාට වැඩිවෙනවා. එහෙම වෙන්න බැහැ. ඒනිසා මම කියන්නේ ඕක නිරවුල් කරගන්න තිබෙන්නේ අපේ ආර් අයි මහත්තරු හරහා. ගිනිනිවීමේ එකකයෙත් උදව් ඇතිව අර ෆෝම් එකටම නිශ්චිත ලෙස ඇතුලත් කරන්න පුලුවන්නම් ගිනිනිවීමේ නිවාරණ අරමුදල මොකක්ද මේ බද්ද මේක කියලා එතකොට මේක අපිට බේරගන්න පුලුවන් මම හිතන්නේ මේක පොඩ්ඩක් සැලකිලිමත්වෙලා කොහොමද මේක නිවැරදි කරගන්නේ. මේකේ වරදක් තියෙනවා වරද නිවැරදි කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව සංවාදයකට ගන්න මුදල් කමිටුවට අපි විරුද්ධවෙනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,අංක 29 කරුණට අදාලව අපි මීට පෙර මේ ජෙසිබි යන්ත්‍රය කුලියට දිම සිදුකරනවා. මේ සභාවෙන් නැවත එක නවත්තලා ඉවරවෙලා නැවත එක දෙන්න ලැස්තිවෙලා තියෙනවා. මම හිතන්නේ මේක සමහර අයට අයථා ලෙස මුදල් හම්බකරන්න මේක අවස්ථාවක් වෙන්න පුලුවන්. ඒනිසා මම හිතන්නේ ජෙසිබි යන්ත්‍රයක් අපි ලබා ගෙන අපි සභා සේවකයන් යොදවගෙන විශාල පරිශ්‍රමයක් දරන්න වෙනවා පොදු වැඩකටයුත්තක් කරන්න ගියත් ඉතින් මෙහෙම කුලියට දුන්නාම මම හිතන්නෙ කිසිම ප්‍රතිලාභයක් එනනෙ නැහැ. පැය කිහිපයකටද මේක දෙන්නේ පැය තුනකටද ඒ කියන්නේ පැයකට දෙකකට දෙනවාද එක හොදයි මම කියන්නේ මේක කුලියට දුන්නාම වැඩිවෙන පැය ගාන කවුද පරික්ෂා කරන්නේ. ඊට පස්සේ මේක පිළිබදව ඇත්තටම සමහරුන්ට මුදල් උපයාගන්න අවස්ථාවක් වෙන්න පුලුවන්.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ප්‍රශ්නය වෙලා තියෙන්නේ නියෝජ්‍ය නගරාධිපතිතුමා අපි කුලියට දෙන්නේ නැති නිසා නිකම් අපෙන් ගෙනියනවා. අපි කුලියට දෙන්නේ නැති නිසා අපෙන් නිකම් ගෙනියනවා තෙල් ටිකයි ඔක්කොම නිකම්ම ගෙනියනවා. ඒනිසා දැන් හදන්නේ වාහන දෙකක් වාහන හතරක් තියෙනවා අපිට දෙකක් මොනවිදියටවත් එක කැඩුනොත් මේක කුලියට යවන්නෙත් නැහැ. නගර සභාවේ දෙකම කැඩිලානම් කුලියට දෙන එක නවත්තලා නගරසභාවේ ජොබ් කරනවා. හැබැයි එතනට දෙන එක කැඩුනොත් නගරසභාවට යොමු කරන්නේ නැහැ. නැත්නම් වෙන්නේ සමහර වෙලාවට අපි කියමු උදාහරණයක් ලෙස ඉස්කෝලයකට කියලා ඉස්කොලේ ජෙසිබි එකක් ඕනේ ජෙසිබි එකක් හොයාගන්න තැනක් නැහැ හැබැයි දැන් පුරුදුවෙලා තියෙනවා මෙතනට ඇවිල්ලා ජෙසිබි එකත් ගන්නවා නොමිලේ තෙල් ටිකත් ගන්නවා නොමිලේ අන්න එකකොට එගොල්ලන්ට අපිට පුලුවන් ගන්න මේ සහනයට ඔයගෝල්ලෝ ගන්න අරගෙන වැඩෙ කරගන්න අරම වුනාම වෙන්නේ මුකුත්ම නැතිව යනවා සභාවට ලොකු පාඩුවක් වෙනවා එනිසා මේක කලේ.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,හොදයි මේ ආකාරයෙන් කෙරෙනවානම්. මම හිතන්නේ බොහෝ දුරට මේකෙන් අයථා ලෙස වෙන දෙවල් සිද්ධවෙන්න පුලුවන් කියන එක මම විශ්වාස කරනවා. එක නවත්වගමු කොහොම හරි එනිසා එකට විශේෂ අධික්ෂණයකුත් කරන්න ඕනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මට ඔබතුමාගෙන් කරුණක් විමසන්න තියෙන්නේ. රථගාල තියෙනවානේ රථගාලේ මීට කලින් ඉදලා අර උස්සව කාලේ කථාකරන මම ඉදලා සභාවට ගෙවලා ඒ උස්සව කාලවල පිරිසක් වෙළදම් කරානේ වෙළදකුටි අරගෙන. එතකොට දැන් මේ මේතන එක නැතිවුනාට පස්සේ දැන් ඔක්තෝබර් මාසෙන් පස්සේ මෙම රථ ගාල ස්ථාපිතවුනාට පස්සේ ඒ උස්සව කටයුත්ත වෙනුවෙන් මොකක් හරි විකල්පයක් තියෙනවාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ආයේ එනවා පෙමන්ට් එකට උත්සවකාලේට. ඕනම සභාවක් පදික මාරුව උපයෝගිකරගන්නවා එක්කො උඩට එනවා එක්කො පෙමන්ට එකට එනවා ප්‍රශනේ විසදගන්නවා

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,පොඩි පැහැදිලි කිරිමක් 31සම්බන්ධයෙන් මේකේ බලපත්‍රගාස්තු පැනවිමට මේක 2020 23 වර්ෂ සදහා තමයි මේක දාලා තියෙන්නේ. මේක තිරණය කලේ මොන පදනමක් යටතේද? කියලා පොඩි පැහැදිලි කිරිමක් ලබාගන්න පුලුවන්ද මෙතන දාලා තියෙන තක්සේරු වටිනාකම දැන් රටේ වියදමත් වැඩි වෙලා එතකොට මේවගේ මෙතන ගත්තොත් තේ කඩයක් පවත්වාගෙන යන පුද්ගලයෙක්ට ඒකියන්නේ සුපිරිවෙළද සංකිර්ණයක් තුල ෆාම්සියක් පවත්වාගෙන යන පුද්ගලයෙකුයි දෙන්නාම නිර්නය වෙන්නේ එකම කොන්දේසි මත පදනම්වෙලා. පොඩි පැහැදිලිකිරිමක් කරන්න බැරිද මේ සම්බන්ධයෙන්.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,පනතේ අපිට තියෙන්නේ තක්සේරුව මොනතරම් ඉහල ගියා අපි කියමු බිලියන 3යි කියලා. තක්සේරුව වාර්ෂික තක්සේරුව යන්න පුලුවන්වෙන්නේ රු 5000න් උඩ යන්න බැහැ නවත්තලා තියෙනවා අපි එතනින් එහාට උදාහරනයකට බිග්සිටි එකක් නැත්නම් කාගිල්ස් එකක් කිල්ස් එකක් ගියාම එකෙ අපි ගන්න ගියාම පුංචි කඩ තියෙනවා 25ක් 30ක් විතර ඒකේ ඇතුලේ එක ඇතුලට අපිගිහිල්ලා ෆාමසියට 5000යි ලිකර් එකට 5000යි එතකොට හාල් එකට 5000යි එළවලු එකට 5000යි කියලා එක ඇතුලෙන් අපි 55000ක් විතර ගන්නවා. සමස්ථයක් විදියට ගත්තාම අර අපේ වැඩිවෙන්න ඕනේ ගානේන් 5000යි නමුත් 5000එහාට අපිට ගන්න බැහැ. මධ්‍යම රජයෙන් පනත සංශෝධනය කරලා එන්න ඕනේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, කවුරුහරි පාර්ලිමේන්තුවේ කථාකරා.

<u>**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය,අපි කථාකරා ලබන අවුරුද්දේ එවනවා කිව්වා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජය ශ්‍රී ගුණසේකර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මුදල් කමිටුවේ සියලුම දෙවල්වලට එකගයි අංක 25ට නිහඩයි.

**2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් කිෂාන්ත කල්දේරා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඒ.රන්දූ නිරෝෂන මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |

**2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක25 නිහඩවත් අනෙකුත් සියලු කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටුවේ අංක 09(4) හා අංක 25 පක්ෂවත් අනෙකුත් සියලු කමිටු තිරණයන්ට විරුද්ධවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

**2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.09.09 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

## 07. ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව -

**ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2022.09.09 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2022 අගෝස්තු මාසයට අදාල මූල්‍ය වාර්තාව ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08 පුද්ගලික ස්භාවයේ කරුණු

**08 (01)මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය 12වෙනිදා සිද්ධවෙච්ච සිද්දියක් සම්බන්ධව එහිදි පුවත්පත් නිවේදනයක් නිකුත්කරලා තිබ්බා. ජනමාධ්‍යය හරහා විකාශනය වුනා එහිදි සදහන්වුනා නගරාධිපතිවරයාගේ නිවසට ඉකුත් මැයි මාසේ 9වෙනිදා සිදුවෙච්ච පහරදිම සම්බන්ධයෙන් සිද්ධියකට මාගේ සහෝදරයාව

අත්අඩංගුවට ගැනිමක්. එහිදි මම විශේෂයෙන්ම මාගේ පක්ෂයට සහ මට මගේ නම භාවිතා කරමින් මාධ්‍යවල ප්‍රකාශයක් ගියා. කිසිදු සාක්ෂියක් නොමැතිව පදනම් විරහිත ප්‍රකාශයක්. විශේෂයෙන් වැරදි ප්‍රකාශයක් කිසිදු සාක්ෂියක් නොමැතිව ඉදිරිපත්කරලා අපිව ඉතා අපහසුතාවට පත්කරා.

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඇයි ඔබතුමිය ඔහොම කියන්නේ ඔබතුමියගේ නම සඳහන් වුනාද?

**<u>මහා නගර සභා මන්ත්‍රී-එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, සමගි ජන බලවේගයේ මන්ත්‍රිවරියක් කිව්වාම

**<u>ගරු නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, එක එගොල්ලන්ට කියන්න අපිට කියලා වැඩක් නැහැ. පත්තරයට කියන්න.

## 09. <u>වෙනත් කරුණු</u> - නැත

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය

අ.කලේ ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති
මොරටුව මහා නගර සභාව
මොරටුව

2022.10.06 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.